සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

වාර්ෂික වාර්තාව

2019



සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
වාර්ෂික වාර්තාව 2019

© සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය



සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

වාර්ෂික වාර්තාව 2019

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

1 වන මහළ,

කම්කරු මහලේකම් කාර්යාලය,

කොළඹ 05

දුරකථන: 011 2581704

ෆැක්ස්: 011 2806832

විද්‍යුත් තැපෑල: finance@etfb.lk

වෙබ්: www.etfb.lk

පටුන

ආයතනික දළ විශ්ලේෂණය



- මෙම වාර්තාව පිළිබඳව 09
- අප කවුරුන්ද යන වග 10
- අපගේ වගකීම්හී ප්‍රස්තුතය 11
- ප්‍රධාන මූල්‍ය තත්වයන් 13
- අගය නිර්මාණය කිරීමේ මාදිලිය 14
- ආයතනික සමාලෝචනය 16
- කාර්ය සාධන සමාලෝචනය 19
- සාමාජික දෘෂ්ටි කෝණය 20
- නාහිගත සංක්‍රමණය 22
- සුවිශේෂී අවස්ථා 24
- ආර්ථික සමාලෝචනය 26

ආයතනික භාරකාරිත්වය



- අධ්‍යක්ෂක මණ්ඩලය හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය 32
- සභාපතිගේ සමාලෝචනය 34
- අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාලෝචනය සහ කළමනාකාරිත්ව සාකච්ඡාව 36
- පාලන වාර්තාව 42
- අනු කමිටු 45
- අවදානම් කළමනාකරණ වාර්තාව 47

මූල්‍ය තොරතුරු



• ලාභ හෝ අලාභ ගිණුම සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය	53
• මූල්‍ය තත්වය ප්‍රකාශය	55
• ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය	56
• මුදල් ප්‍රවාහ ප්‍රකාශය	58
• ස්කන්ධ ආයෝජන ප්‍රකාශනය	61
• වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	63

අතිරේක තොරතුරු



• විගණකාධිපතිවරයාගේ වාර්තාව සහ මණ්ඩලීය නිරීක්ෂණ	99
• සංඛ්‍යා ලේඛනමය ඇමුණුම්	335
• වෙනත් ඇමුණුම්	339





01

ආයතනික දළ විශ්ලේෂණය



මෙම වාර්තාව පිළිබඳව

වාර්තාවේ අන්තර්ගතය

මෙය සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ 39 වන වාර්ෂික වාර්තාව වන අතර මෙමගින් ආයතනය 2019 දී එහි ප්‍රතිලාභීන් සහ අනෙකුත් පාර්ශවකරුවන්ට වටිනාකමක් ලබා දී ඇති ආකාරය පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් සපයයි.

2019 වාර්ෂික වාර්තාවේ අන්තර්ගතය 2019 ජනවාරි 1 සිට 2019 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ ප්‍රධාන කාර්යාලය සහ ශාඛා ජාලය පුරා ක්‍රියාත්මක වන මෙහෙයුම් ආවරණය කරයි. නවතම වාර්තාව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන අතර ඒ සඳහා මෙම වාර්තාව පුරාම සංසන්දනාත්මක තොරතුරු ලබා දී ඇත. මෙම වාර්තාවේ අන්තර්ගතය සංවිධානයට මෙන්ම එහි ප්‍රධාන පාර්ශවකරුවන්ට ද වැදගත් වන කරුණු අවධාරණය කරමින් නිර්මාණය කර ඇත.

වාර්තාවේ අරමුණ

අපගේ අනර්ඝ පාර්ශවකරුවන් සමඟ කෙටිකාලීන, මධ්‍යම හා දිගු කාලීනව වටිනාකම් නිර්මාණය කිරීමේ අද්විතීය කාර්යභාරය බෙදාහදා ගැනීම මෙම වාර්තාව ඉදිරිපත් කිරීමේ අරමුණයි. එමෙන්ම එමගින් උපාය මාර්ග, පාලනය සහ අරමුදල් කළමනාකරණය පිළිබඳ සංක්ෂිප්ත සන්නිවේදනයක් ද ඉදිරිපත් කරන අතර එහි මූල්‍ය කාර්ය සාධනය සහ සංවිධානය විසින් නිර්මාණය කරන ලද සමාජමය මං සලකුණු අතර සම්බන්ධතාවයද පෙන්නුම් කරයි.

වාර්තාව ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත වලින් සමන්විත වන අතර සැසඳීම් සහ වැඩිදුර විශ්ලේෂණයන් සඳහා පහසුකම් සැපයීම සඳහා හැකි සෑම තැනකම ප්‍රමාණාත්මක දත්ත සැපයීම අපගේ අරමුණයි. මූල්‍ය ප්‍රකාශන සහ අදාළ සටහන් රජයේ විගණක විසින් විගණනය කරනු ලබන අතර සහතික කිරීමේ වාර්තාව ද මෙම වාර්තාව තුළ ඇත.

වාර්තාවේ අනුකූලතාව

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. රාජ්‍ය ව්‍යවසායයන් සඳහා ආයතනික පාලනය පිළිබඳ හොඳම චර්යා ආධාර ධර්ම සංග්‍රහය හා 1980 අංක 46 දරණ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනත සමඟ ආයතනය අනුකූල වන්නේ කෙසේද යන්න පිළිබඳව පාලන වාර්තාව සාකච්ඡා කරයි.

විමසීම් කළයුතු නිළධාරීවරයා

එන්.ඩබ්ලිව්. විමලවීර
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය)
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
දුර: 011-2806278
ෆැක්ස්: 011-2806832
විද්‍යුත් තැපෑල: finance@etfb.lk



අප කවුරුන්ද යන වග

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය 1980 අංක 46 දරණ පනත යටතේ පිහිටුවන ලද අතර 1981 මාර්තු 1 වන දින සිට මෙහෙයුම් ආරම්භ කරන ලදී. එය කම්කරු අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කරන ලද අතර දැනට ක්‍රියාත්මක වන්නේ මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය යටතේ ය. රජයේ විශ්‍රාම වැටුප් ක්‍රමයට හිමිකම් නොමැති සියලුම රාජ්‍ය අංශයේ සේවකයින් සහ සියලුම පෞද්ගලික අංශයේ සේවකයින් මෙම අරමුදලේ සාමාජිකයන් වන අතර ඔවුන්ගේ සේවා යෝජකයින් විසින් ඔවුන්ගේ සේවකයින්ගේ දළ ඉපැයීම්වලින් 3% ක් මාසිකව අරමුදලට ප්‍රේෂණය කළ යුතුය. එබැවින් සේවක අර්ථසාධක අරමුදල මෙන් නොව, මෙයට සේවකයා/ සාමාජිකයා වෙනුවෙන් දායකත්වය සපයන්නේ සේවායෝජකයා පමණක් වන අතර එබැවින් එය සාමාජිකයා දායක නොවන ප්‍රතිලාභයකි. ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් සපයන ස්වයං රැකියාවල නියුතු පුද්ගලයින්ගේ සහ සංක්‍රමණික සේවකයින්ගේ ස්වේච්ඡා සාමාජිකත්වය වැඩි කිරීම සඳහා විශේෂ අවධානය යොමු කෙරේ.

මණ්ඩලයේ අරමුණු

(1980 අංක 46 දරන සේනිහා අරමුදල් පනතේ 07 වගන්තිය අනුව)

(අ) මූල්‍ය සම්පාදනයට හා ආයෝජනයට සහභාගි වීමෙන් සේවක අයිතිය, සේවක සුභසාධනය, ආර්ථික ප්‍රජාතාන්ත්‍රිකය ප්‍රවර්ධනය කිරීම;

(ආ) ව්‍යවසායයන්හි සාමාන්‍ය කොටස් අත්කර ගැනීමෙන් කළමනාකරණයෙහි සේවක සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම;

(ඇ) සේවා නියුක්තයන්ට විශ්‍රාම ගැනීමේදී දායක නොවන ප්‍රතිලාභයක් ලබාගැනීම සඳහා විධි විධාන සැලැස්වීම: සහ

(ඈ) ඉහත (අ), (ආ) සහ (ඇ) යන ඡේදවල සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවැසි විය හැකි අන් සියලු ක්‍රියා හෝ දෑ ඉටු කිරීම.



අපගේ වගකීම්හී **ප්‍රස්තුතය**

දැක්ම

ආයතනික විශිෂ්ටත්වය තුළින් සමස්ත පාර්ශවකරුවන් සඳහා වූ ක්‍රියාශීලී හා ස්ථාවර ප්‍රමුඛ භාරයක් බවට පත්වීම.

මෙහෙවර

සාමාජිකයන් සඳහා වූ පුළුල් පරාසයක වූ මූල්‍ය ප්‍රතිලාභ හා විශිෂ්ඨ සේවාවක් සලසන සුහදශීලී හා විචක්ෂණශීලී භාරයක් වීම.

වටිනාකම්

- නිර්මාණශීලී, නව්‍යකරණයෙන් සහ කැපවීමෙන් යුතු කාර්ය මණ්ඩලය
- ජනතාවට සුහඳශීලි සේවා වටපිටාව
- සහයෝගීතාව සහිත ප්‍රතිපත්ති සහ ක්‍රියාවලීන්
- විශිෂ්ඨ ක්‍රමවේද සහ ක්‍රියා පිළිවෙත්
- ඉහළ මූල්‍ය ස්ථාවරත්වය සහ
- තෘප්තිමත් පාරිභෝගිකයින්


12.00
0.011
-14.00
-26.00
194.38
635.25 M
56.45
43.38
21.55.
6.57

ප්‍රධාන මූල්‍ය **තත්වයන්**

ශ්‍රීලංකා රු. 000'	2019	2018	වෙනස %
මෙහෙයුම්			
මුළු ආදායම	32,078,510	28,803,133	11.37
මෙහෙයුම් වියදම්	1,476,499	1,333,648	10.71
බදුවලට පෙර ලාභය	29,763,621	26,726,180	11.37
බදු වියදම්	4,242,123	3,394,806	24.9
බදුවලට පසු ලාභය	25,521,498	23,331,374	9.4
මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය			
මුදල් සහ මුදල් සමාන දෑ	548,572	738,070	(25.67)
FVTPL හි මූල්‍ය වත්කම්	2,699,451	2,886,959	(6.49)
FVTOCI හි මූල්‍ය වත්කම්	7,899,643	7,563,896	4.44
ක්‍රමක්ෂය පිරිවැයට ගෙන ආ මූල්‍ය වත්කම්	324,688,318	292,668,381	10.94
සාමාජික අරමුදල් සහ සංචිත	340,852,277	307,981,965	10.67
සාමාජික දෘෂ්ටි කෝණය			
සාමාජික අරමුදල	339,244,338	306,454,810	10.50
පොළී සහ ලාභාංශ	25,129,210	25,303,608	(0.7)
පොළී සහ ලාභාංශ (%)	8.00%	9.00%	(11.11)
සාමාජික ප්‍රතිලාභ	454,714	425,400	6.89
ආයෝජන ප්‍රතිලාභ	9.44%	9.34%	1.1
ස්කන්ධය මත ප්‍රතිලාභ	7.49%	7.58%	(1.2)
වත්කම් මත ප්‍රතිලාභ	7.43%	7.51%	(1.1)

අගයන් සබලකාරක (ආදාන)

අගය නිර්මාණය කිරීමේ මාදිලිය

ආයෝජනය කළ ප්‍රාග්ධනය (රු.)

- සාමාජික අරමුදල බී 339

සාමාජික ප්‍රාග්ධනය

- මුළු සේවයන් 83,392
- මුළු සාමාජිකයින් ගිණුම් මී15.3
- දේශීය හා සංක්‍රමණික සේවකයින් 41,919

සේවක ප්‍රාග්ධනය

- මුළු කාර්ය මණ්ඩලය 1040
- කාර්ය මණ්ඩලයෙන් 45% කට වඩා වැඩි ප්‍රමාණයකට මණ්ඩලය සමඟ අවුරුදු 20 කට වැඩි පලපුරුද්දක් ඇත.
- දක්ෂ, පුහුණු සහ සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලය

හවුල් ප්‍රාග්ධනය

- කම්කරු සහ වෘත්තීය සමිති කටයුතු පිළිබඳ අමාත්‍යාංශය
- මුදල් අමාත්‍යාංශය
- සේවක අර්ථසාධක අරමුදල (EPF)

සමාජ සහ ප්‍රජා ප්‍රාග්ධනය

- වැඩ කරන පුද්ගලයින්

අගය නිර්මාණය (ක්‍රියාවලීන්)

නිර්මාණය කළ අගය (ප්‍රතිදාන)

දැක්ම, මෙහෙවර සහ වටිනාකම්

ඉලක්ක හා අරමුණු

උපාය මාර්ග සහ කාර්යයන්

මූලික කාර්යයන්

- එකතු කිරීම
- අනුකූලතාව සහ බලාත්මක කිරීම
- සේවය කටයුතු
- සාමාජික සේවා ආයෝජන

ද්විතීය කාර්යයන්

- මූල්‍ය
- තොරතුරු තාක්ෂණය
- මානව සම්පත්
- අභ්‍යන්තර විගණන
- සංඛ්‍යාලේඛන

1980 අංක 46 දරන පනත

- ආයතනික යහපාලනය
- ආයතනික අවදානම් කළමනාකරණය

ආයෝජකයින් (රු.)

- සාමාජික අරමුදල බි 339
- ආයෝජන ප්‍රතිලාභ 9.44%

සාමාජිකයින්

- පොළිය 3%
- ලාභාංශය 5%

සේවකයන් (රු.)

- පුද්ගල වියදම් බි1.3
- පුහුණු හා සංවර්ධන පිරිවැය මි 4
- සේවය හැරයාම් 1% කට වඩා අඩුය

ප්‍රජාව (රු.)

- හිමිකම් ගෙවීම් (ලාභාංශ සහ පොළී ඇතුළත්ව) බි20
- හදවත් සැත්කම් සඳහා මි173
- නිවාස යෝජනා ක්‍රම සඳහා මි94
- මරණ ප්‍රතිලාභ සඳහා මි111
- 5 වසර ශිෂ්‍යත්ව සමතුන් සඳහා මි94
- අධ්‍යාපන ප්‍රදාන සඳහා මි46
- ශ්‍රමසුව යෝජනා ක්‍රමය මි10
- ස්ථිර ආබාධිත බව මි12
- වකුගඩු බද්ධ කිරීම සඳහා මි6
- ඇසේ කාච සඳහා මි4



ආයතනික **සමාලෝචනය**

වර්තමානයේ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට (ETFB) භාරකරුවෙකුගේ හෝ අත්භාරකරුවකුගේ භූමිකාව ඉටු කිරීම සඳහා සාම්ප්‍රදායික සංවිධාන ව්‍යුහයක් ඇති අතර අනාගතයේ දී සංවිධානය වඩාත් ශක්තිමත් මූල්‍ය සංවිධානයක් බවට පත් කිරීම කළමනාකාරිත්වයේ අපේක්ෂාවයි. පනත මගින් සංවිධානය ව්‍යුහය පිළිබඳව විස්තර නොකෙරේ. කෙසේ වෙතත්, 5 වන වගන්තිය යටතේ මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු සඳහා රීති සම්පාදනය කිරීමට මණ්ඩලයට හැකිය.

අරමුදලේ ක්‍රියාකාරකම් සඳහා කළමනාකරණයේ සමස්ත වගකීම එහි අධ්‍යක්ෂ මණ්ඩලය සතුය. මණ්ඩලය සාමාජිකයින් නව දෙනෙකුගෙන් සමන්විත වන අතර ඉන් හතර දෙනෙකු අදාළ අමාත්‍යවරයා විසින් පත් කරනු ලබයි. සාමාජිකයන් දෙදෙනෙකු මුදල් හා වෙළඳ විෂයයන් භාර අමාත්‍යවරුන් විසින් නම් කරනු ලැබේ. එක් සාමාජිකයෙකු ලංකා සේව්‍ය සම්මේලනය විසින්ද සාමාජිකයින් දෙදෙනකු, සමාජිකයින් 100,000 ට වඩා සිටින වෘත්තීය සමිති විසින්ද පත් කරනු ලැබේ.

මණ්ඩලයේ සභාපතිවරයා තෝරාගනු ලබන්නේ විෂය භාර අමාත්‍යවරයාගේ අභිමතය පරිදි වන අතර ඔහු පනත මගින් සපයා ඇති පරිදි සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරී වරයාද වේ.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය මුලදී ව්‍යුහගත වූයේ මධ්‍යගත සංවිධානයක් ලෙස ය. එයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ සේවා යෝජකයින්ගෙන් බහුතරයක් බස්නාහිර පළාතේ සංකේන්ද්‍රණය වී තිබීම ය. බොහෝ විභවයක් සහිත ප්‍රදේශවල ප්‍රාදේශීය කාර්යාල සහ දිස්ත්‍රික් කාර්යාල විවෘත කිරීමත් සමඟ ප්‍රාදේශීය කාර්යාල ජාලයේ ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන අවසන් කිරීමෙන් පසු බලාත්මක කිරීමේ සහ නීතිමය කටයුතුවල වේගවත් සංවර්ධනයක් සිදු විය. පසුව සාමාජික සේවා ක්‍රියාකාරකම් වන හිමිකම් ඉල්ලුම්පත් භාරගැනීම, හිමිකම් ගෙවීම්, සාමාජික දැනුවත් කිරීමේ වැඩසටහන් ආදිය විමධ්‍යගත කරන ලදී.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ක්‍රියාකාරී ප්‍රදේශ පුළුල් ලෙස, මෙහෙයුම් සහ උපකාරක සේවා ලෙස බෙදිය හැකිය. රැස්කිරීම් හා සේවායෝජක සබඳතා, සාමාජික සේවා සහ ආයෝජන අංශ මෙහෙයුම් කේෂ්ත්‍ර ලෙස හඳුනාගෙන ඇත. පරිපාලන හා මානව සම්පත්, මූල්‍ය, තොරතුරු තාක්ෂණ හා අභ්‍යන්තර විගණනය යනාදිය උපකාරක සේවා ලෙස හඳුනාගෙන ඇත.

පනතේ නිශ්චිතව දක්වා ඇති පරිදි සංවිධානයේ ප්‍රධාන විධායක නිලධාරීවරයා ලෙස රාජකාරී ඉටු කිරීමට සභාපතිවරයාට බලය ඇත. සාමාන්‍යාධිකාරී සහ අතිරේක සාමාන්‍යාධිකාරී ප්‍රධාන විධායක නිලධාරීගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. ආයතනයේ සෑම කොට්ඨාශයක්ම මෙහෙයවනු ලබන්නේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවයෙකු විසිනි.

මණ්ඩලයේ කොට්ඨාශ/ අංශ / ඒකකවල කාර්යයන්

01

දායක මුදල් රැස්කිරීම් හා සේවායෝජක සබඳතා කොට්ඨාශය



පුද්ගලික අංශයෙහි සහ විශ්‍රාම වැටුපක් නොගෙවන රාජ්‍ය ආයතනවල සේවයෙහි නිරත සේවක සේවිකාවන්ගේ දළ ඉපැයීම්වලින් 3%ක් වූ ප්‍රමාණයකින් දායක මුදල් ගෙවීම අදාළ සේවායෝජකයා විෂයෙහි අනිවාර්ය කරුණක් වන්නේ ය. එම සේවායෝජකයන් වෙතින් කලට වේලාවට දායක මුදල් රැස්කර ගැනීම, අධිභාර වෙතොත් ඒවා අයකර ගැනීම, ගෙවීම් පැහැර හරින්නන් හා දායක මුදල් නොගෙවන්නන් සොයා බැලීම සහ ගෙවීම් පැහැර හරින්නන්ට එරෙහිව නීති මගින් කටයුතු කිරීම යනාදිය දායක මුදල් රැස්කිරීමේ ක්‍රියාදාමය හා සම්බන්ධ ප්‍රමුඛ කාර්යන් සමහරකි. රැස්කිරීම් හා සේවායෝජක සබඳතා අංශය, මණ්ඩලය වෙත ලැබිය යුතු දායක මුදල් රැස්කර ගැනීමේ ඉලක්ක සපුරා ගැනීම සම්බන්ධයෙන් වගකීම උසුලයි.

02

ආයෝජන කොට්ඨාශය



ආයෝජන කොට්ඨාශය මණ්ඩලයේ ආයෝජන කාර්ය භාරය කළමනාකරණය කිරීම අරඹයා පිහිටුවන ලද ආයතනයට අයත් දැඩිව සහබද්ධ වූ ව්‍යාපාරික ඒකකවලින් එකකි. මෙම ඒකකයෙහි ප්‍රමුඛ අරමුණ වනුයේ, ආයෝජන තුළින් හැකි උපරිම ලාභ සලසා ගන්නා අතරම ඒවායේ ආරක්ෂාව සහතික කරමින් ද්‍රවශීලතා මට්ටම පවත්වාගෙන යාමයි. ආයෝජන තීරණ වලට එළඹීම පිණිස වන්නා වූ සියලු කරුණු ග්‍රහණය කර සෑදූ ආයෝජන ප්‍රතිපත්තියක් ආයෝජන අංශය සතුය.

03

සාමාජික සේවා කොට්ඨාශය



මෙම කොට්ඨාශය අයත් ප්‍රධාන කර්තව්‍යයන්හිලා, සාමාජික ගිණුම් යාවත්කාලීන කර පවත්වාගෙන යාම, සාමාජික සාමාජිකාවන් වෙත වාර්ෂික සාමාජික ප්‍රකාශ නිකුත් කිරීම, සාමාජික පොදු ප්‍රතිලාභ (සාමාන්‍ය හා මරණ හිමිකම්) ලබාදීමේ ක්‍රියාවලිය කඩිනමින් ඉටුකිරීම සහ සක්‍රීය සාමාජික සාමාජිකාවන් වෙනුවෙන් වෙනත් සුභසාධන යෝජනා ක්‍රම පවත්වාගෙන යාම යනාදී කටයුතු අන්තර්ගත වේ. මෙම අංශයේ කටයුතු තවදුරටත් සවිමත් කිරීම පිණිස අවශ්‍ය වන්නා වූ පොදු කාර්ය යටිතල ව්‍යුහය සලසා දීම සඳහා ප්‍රමාණවත් පරිදි පියවර ගනු ලැබ තිබේ.

04

මුදල් කොට්ඨාශය



මුදල් කොට්ඨාශය හා සහබද්ධව පවත්නා කර්තව්‍යයන්හිලා, මාසික හා වාර්ෂික ගිණුම් පිළියෙල කිරීම, වාර්ෂික අයවැය සකස් කිරීම, රජයේ බදු ඇතුළුව කාර්ය මණ්ඩලය හා අනෙකුත් ගෙවීම් සිදු කිරීම, රජයේ විගණන කටයුතු සම්බන්ධීකරණය කිරීම, ආයතනික සැලසුම් හා වෙනත් කළමනාකරණ තොරතුරු වාර්තා පිළියෙළ කිරීම යනාදී කටයුතු අන්තර්ගත වේ.

05

පාලන හා මානව සම්පත් කොට්ඨාශය



වත්මන් තරඟකාරී ව්‍යාපාරික පරිසරය තුළ බෙහෙවින් වැදගත් වන්නාවූ නවීන මානව සම්පත් විධික්‍රම හා විශිෂ්ටතම කාර්යාල පරිචයන් සමඟ ගැළපෙමින් කටයුතු කිරීමේ අවශ්‍යතාවය හඳුනාගනු ලැබ තිබේ. සේවා සපයන ආයතනයක් වශයෙන් කටයුතු කරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විෂයයෙහි ද ජනතාවගේ (සේවා නියුක්තයන්ගේ) සේවා අවශ්‍යතාවය මත රැඳෙමින් කටයුතු කිරීම ඉතා ඉහළ තලයක විය යුතු වන්නේය. එබැවින්, පාලන හා මානව සම්පත් කොට්ඨාශය විසින් ඉටු කරනු ලබන කාර්යයන් සංවර්ධනය කර වැඩි දියුණු කිරීම සඳහා ඉහළ ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ. ඒ අනුව, පාලන හා මානව සම්පත් අංශය විසින් පිළිපදින ලැබිය යුතු දැනටමත් පවත්නා ක්‍රම සහ කාර්ය පටිපාටි යාවත්කාලීන කර වැඩි දියුණු කිරීම සඳහාත්, ඒ වෙනුවෙන් කාර්ය මණ්ඩලයට අවශ්‍ය වන්නාවූ පුහුණුව ලබාදීම සඳහාත් විවිධ මූල පිරීමේ කාර්යයන් සිදු කර ඇත.

06

තොරතුරු තාක්ෂණ කොට්ඨාශය

අරමුදලේ සාමාජික පාලන මෘදුකාංග පද්ධතිය කළමනාකරණය කරමින් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් තොරතුරු කොට්ඨාශය අංශය ප්‍රධාන වශයෙන් වගකීම උසුලයි. ශ්‍රී ලංකා තොරතුරු සංනිවේදන තාක්ෂණ නියෝජිතායතනය හා එක්ව ක්‍රියා කරමින් ආයතනයට අයත් තොරතුරු තාක්ෂණ පරිසරය ප්‍රතිව්‍යුහගත කිරීම පිණිස වූ සියලු මූලාරම්භක කටයුතු ඉටු කරනු ලැබ තිබේ.



07

අභ්‍යන්තර විගණන කොට්ඨාශය



ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතිය ප්‍රමාණවත් පරිදි ස්ථාපනය කරනු ලැබ ඇති බවටත්,එම පද්ධති අඛණ්ඩව හා ප්‍රශස්ත මට්ටමකින් අනුගමනය කරනු ලබන බවටත් සහතික වීමේ වගකීම අභ්‍යන්තර විගණන කොට්ඨාශය උසුලයි. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) ප්‍රධාන විධායක නිලධාරී වෙත සෘජුවම වාර්තා කරනු ඇත. කළමනාකරණයේ මතය වනුයේ, අභ්‍යන්තර විගණනය සම්බන්ධයෙන් දැනට පවත්නා ක්‍රම හා කාර්ය පටිපාටිවල ප්‍රමාණවත්භාවය නැවත තක්සේරු කිරීම සඳහාත්, ආයතනයෙහි තීරණ ගැනීමේ ක්‍රියාවලියෙහිලා අභ්‍යන්තර විගණනයේ කාර්ය භාරය ඵලදායී මෙවලමක් ලෙස ශක්තිමත් කිරීම සඳහාත් නිසි අධ්‍යයනයක් කළ යුතුය යන්න ය.

08

නීති අංශය

මණ්ඩලයට අදාළ වන්නාවූ සියලුම නෛතික කටයුතු අරබයා උපදේශක සේවා ඒකකයක් ලෙස නීති අංශය ක්‍රියාත්මක වේ. අදාළ නෛතික කටයුතු ප්‍රාදේශීය කාර්යාල ජාල සේවය ව්‍යාප්ත කරනු ලැබීමත් සමඟ ප්‍රාදේශීය මට්ටම කරා විමධ්‍යගත කරනු ලැබ තිබේ. සහකාර සාමාන්‍යාධිකාරී (නීති) අධීක්ෂණය යටතේ නීති අංශය කටයුතු කරන අතර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (රැස්කිරීම් හා සේවායෝජක සබඳතා) වෙත වාර්තා කරයි.



09

සංඛ්‍යා ලේඛන අංශය



ඵලදායී ලෙස තීන්දුවලට එළඹිය හැකි වනු පිණිස අදාළ සියලු දෙනා වෙත තථ්‍ය කාල දත්ත සමුදායක් ලබා දීමත්, අවශ්‍ය දත්ත පිළිබඳව ප්‍රවනතා විග්‍රහයක් පිළියෙළ කිරීම හා ඒවා විශ්ලේෂණය කිරීමත්, කාලානුරූපී පදනමක් මත ඉදිරි වර්ෂ සඳහා පුරෝකථන හා සැලසුම් ඉදිරිපත් කිරීමත්, වාරමය වශයෙන් කළමනාකාරිත්වයට තීරණ ගැනීම පිණිස අවැසි වන්නාවූ වැදගත් සංඥා සපයා දීමත්, ජාතික ක්‍රම සම්පාදනය සහ එය ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය ආයතන වෙත කාණ්ඩගත හා සුවිගත තොරතුරු ප්‍රචලිත කර හැරීමත් සංඛ්‍යා ලේඛන අංශයේ ප්‍රධාන කර්තව්‍යයන් වේ.

කාර්ය සාධන
සමාලෝචනය



සාමාජික දෘෂ්ටි කෝණය

පොළිය සහ ලාභාංශ (රු. බි)



ආදායමට එරෙහිව මෙහෙයුම් වියදම් (රු. බි)



31.12.2019 වන දිනට කලඹෙහි සංයුතිය



සේවක දෘෂ්ටි කෝණය

සේවකයින් ගණන



මුළු කාර්ය මණ්ඩල පිරිවැය (රු. මිලියන)



පුහුණු හා සංවර්ධන පිරිවැය (රු මිලියන)



රජයේ දෘෂ්ටි කෝණය

රජයට ගෙවන ලද බදු (රු. මි)



රාජ්‍ය සුරැකුම්පත්වල මුළු ආයෝජනය (රු. බි)



ප්‍රජාවේ දෘෂ්ටි කෝණය

ප්‍රතිලාභ ක්‍රම (රු. මිලියන)



නාභිගත **සංක්‍රමණය**

වර්තමාන තත්වය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදලෙහි 2019 දෙසැම්බර් 31 වන විට බිලියන 339 ක සාමාජික අරමුදලක් පවතින අතර වර්තමානයේ දායකත්වය ලබාදෙන සාමාජිකයින් මිලියන 2.6 ක් සහිතව සාමාජික ගිණුම් මිලියන 15.3 ක් පමණ ඇත.

2019 වසර සඳහා මුළු දායකත්වය රු.බිලියන 27.5 ක් ලෙස වාර්තා වූ අතර එම කාලය තුළ මණ්ඩලය විසින් සාමාජිකයින්ට රුපියල් බිලියන 19.8 ක් ආපසු ගෙවා ඇත. 2019 දෙසැම්බර් 31 වන විට අරමුදලේ මුළු වත්කම රුපියල් බිලියන 343 කි. මෙම කාල සීමාව සඳහා මුළු ආදායම රු. බිලියන 32.1 ක් වන අතර ශුද්ධ ලාභය රුපියල් බිලියන 25.5 ක් ලෙස වාර්තා විය.

2019 සඳහා පොලී සහ ලාභාංශ ලෙස සමස්ත සාමාජිකයින්ට 8% ක අනුපාතයක් ප්‍රකාශ කිරීමට මණ්ඩලයට හැකි විය. රාජ්‍ය බැංකු තම ගනුදෙනුකරුවන්ට ලබා දෙන ඉතුරුම් අනුපාත හා සැසඳීමේදී මෙය ආකර්ශනීය අනුපාතයකි.



අනාගත තත්වය

- ඉදිරි වසර 5 තුළ සාමාජික අරමුදල රුපියල් ට්‍රිලියන භාගයක් දක්වා වර්ධනය කිරීම. වර්තමාන වාර්ෂික ආදායම රුපියල් බිලියන 30 සිට බිලියන 60 දක්වා හෝ 100% වැඩි කිරීමට අපේක්ෂා කෙරේ.
- සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ක්‍රියාවලිය ක්‍රියාවට නැංවීම, කඩදාසි භාවිතයකින් තොර සම්පූර්ණයෙන් ස්වයංක්‍රීය තොරතුරු තාක්ෂණ පද්ධතියක් දක්වා ගමන් කිරීමට ඉවහල් වන ලෙස සේ.නි.හා අරමුදලේ මෙහෙයුම් කටයුතු ඩිජිටල්කරණය කිරීම පිණිස ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) තාක්ෂණික සහ මූල්‍ය සහය සමඟ මෘදුකාංග සංවර්ධකයා විසින් දැනටමත් සංවර්ධන වැඩ ආරම්භ කර ඇති ප්‍රති ඉංජිනේරු ව්‍යාපෘතිය සාර්ථකව නිම කිරීම.
- සාමාජිකයින්ට ඔවුන්ගේ බහු ගිණුම් සඳහා පහසු ප්‍රවේශයක් ලබා දීම සඳහා පවත්නා සේවායෝජක කේන්ද්‍රීය දත්ත පදනම වෙනුවට සාමාජික කේන්ද්‍රීය දත්ත පදනමක් සංවර්ධනය කිරීම.
- පාරිභෝගික හිතකාමී ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි සංවර්ධනය කිරීම සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත සංශෝධනය කිරීමට පියවර ගැනීම.
- ස්මාර්ට් ජංගම දුරකථන සහ පරිගණක වැනි නවීන ඉලෙක්ට්‍රොනික උපකරණ හරහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පද්ධතියට ප්‍රවේශ වීමට පහසුකම් සැලසීමේ අරමුණින් තත්‍ය කාලීන ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමවේදයක් සහ හිමිකම් සැකසුම් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.
- බලාත්මක කිරීම සහ පාරිභෝගික සම්බන්ධතා ක්‍රියාකාරකම් මගින් සේවකයින් 100% ක් ආවරණය කිරීම සහතික කිරීම
- තොරතුරු නුවමාරු කර ගැනීම සඳහා රාජ්‍ය ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම ආරම්භ කිරීම (සේවක අර්ථසාධක අරමුදල, සමාගම් ලියාපදිංචි කිරීම, පුද්ගලයින් ලියාපදිංචි කිරීම,සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, අධ්‍යාපන අමාත්‍යාංශය ආදිය)
- සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට අයත් නවම් මාවත ඉඩමේ වටිනාකම රු.බිලියන 50 ක් දක්වා වැඩි කිරීම පිණිස මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස සංවර්ධනය කිරීම.
- ඉහළ කාර්ය සාධනයක් ලබා ගැනීම සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සේවකයන්ගේ කුසලතා ධාරිතාවය වර්ධනය කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.
- කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ඵලදායිතා ලේකම් කාර්යාලයේ තාක්ෂණික සහාය ඇතිව ප්‍රමුඛ ඵලදායිතා සංකල්ප පූර්ණ ලෙස ක්‍රියාත්මක කිරීම.
- සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සතු නව කාර්යාල 5 ක් ප්‍රාදේශීය මට්ටමින් පිහිටුවීම.



1981 සිට 2019 දක්වා
සුවිශේෂී අවස්ථා

1986

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය: රු. 100,000/-

1989

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය: **නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය : රු. 200,000/-**

1991

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය: නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය: **හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර: රු. 300,000/-**

1992

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය: නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය: හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර: **අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය: රු. 18,000/-**

1994

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය: නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය: හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර: අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය: **පහ වසර ශිෂ්‍යත්ව: රු. 15,000/- බැගින් ශිෂ්‍යත්ව 9,000**

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය : නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය : හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර : අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය : පහ වසර ශිෂ්‍යත්ව : **"ශ්‍රම සුව රැකවරණ" රෝහල්ගත වීමේ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය වසරකට රු. 25,000/- බැගින් රු. 50,000/- ක උපරිමයක් දක්වා මුළු සේවා කාලය තුළදී**

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය: නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය: හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර: අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය: පහ වසර ශිෂ්‍යත්ව: "ශ්‍රම සුව රැකවරණ" රෝහල් ගතවීමේ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය: "වියන" අඩුපොළී නිවාස ණය යෝජනා ක්‍රමය: වකුගඩු බද්ධ කිරීම සඳහා මූල්‍යාධාර: රු. 300,000/-

2010 වසරේ සියලු කාර්යවල අත්කර ගැනීම සහ **අභ්‍යන්තර අක්ෂිකාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය: රු. 30,000/-**



මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය: නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය: හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර: අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය: පහ වසර ශිෂ්‍යත්ව: "ශ්‍රම සුව රැකවරණ" රෝහල් ගතවීමේ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය: **"වියන" අඩුපොළී නිවාස ණය යෝජනා ක්‍රමය**

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය: නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය: හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර: අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය: පහ වසර ශිෂ්‍යත්ව: "ශ්‍රම සුව රැකවරණ" රෝහල් ගතවීමේ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය: "වියන" අඩු පොළී නිවාස ණය යෝජනා ක්‍රමය: වකුගඩු බද්ධ කිරීම සඳහා මූල්‍යාධාර: **පහ වසර ශිෂ්‍යත්ව සමත් දු දරුවන් සඳහා : රු. 15,000/- (ඊට අමතරව පහ වසර ශිෂ්‍යත්වය සමත් නිත්‍ය දුබලතාවට පත්වීම හේතුවෙන් සේවා නියුක්තිය අවසන් කිරීමට සිදුවූ සේ.නි.හා.අ. සාමාජික සාමාජිකාවන් දුදරුවන් සඳහා ශිෂ්‍යත්ව) අ.පො.ස. (උ/පෙළ) සමත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට මූල්‍යාධාර : රු. 12,000/-**

ආර්ථික
සමාලෝචනය

සමාජ ආරක්ෂණ අරමුදලක් වන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය (ETFB) එහි සාමාජිකයින්ට මූල්‍ය ප්‍රතිලාභ ලබා දීමට ප්‍රමාණවත් වන ප්‍රතිලාභයක් උත්පාදනය කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වන අතර එය ආර්ථිකයේ පවතින ක්ෂුද්‍ර හා සාර්ව ආර්ථික කම්පනවලට බෙහෙවින් ගොදුරු වේ. ආර්ථිකයක් යනු එකිනෙක සමඟ අන්තර් සම්බන්ධිත ක්‍රියාකාරිත්වයන් සමූහයකි. එක් ක්‍රියාකාරිත්වයක ප්‍රතිඵලයක් විවිධ ආර්ථික ඇඟවුම් ගෙන එන තවත් කාර්යයකට සෘජු හෝ වක්‍ර බලපෑමක් ඇති කරයි.

ප්‍රධාන ද්වි-මාර්ග ආර්ථික බලපෑම් ගෙන ඒම සඳහා සලකා බැලීමෙන් අනතුරුව 2019 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ සිදු වූ ප්‍රධාන සිදුවීම් අතුරින් කිහිපයක් දිවයින කෙරෙහි ජාත්‍යන්තර අවධානය යොමු කිරීමට ද හැකි විය. ඒවා නම්, දේවස්ථාන තුනක සහ හෝටල් තුනක පුද්ගලයන් 259 දෙනෙකු ඝාතනය කරමින් පාස්කු ඉරිදා සිදුවූ බෝම්බ පිපිරීම්, අඩු මධ්‍යම ආදායම් ලබන රටක් ලෙස ලෝක බැංකුවේ යාවත්කාලීන වර්ගීකරණයට අනුව දළ ජාතික ආදායම වැඩි වීමත් සමඟ ඉහළ මධ්‍යම ආදායම් උපයන රටක් ලෙස රට උසස් වීම, දිවයිනේ උතුරු ප්‍රදේශයට බලපෑ නියඟය සහ පුද්ගලයන්ගේ දේපළ හා ජීවනෝපාය දෙකටම හානි කරමින් කොළඹ, මාතර සහ ගාල්ල යන ප්‍රධාන ප්‍රදේශවලට දැඩි ලෙස බලපෑ ගංවතුර, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ 7 වන විධායක ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම සඳහා පැවති ජනාධිපතිවරණය යනාදියයි.

ගෝලීය සන්දර්භය තුළ චීක්සත් ජනපද-චීන වෙළඳ යුද්ධය අබණ්ඩව පැවතීම, යුරෝපා සංගමයෙන් ඉවත්වීම පිළිබඳ චීක්සත් රාජධානියේ තීරණය අවසානාත්මක කිරීමේදී අයහපත් තත්වයකට පත්වූ බ්‍රෙක්සිට් වට මේස සාකච්ඡා, බ්‍රසීලයේ වනාන්තර ආවරණයට දැඩි ලෙස බලපෑම් කළ ඇමසන් වනයේ ගින්න යනාදිය ඉස්මතු කළ හැකිය.

දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය සහ ශ්‍රී ලංකාවේ චීක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය
මූලාශ්‍රය:**https://data.worldbank.org/**

දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය සහ ශ්‍රී ලංකාවේ චීක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය



ලෝක බැංකුව විසින් පල කරන ලද "ආදායම් මට්ටම අනුව රටවල් වර්ගීකරණය 2019-2020" අනුව: ශ්‍රී ලංකාවේ ස්ථාවරය පහළ මධ්‍යම ආදායම් ලබන රටක සිට ඉහළ මධ්‍යම ආදායමක් දක්වා ඉහළ නංවා තිබේ. 2019 ජූලි 1 වන විට රටේ දළ ජාතික ඒක පුද්ගල ආදායම ඇ.ඩො. 3,995 සීමාව ඉක්මවා ගොස් ඇ.ඩො.4060 ක වාර්තාගත ඒක පුද්ගල දළ ජාතික ආදායම දක්වා පැමිණ ඇත. 2001 න් පසු අඩුම දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය 2018 දී වාර්තා විය (3.2%). කෙසේ වෙතත්, ආසියානු සංවර්ධන බැංකුව (ADB) දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය 2019 වර්ෂය සඳහා 2.6% ක පුරෝකථනයකින් පහත හෙලන අතර 2020 වර්ෂය සඳහා 3.5% ක සුළු වැඩිවීමක් පෙන්නුම් කරයි.

පාස්කු ඉරිදා ප්‍රහාරය

සංචාරක ව්‍යාපාරය රටේ තුන්වන විශාලතම විදේශ විනිමය ජනනය කරන මාවත ලෙස සැලකේ. ප්‍රචණ්ඩත්වයෙන් හා තුස්තවාදී ක්‍රියාවලින් තොර සංචාරක හිතකාමී පරිසරයක් ඕනෑම සංචාරක හිතකාමී ගමනාන්තයක පදනම ලෙස සැලකේ. දේවස්ථාන තුනක් සහ රටේ අගනගරයේ දේශීය සහ විදේශීය සංචාරකයන් පිරී ඉතිරී ගිය සුබෝපභෝගී හෝටල් තුනක උදෑසන ආහාර වේලාව ඉලක්ක කරගනිමින් 2019 අප්‍රේල් 21 සිදුවූ පාස්කු ඉරිදා ප්‍රහාරය විදේශීය ජාතිකයන් පස් දෙනෙක් ඇතුළුව පුද්ගලයන් දෙසිය පනස් නවයක් මරුමුවට පත් කළේය. මෙම අනපේක්ෂිත සිදුවීම තුළින් මතුවූ අවදානම් සැලකිල්ලට ගනිමින් බොහෝ රටවල් ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින්ට සංචාරක තහනම පැනවීමත් සමඟ රටේ සංචාරක කර්මාන්තයට දැඩි බලපෑමක් එල්ල විය. මෙම සිදුවීම ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය විසින් අපේක්ෂා කළ මිලියන 2.5 සිට සංචාරකයින්ගේ පැමිණීම 1,913,702 දක්වා පහත හෙලා ඇත. කෙසේ වෙතත්, අප්‍රේල් / 21 ප්‍රහාරය නොතකා 2019 සඳහා ලෝන්ලි ප්ලැනට් හි ඉහළම ගමනාන්තය ලෙස සිය ස්ථාවරය තහවුරු කිරීමට ශ්‍රී ලංකාවට හැකි විය.

මාසික සංචාරක පැමිණීම පහත රූප සටහනෙන් දැක්වේ.

	ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	ඔක්තෝබර්	නොවැම්බර්	දෙසැම්බර්
2014	146,575	141,878	133,048	112,631	90,046	103,175	133,971	140,319	105,535	121,576	119,727	178,672
2015	156,246	165,541	157,051	122,217	113,529	115,467	175,804	166,610	143,374	132,280	144,147	206,114
2016	194,280	197,697	192,841	136,367	125,044	118,038	209,351	186,288	148,499	150,419	167,217	224,791
2017	219,360	197,517	188,076	160,249	121,891	123,351	205,482	190,928	145,077	152,429	167,511	244,536
2018	238,924	235,618	233,382	180,429	129,466	146,828	217,829	200,359	149,087	153,123	195,582	253,169
2019	244,239	252,033	244,328	166,975	37,802	63,072	115,701	143,587	108,575	118,743	176,984	241,663

මූලාශ්‍රය: SLTDA (මාසික සංඛ්‍යාලේඛන බුලටීනය)

පාස්කු ප්‍රහාරයෙන් පසු පෙර වර්ෂවල එකම කාල වකවානු හා සසඳන විට පැමිණීමේ අඩුවීමක් වගුව මගින් දැක්වේ. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා රජය විසින් ලබා දී ඇති සහතිකය සහ ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිසාධන වැඩසටහන් සැලකිල්ලට ගනිමින්, 2019 වර්ෂයේ අග භාගයේ දී වැඩි දියුණුවක් දක්නට ලැබුණි.

කොළඹ කොටස් වෙළෙඳපොළ දර්ශක චලනයන්



ආයෝජකයින්ට කොටස් ආයෝජන වලින් ලැබෙන අඩු ප්‍රතිලාභයක් පෙන්නුම් කරමින්, 2019 මූල්‍ය වර්ෂය තුළ දර්ශකවල මන්දගාමී එකතැන පල්වීමේ ස්වභාවයක් දිගටම පැවතුනි. අභ්‍යන්තර හා බාහිර කම්පන හේතුවෙන් ඇති වූ ආර්ථික අවිනිශ්චිතතාවයේ ප්‍රතිඵලයක් ලෙස ශුද්ධ විදේශ අලෙවිය සිදුවී ඇති අතර මෙම මන්දගාමී ස්වභාවයට එය බලපා ඇති බව හඳුනාගනු ලැබිණි.

රාජ්‍ය ණය සංයුතිය, 2012-2018

ශ්‍රී ලංකා රුපියල් මිලියන වලින් දැක්වේ

	2012	2013	2014	2015	2016	2017	2018
දේශීය ණය	**3,232,813**	**3,832,825**	**4,277,783**	**4,959,196**	**5,341,507**	**5,594,427**	**6,017,992**
භාණ්ඩාගාර බිල්පත්	629,070	700,137	694,767	658,240	779,581	697,154	746,887
රුපියල් ණය	58,386	55,518	55,518	24,088	24,088	24,088	24,088
භාණ්ඩාගාර බැඳුම්කර	2,095,054	2,452,360	2,844,054	3,305,248	3,714,787	3,822,620	4,140,661
වෙනත්	450,304	624,811	683,444	971,620	823,051	1,050,566	1,106,355
විදේශ ණය	**2,767,299**	**2,960,424**	**3,113,116**	**3,544,031**	**4,045,796**	**4,718,618**	**5,959,547**
මුළු ණය	**6,000,112**	**6,793,249**	**7,390,899**	**8,503,227**	**9,387,303**	**10,313,045**	**11,977,539**

දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස රජයේ ණය 2009 වසරෙන් පසු පැමිණි ඉහළම මට්ටමට 2018 වසරේදී පැමිණ තිබේ.

විදේශ ණය තොගයේ ප්‍රධාන කොටසක් ඇමරිකානු ඩොලර් වලින් දක්වා ඇති ණය වලින් සමන්විත වන බැවින්, මුදල් ක්ෂයවීම රටේ වාර්ෂික ණය සේවා ගෙවීම් (පොලී සහ ප්‍රාග්ධන ආපසු ගෙවීම්) ඇතුළත් විදේශ ණය තොගයට සැලකිය යුතු බලපෑමක් ඇති කරයි. තවද, රටක ස්වෛරී ශ්‍රේණිගත කිරීමෙහි ප්‍රධාන නිර්ණායකයක් ලෙස ණය දැරීමේ තිරසාර බව සැලකේ.

මුළු ණය තොගයේ ව්‍යවහාර මුදල් සංයුතිය



දළ දේශීය නිෂ්පාදිතයේ % ලෙස රාජ්‍ය ණය



	2012	2013	2014	2015	2016	2017	2018
Foreign	31.7	30.9	30.0	32.4	33.7	35.2	41.2
Domestic	37.0	40.0	41.3	45.3	44.5	41.7	41.6
Total	**68.7**	**70.8**	**71.3**	**77.7**	**78.3**	**76.9**	**82.9**

තෝරාගත් විදේශ මුදල් කිහිපයකට එරෙහිව ශ්‍රී ලංකා රුපියලේ සංචලනය - 2019



වෙළඳ ආනයන හා අපනයන



Source: CBSL official website

අපනයන හා සැසඳීමේදී ආනයන ඉහළ අගයක් ගන්නා විට මුදල් අවප්‍රමාණය රටක ගෙවුම් ශේෂයට අහිතකර ලෙස බලපායි. මෙය අනෙක් අතට රටේ විදේශ විනිමය සංචිතයට බලපෑම් කරයි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වූ විට, දේශීය අපනයන ජාත්‍යන්තර වෙළඳපොලේදී අගයෙන් අඩුවේ වේ. මේ තුළින් රටකට ලැබෙන සැබෑ ප්‍රතිලාභ තීරණය කළ හැක්කේ අපනයන හා ආනයන සඳහා වන ඉල්ලුමේ නම්‍යතාවයෙනි. තවද, ගමනාන්තය විදේශීය සංචාරකයින්ට ලාභදායී වන විට දේශීය මුදල් අවප්‍රමාණය වන බැවින් සංචාරක ප්‍රතිලාභ වැනි කර්මාන්තවලට ප්‍රතිලාභ ලැබේ.

ගෝලීය දර්ශක තුළ ශ්‍රී ලංකාවේ ස්ථාවරය

	සූචිය	ප්‍රකාශක	2016		2017		2018		2019	
			ලකුණ	ශ්‍රේණිය	ලකුණ	ශ්‍රේණිය	ලකුණ	ශ්‍රේණිය	ලකුණ	ශ්‍රේණිය
1	දූෂණ සංජානන දර්ශකය	ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල්	36	95	38	91	38	89	38	93
2	ව්‍යාපාර කිරීමේ පහසුව	ලෝක බැංකුව	58.96	107	58.79	110	58.86	111	61.22	100
3	මානව සංවර්ධන දර්ශක ශ්‍රේණිගත කිරීම	එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන	0.774	76	0.776	76	0.78	71	0.78	71
4	ගෝලීය තරගකාරීත්ව දර්ශකය	ලෝක ආර්ථික සංසදය	4.21	68	4.19	71	4.08	85	57.1*	84
5	ගෝලීය ව්‍යවසායකත්ව දර්ශකය	ගෝලීය ව්‍යවසායකත්ව සහ සංවර්ධන ආයතනය	25.5	97	20.9	94	21.9	90	19.1	101
6	ගෝලීය නවෝත්පාදක දර්ශකය	කෝනෙල් විශ්ව විද්‍යාලය, INSEAD සහ ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO)	28.92	91	29.85	90	28.66	88	28.45	89
7	ආර්ථික නිදහස පිළිබඳ දර්ශකය	උරුම පදනම	59.9	93	57.4	112	57.8	111	56.4	115
8	සමස්ත හොඳම රටවල් පිළිබඳ ශ්‍රේණිය	ඒ.ජ. පුවත් සහ ලෝක වාර්තාව (LP)	-	41	-	50	-	51	-	45
9	ගෝලීය අවස්ථා දර්ශකය	මිල්කන් ආයතනය	-	80	-	80	-	88	-	88
10	තොරතුරු සන්නිවේදන තාක්ෂණ සංවර්ධන දර්ශකය	ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය	3.77	116	3.91	117	-	-	-	-

**1 - 7 දක්වා GCI පරිමාණය 1 සිට 100 දක්වා වෙනස් කෙරිණි*





02

ආයතනික භාරකාරිත්වය

අධ්‍යක්ෂ මණ්ඩලය 2019

මහින්ද මඩිහහේවා මහතා
සභාපති/ප්‍රධාන විධායක නිලධාරී
කම්කරු සහ වෘත්තීය සමිති කටයුතු පිළිබඳ
අමාත්‍යතුමා විසින් පත් කරනු ලැබේ

පී.බී මැදගෙදර මහතා
ක්‍රියාකාරී අධ්‍යක්ෂ
කම්කරු සහ වෘත්තීය සමිති කටයුතු පිළිබඳ
අමාත්‍යතුමා විසින් පත් කරනු ලැබේ

කේ.එස්. කුරුකුලසිංහ මහතා
අධ්‍යක්ෂ
කම්කරු සහ වෘත්තීය සමිති කටයුතු පිළිබඳ
අමාත්‍යතුමා විසින් පත් කරනු ලැබේ

ඩබ්.එම්.කේ.එල්. වීරසිංහ මහතා
අධ්‍යක්ෂ
ලංකා සේව්‍ය ෙඩරේෂණයේ නියෝජිත

එම්. ඒ. නාජුඩීන් මහතා
අධ්‍යක්ෂ
වෙළෙඳ අමාත්‍යාංශයේ නියෝජිත

එල්.එස්. දේවේන්ද්‍ර මහතා
අධ්‍යක්ෂ
වෘත්තීය සමිති නියෝජිත

පී. රණවකආරච්චි මහතා
අධ්‍යක්ෂ
වෘත්තීය සමිති නියෝජිත

පී.බී.එස්.සී නෝනිස් මහතා
අධ්‍යක්ෂ
මුදල් අමාත්‍යතුමා විසින් පත් කරනු ලැබේ

ජූඩ් ඩිනාල් පීරිස් මහතා
අධ්‍යක්ෂ
කම්කරු සහ වෘත්තීය සමිති කටයුතු පිළිබඳ
අමාත්‍යතුමා විසින් පත් කරනු ලැබේ

අධ්‍යක්ෂ මණ්ඩලය 2020 ජනවාරි මස සිට බලාත්මක

ශ්‍රියාන් ද සිල්වා විජයරත්න මහතා
සභාපති/ප්‍රධාන විධායක නිලධාරී
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන
අමාත්‍යතුමා විසින් පත් කරන ලද

නීල් උමගිලිය මහතා
අධ්‍යක්ෂ
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන
අමාත්‍යතුමා විසින් පත් කරන ලද

කේ. ඩී රණසිංහ මහතා
අධ්‍යක්ෂ
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන
අමාත්‍යතුමා විසින් පත් කරන ලද

ජූඩ් ඩිනාල් පීරිස් මහතා
අධ්‍යක්ෂ
ලංකා සේවානියුක්තිකයන්ගේ ෙඩරේෂණය
විසින් පත් කරන ලද

ආර්.ඒ.එල්. උදය කුමාර මහතා
අධ්‍යක්ෂ
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන
අමාත්‍යතුමා විසින් පත් කරන ලද

එල්.එස්. දේවේන්ද්‍ර මහතා
අධ්‍යක්ෂ
වෘත්තීය සමිති නියෝජිත

ඊ ඒ ඒකනායක මිය
අධ්‍යක්ෂක
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා
විසින් පත් කරන ලද

ආරියසේන ගාල්ලගේ මහතා
අධ්‍යක්ෂ
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන
අමාත්‍යතුමා විසින් පත් කරන ලද

ඩබ්.එම්. නුරාජිත් සිං මහතා
අධ්‍යක්ෂ
වෘත්තීය සමිති නියෝජිත

එච්.එම්.ඒ.ජේ. කුමාර මහතා
මණ්ඩලීය ලේකම්

ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය

සභාපති/ප්‍රධාන විධායක නිලධාරී
ශ්‍රියාන් ද සිල්වා විජයරත්න

අතිරේක සාමාන්‍යාධිකාරී
ආර්.එන්. ඥාණසේකර

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්

සී. මල්ලිකාරච්චි මහතා	සාමාජික සේවා
කේ.එස්. වැලිවිට මහතා	අභ්‍යන්තර විගණන
එන්.ඩබ්ලිවි. විමලවීර මහතා	මූල්‍ය
ඒ.ජේ.එම්.එස්. ජයසුන්දර මහතා	රැස්කිරීම් හා සේවායෝජක සබඳතා
උදය වික්‍රමනායක මහතා	ආයෝජන

සහකාර සාමාන්‍යාධිකාරිවරුන්

එච්.එම්. සෙනෙවිරත්න මහතා	සාමාජික ගිණුම්
එම්.ඒ.කේ. අලුත්ගමගේ මහතා	මූල්‍ය
ඩබ්ලිවි.එස්. ධර්මසිරි මහතා	තොරතුරු තාක්ෂණය
ජේ.කේ.පී. රංජිත් මහතා	ක්‍රියාත්මක කිරීම් - කළාප I
බී.ආර්. ආරියවංශ මහතා	ක්‍රියාත්මක කිරීම් - කළාප II
පී.ඒ.අයි.සී.පී අල්විස් මිය	ක්‍රියාත්මක කිරීම් - කළාප III
එච්.එම්.ඒ.ජේ. කුමාර මහතා	නීති
වී.එන් ජයරත්න මිය	දායකත්ව එකතු කිරීම
කේ.ජී.එන් රත්නායක මහතා	පරිපාලන හා මානව සම්පත්
ආර්.එම්.එල්. රත්නායක මහතා	අභ්‍යන්තර විගණන
ඩබ්ලිවි ජිනදාස මහතා (ද්විතියික)	සංඛ්‍යාලේඛන

සභාපතිගේ **සමාලෝචනය**

කොවිඩ් 19 වසංගතයේ බලපෑම

එකිනෙකා හා දැඩි ලෙස සම්බන්ධ වූ ලෝකයක් තුළ ජීවත් වන අපි වෙන කවරදාටත් වඩා වැඩියෙන් වසංගතයක අභියෝගයන්ට ලක් වෙමින් සහ ඒ සමගම ආර්ථික අර්බුදයකට මුහුණ දෙමින් ජීවත් වන්නෙමු. 2020 මාර්තු මස මැද භාගයේ සිට ශ්‍රී ලංකාවේ කොවිඩ් 19 රෝගීන් සොයාගැනීමත් සමග රජය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව සතුටට පත්වෙමි. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම සමාජ ආරක්ෂණ අරමුදල ලෙස සැලකෙන අතර එහි යහ පැවැත්ම ජාතික වැදගත්කමකින් යුතු වෙයි.

2018 වසරේදී රු.බිලියන 310.7 ක් වූ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ මුළු වත්කම් ප්‍රමාණය 2019 වර්ෂය තුළ 10.5% කින් ඉහළ ගොස් රු.බිලියන 343.3 දක්වා වැඩි වී ඇති බව පැවසීම ඉමහත් සතුටකි. එමෙන්ම මුළු සේවා යෝජකයින්ගේ සංඛ්‍යාව දැන් 82,375 දක්වා ඉහළ ගොස් තිබේ. තවද, මෙම දුෂ්කර කාලයන් මධ්‍යයේ වුවද ආකර්ශනීය සාමාජික ප්‍රතිලාභ ලබාදීමේ පරමාර්ථය සපුරාලීම සඳහා වසර තුළ 9.44% ක ආයෝජන ප්‍රතිලාභයක් උපයා ගැනීමට අරමුදලට හැකි විය. මෙමගින් අරමුදලට එහි සාමාජිකයින් සඳහා වර්ෂය සඳහා පොලී සහ ලාභාංශ ලෙස 8.00% ක සමස්ත අනුපාතයක් ප්‍රකාශයට පත් කිරීමට හැකි විය. අභියෝගාත්මක වෙළඳපල තත්වයන් මධ්‍යයේ විචක්ෂණශීලී ආයෝජන කළමනාකරණය විවැනි ලාභාංශ අනුපාතයට දායක විය. එසේම ජාතික වශයෙන් සමස්ත පොළී අනුපාත සිඝ්‍ර ලෙස පහත වැටී ඇති වකවානුවක සහ අපගේ ආයෝජන වලින් අති මහත් බහුතරයක් කොටස් වෙළඳපොල මත නොව පොළී දරණ ආයෝජන උපකරණ මත සංකේන්ද්‍රණය වී ඇති අවස්ථාවක මෙවැනි ප්‍රතිලාභයක් ගැන සාකච්ඡා කිරීමට ලැබීම ඉතා වැදගත්කොට සලකමි.

විද්‍යුත් බැංකුකරණ පහසුකම හඳුන්වා දීමෙන් සේවා යෝජකයින්ට නම් කරන ලද බැංකු හයකට ප්‍රේෂණ ගෙවීමට සහ අන්තර්ජාලය හරහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට අදාළ වාර්තා භාරදීමට පහසු වී තිබේ. මෙම භාවිතය මගින් මාසිකව සාමාජිකත්වයෙන් ඉවකතු කිරීමේ ආවරණය සහ සාමාජික සංඛ්‍යාව පිළිවෙලින් 50% ක් සහ මිලියනයක් ලෙස වැඩි කිරීමට හැකියාව ලැබී ඇත. මෙය ඉදිරියේදී තවදුරටත් වැඩි කරගැනීමට අපි බලාපොරොත්තු වන්නෙමු.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සැමවිටම උත්සාහ කරන්නේ මෙහෙයුම් ක්‍රියාකාරකම් සහ ක්‍රියාවලීන් විධිමත් කිරීම මගින් එහි සාමාජිකයින්ට ඉහළ මට්ටමේ සේවාවක් සැපයීමට ය. වර්තමාන සේවායෝජක කේන්ද්‍රීය ක්‍රමය වඩාත් සාමාජික (සේවක) කේන්ද්‍රීය පද්ධතියක් බවට පරිවර්තනය කිරීමට සහ මහජන සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම තුළ සිටින සියලුම සාමාජිකයින්ට තොරතුරු ලබා ගැනීම සඳහා අද්විතීය ක්‍රමවේදයන් සකස් කිරීමට යුහුසුළු වෙමින් සිටිමු. මෙය යථාර්ථයක් බවට පත් කිරීම සඳහා, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මෙහෙයුම් වඩාත් පුළුල් තොරතුරු තාක්ෂණ සක්‍රීය

මාර්තු 20 වන දා පටන් ක්‍රියාත්මක වන පරිදි දීපව්‍යාප්ත ඇඳිරි නීතිය පනවන ලදී. මාසයකට වැඩි කාලයක් අගුළු ලා තිබීමෙන් අනතුරුව ක්‍රමයෙන් ඇඳිරි නීතිය ඉවත් කරන ලදී. වෛරසය පැතිරීම පාලනය කිරීම පිණිස, රජය සහ අදාළ බලධාරීන් දැඩි සහ සාර්ථක ව්‍යායාමයන් ගනු ලැබූ අතර රට තුළ සමාජ ව්‍යාප්තිය සිදු නොවීම සතුටට කරුණක් වන අතර ඒ සඳහා සක්‍රිය ලෙස මැදිහත් වූ රජය සහ අදාළ බලධාරීන්ට අපගේ ආචාරය පිරිනමනු කැමැත්තෙමු. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයද මෙම නව සාමාන්‍ය තත්වයට හැඩගැසුණු නමුත් මෙම අසීරු කාලය තුළදී මහජනතාවට දැඩිව අවශ්‍යව පැවති අරමුදල් සැපයීමේ සමාජ වගකීමද අප වෙත විය. ඇඳිරි නීති කාලය තුළද කුඩා කණ්ඩායම් අවදානම් නොතකා කටයුතු කළ අතර ඔවුන්ගෙ කැපවීමට ස්තුති වන්නට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට, එම අගුලු දැමූ කාලය තුළ මහජනතාවට රු.බිලියන 1.5 කට වැඩි ප්‍රමාණයක් ලබා දීමට හැකි විය. ජාතික අර්බුදයක් අවස්ථාවක්දී අපගේ කණ්ඩායම් එයට ප්‍රතිචාර දැක්වූ ආකාරය පිළිබඳව අපි ආඩම්බර වන්නෙමු. සේවකයින්, ගනුදෙනුකරුවන් සහ අනෙකුත් පාර්ශවකරුවන් සඳහා සුදුසු වැඩ පරිසරයන් සහ ආරක්ෂිත කොන්දේසි සහතික කිරීම සඳහා රජය විසින් පුද්ගල සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳව නිකුත් කරන ලද සියලුම මාර්ගෝපදේශ ද මණ්ඩලට විසින් අනුගමනය කෙරිණි.

පරිසරයක් බවට පරිවර්තනය කිරීම සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) සමඟ ගිවිසුමකට එළඹ සිටිමු.

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) අනුග්‍රහය හා මූල්‍ය තාක්ෂණික සහය ඇතිව 2019 වසරේදී මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ පද්ධතිය ප්‍රති-ඉංජිනේරුකරණ වැඩසටහනේ මූලාරම්භය දියත් කරන ලදී. දැන් එහි අවසන් අදියරට පැමිණ තිබෙන අතර මෙම ව්‍යාපෘතියේ කටයුතු ඉදිරි වසර තුළදී සම්පූර්ණ කිරීමට අපේක්ෂා කෙරේ.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, සාමාජිකයින් මිලියන 15.3 කින් යුතුව, රට තුළ ඇති දෙවන විශාලතම විශ්‍රාම පාරිතෝෂික අරමුදල ලෙස ක්‍රියාත්මක වෙයි. මෙවැනි අරමුදල් එහි සාමාජිකයින්ට ඉහළම සේවාවක් ලබා දෙන බවට සහතික විය යුතුය. සේවා සැපයීම වැඩිදියුණු කිරීම සඳහා සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇති නමුත් තවත් බොහෝ දේ කළ යුතුව ඇත. ඉදිරියේදී ද මේ ගමන අඛණ්ඩව ගෙන යාමට අපි අපේක්ෂා කරමු. සේවකයින්ගේ කැපවීම සහ සහයෝගය නොවන්නට මේ කිසිවක් යථාර්ථයක් කරගත නොහැකි වන්නට තිබිණි. එම නිසා, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ කාර්ය මණ්ඩලය, සාමාජිකයින්ට සේවය කිරීමේ දී දැක්වූ අඛණ්ඩ කැපවීම අගය කිරීමට මම මෙය අවස්ථාවක් කරගනිමි.

එමෙන්ම, තම ජීවිත කාලයේ කළ ඉතුරුම් කළමනාකරණය කිරීම සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය කෙරෙහි තැබූ විශ්වාසය වෙනුවෙන් සියලුම සාමාජිකයන් කෙරෙහි කෘතඥතාව පුද කරන්නෙමි. අවසන් වශයෙන් අපගේ සියලුම කාර්යයන් සාර්ථක කරගැනීමේලා නායකත්වය සහ මාර්ගෝපදේශය ලබා දීම වෙනුවෙන් ගරු මුදල් ඇමතිතුමාටත් අප වෙත ලබා දුන් අඛණ්ඩ සහය සහ සහයෝගීතාව වෙනුවෙන් මහා භාණ්ඩාගාර ලේකම්තුමා සහ කාර්ය මණ්ඩලයටත් මගේ අවංක ස්තුතිය පුද කරමි. අප සිදු කරන කාර්යයන් සඳහා ශක්තිමත් වේදිකාවක් තනා දෙන ජනාධිපති ලේකම්තුමාට සහ එම කාර්යාලයෙන් ලබා දෙන සහයෝගයට සහ මාර්ගෝපදේශකත්වයට හද පිරි ස්තුතිය පිරිනමමි. සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල මේ වන විට අත්දැකීම් බහුල ශක්තිමත් අධ්‍යක්ෂ මණ්ඩලයක මඟපෙන්වීම මත ක්‍රියාත්මක වන අතර එමගින් වඩා දීප්තිමත් ඉදිරියක් වෙත අපේ ගමන සහතික කෙරෙනු ඇත.

ශ්‍රියාන් ද සිල්වා විජයරත්න
සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී

අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාලෝචනය සහ **කළමනාකාරීත්ව සාකච්ඡාව**

2019 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ 39 වන වාර්ෂික වාර්තාව, විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සහ එම වසරට අදාළ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව අධ්‍යක්ෂවරුන් ඉතා සතුටට පත්වේ. මෙම වාර්තාව ඉදිරිපත් කරන්නේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද යහපාලන මාර්ගෝපදේශවල දක්වා ඇති වාර්තාකරණ අවශ්‍යතාවලට අනුකූල වෙමිනි.

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

ආයතනයේ සහ එහි කාර්ය සාධනයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් පිළිඹිබු කිරීම සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම වෙනුවෙන් අධ්‍යක්ෂවරුන් වග කියනු ලබයි. ආදායම් ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, පිටු අංක 63 සිට 94 දක්වා දැක්වෙන වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 1995 අංක 16 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත මගින් පනවන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල අවශ්‍යතාවයන්ට අනුකූලව සකස් කර ඇති බව අධ්‍යක්ෂවරුන්ගේ අදහසයි. ඉහත අවශ්‍යතාවයට අනුකූලව, අධ්‍යක්ෂ මණ්ඩලය සනාථ කරන්නේ, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සැලසුම් කර ඇත්තේ මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය පිළිබඳ සාධාරණ සහතිකයක් ලබා දෙන ආකාරයට ය.

2019 මූල්‍ය වසරේ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම් පිළිබඳ සමාලෝචනයක් පහත දක්වා ඇත.

1. ආයෝජන පරිසරය

රටේ දෙවන විශාලතම සමාජ ආරක්ෂණ අරමුදල වන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය ක්‍රියාත්මක වන්නේ ප්‍රධාන මූලධර්මයන් තුනක් යටතේ ය, ඒවා නම් ආයෝජන සුරක්ෂිතතාව, ප්‍රතිලාභ සහ ද්‍රවශීලතාව යි. ඒ අනුව, අරමුදල ප්‍රධාන වශයෙන් ස්ථාවර ආදායම් ආරක්ෂණ මත ආයෝජනය කරන අතර එය 2019 වසර අවසන් වන විට මුළු ආයෝජන කළඹෙන් 96.7% කට සමාන විය. ඒ අතර ස්කන්ධ ආයෝජනය කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත සමාගම්වල ආයෝජනය 3.3% ක් ලෙස දැක්විණි. එබැවින්, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සමස්ත ආයෝජන කළඹෙහි කාර්ය සාධනයට මූලික වශයෙන් බලපාන සාධක වන්නේ මූලික

වශයෙන් ස්කන්ධ වෙළෙඳපොළ පොලී අනුපාතය සහ කුඩා පරිමාණයෙන් ස්කන්ධ වෙළෙඳපොළේ කාර්ය සාධනය වේ.

2019 මූල්‍ය වසර තුළ වෙළෙඳපොළ පොලී අනුපාත ඉහළ ගොස් තිබුණ ද, 2019 අප්‍රේල් 21 වන දින සිදු වූ පාස්කු ප්‍රහාරය පොලී අනුපාතයන්ට බෙහෙවින් අවාසි සහගත ලෙස බලපෑම් කළ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ආර්ථික කටයුතු අඩු වී මූල්‍ය ප්‍රතිපත්තිය ලිහිල් විය. 2019 මාර්තු මස දී ශ්‍රී ලංකා මහ බැංකුව, බලපත්‍රලාභී වාණිජ බැංකුවල රුපියල් තැන්පතු වගකීමට අදාළ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 6% සිට 5% දක්වා අඩු කරන ලදී. වාණිජ බැංකුවල ණය ව්‍යාප්තිය සඳහා පහසුකම් සැලසීම සඳහා ණය ගැනීමේ පිරිවැය අඩු කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2019 අප්‍රේල් සහ ජූලි මාසවලදී දෙවරක් සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකුවලට තැන්පතු අනුපාත සීමාවන් හඳුන්වා දෙන ලදී. 2019 අප්‍රේල් වන විට තනි බැංකු විසින් පවත්වාගත් සතිපතා AWPR හට සාපේක්ෂව

ඊට සමගාමීව, 2018 වර්ෂය තුළ ASPI සහ S&P SL 20 දර්ශකවල අඛණ්ඩව පහත වැටීමේ ප්‍රවණතාවය දක්නට ලැබුණු අතර පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව තවදුරටත් පිරිහී ගියේය. සිද්ධියෙන් පසු පළමු වෙළඳ දිනයේම ASPI සහ S&P SL 20 දර්ශක පිළිවෙලින් ඒකක 203 සහ 119 කින් සැලකිය යුතු ලෙස පහත වැටුණු අතර 2019 වර්ෂයේ අග භාගය දක්වා මෙම ප්‍රවණතාව දිගටම පැවතුනි. S&P SL 20 දර්ශකය 5.6% ක ඍණාත්මක ප්‍රතිලාභයක් වාර්තා කළ අතර ASPI වසර අවසාන වන විට 1% ක ආන්තික ධනාත්මක ප්‍රතිලාභයක් වාර්තා කළේය. තවද, වර්ෂය තුළ ශුද්ධ විදේශ ආයෝජන ගලා යෑමේ ප්‍රවාහය රු. මිලියන 11,717 ක් වන අතර එමඟින් ශ්‍රී ලාංකික කොටස් වෙළඳපොල කෙරෙහි විදේශ ආයෝජකයින්ගේ විශ්වාසය අඩු වී ඇති බව පෙන්නුම් කරයි.

රූප සටහන 1 - 2019 වසර තුළ දින 364 භාණ්ඩාගාර බිල්පත් අනුපාතයේ හැසිරීම



පදනම් ඒකක 250 කින් සතිපතා AWPR අඩු කිරීමේ අරමුණින් යුතුව ශ්‍රී ලංකා මහ බැංකුව, තැන්පතු සීමාවන් ඉවත් කර ණයදීමේ සීමාවක් හඳුන්වා දෙන ලදී. SDFR සහ SLFR පිළිවෙළින් 8% සිට 7% ටත්, 9% සිට 8% ටත් අඩු කිරීම පිණිස 2019 මැයි සහ අගෝස්තු මාසවලදී ශ්‍රී ලංකා මහ බැංකුව දෙවරක්ම පදනම් ඒකක 50 කින් ප්‍රතිපත්ති අනුපාත අඩු කරන ලදී.

මෙම ක්‍රියාමාර්ගයන් සමඟ, වසර මුලදී 10.99% ක්ව තිබුණු භාණ්ඩාගාර බිල්පත් අනුපාතය, වසර අවසානය වන විට පහත 1 රූපය මඟින් දැක්වෙන පරිදි පදනම් ඒකක 254 කින් 8.45% දක්වා අඩු විය. එම ප්‍රවණතාව අනුවම යමින්, වාණිජ බැංකුවලින් පිරිනැමූ ස්ථාවර තැන්පතු අනුපාත සහ රජයේ බැඳුම්කර අනුපාතයන් වසර පුරාම සාරානුකූලව අඩු වූ අතර එමඟින් වසර අවසන් භාගයේ ආයෝජන ආදායමට බලපෑම් ඇති විය.

1.1 ආයෝජන කළඹ

මණ්ඩලයේ මුළු ආයෝජන කළඹ 2018 වසර අවසන් වන විට තිබූ රු. මිලියන 290, 231 ක අගය 2019 වසර අවසන් වන විට රු. මිලියන 325, 958 දක්වා 12.3% කින් වැඩිව තිබූ අතර එය කණ්ඩායමක් ලෙස සිදු කරන ලද කාර්යභාරය මනාව පිළිබිඹු කරන ලදී. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, වසර අවසානයේදී රු.මි. 315,359 ක ශේෂයක් සහිතව ස්ථාවර ආදායම් සුරැකුම්පත්වල ආයෝජනය කරන ලදී. මෙය මුළු කළඹේ 96.7% කට සමාන ය. මෙය පෙර වසරේ වාර්තා වූ රු.මිලියන 279,780 ට සාපේක්ෂව 12.7% ක වර්ධනයකි. මෙම අංශයේ ප්‍රධාන දීර්ඝ කාලීන ආයෝජනය රාජ්‍ය බැඳුම්කර මත සිදු කළ අතර එය 2019 වසර අවසානයේදී රු.මිලියන 218,970 සිට රු.මිලියන 249,947 ක් දක්වා හෝ 14.2% කින් වර්ධනය විය. රාජ්‍ය බැඳුම්කර කළඹේ කල් පිරීම් පැතිකඩ පහත 1 වගුවේ දක්වා ඇත.

වගුව 1 - භාණ්ඩාගාර බැඳුම්කර කල් පිරීමේ විස්තරය

කල් පිරීමේ කාලය (වර්ෂය)	2019.12.31 දිනට පිරිවැය (රු.මි)	ප්‍රතිශතය
0 - 1	1,315	0.5%
1 - 5	118,990	47.6%
5 - 10	106,214	42.5%
10 <	23,428	9.4%
එකතුව	**249,947**	**100.0%**

2019 වසර තුළ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වර්ෂයකට 10.89% ක සාමාන්‍ය බර තැබූ සඵලතා අනුපාතිකයක් සමග රු.මිලියන 49,575 ක් රාජ්‍ය බැඳුම්කර තුළ ආයෝජනය කළේ ය. වසරකට හෝ ඊට වැඩි කාලයක ප්‍රති ආයෝජන මත සමස්ත බරතැබූ සාමාන්‍ය අනුපාතය වර්ෂයකට 11.84% ක් ලෙස පවත්වාගැනීමට හැකිවිය.

ශුද්ධ කොටස් කළඹේ වටිනාකම, 2018 වාර්තා වූ රු. මිලියන 10,450 හා සන්සන්දනාත්මකව ගත් විට 2019 වසරේදී රු. මිලියන 10,599 ක් ලෙස වාර්තා විය. 2019 වසරේ සමස්ත කළඹේ විස්තරය පහත රූප සටහන 2 තුළ දක්වා ඇත.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය 2019 වසරේදී, 2018 වසරේදී ලැබූ ලාභාංශ සහ ප්‍රාග්ධන ලාභ වන රු.මි 373 හා සන්සන්දනය කරන විට රු.මි. 494ක් ලබා 32.4% ක වර්ධනයක් වාර්තා කළේය. මණ්ඩලය විසින් කොළඹ කොටස් වෙළෙඳපොළේ සමාගම් 41ක් සඳහා ආයෝජනය කර ඇති අතර මණ්ඩලයට සාරානුකූල අඛණ්ඩ ලාභාංශ ආදායමක් තහවුරු කරමින් කළඹේ S&P SL 20 දර්ශකය නියෝජනය කරන සමාගම් කොටස්වල වටිනාකමෙන් 82% ක් නියෝජනයට ඇතුලත් වේ. වර්ෂය තුළ වෙළෙඳපොළ තුළ පැවති අවිනිශ්චිතතා සහ අවදානම් පැතිකඩ හේතුවෙන් ස්කන්ධ කළඹ මුළු කළඹෙන් 3.3%ක පමණ පවත්වා ගැණින. මණ්ඩලය, ප්‍රධාන බැංකු සහ ප්‍රාග්ධන භාණ්ඩ අංශයේ සමාගම් වැනි ආයෝජක ආකර්ෂණය වැඩි, ඉහළ වශයෙන් වෙළෙඳපොළ තුළ ප්‍රාග්ධනීකෘත සමාගම් තුළ ආයෝජනය කර ඇති බැවින් වෙළෙඳපොළ තුළ මිල වැඩිවීම ආරම්භ වන විට ප්‍රාග්ධන ලාභයන්ගේ උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට අපේක්ෂා කරයි. වාර්තාවේ අන් තැනකද සඳහන් කර ඇති පරිද්දෙන්, සමස්ත කොටස් මිල වල සැලකිය යුතු පහළ වැටීම සහ 2019 වසරේදී S&P SL 20 දර්ශකයේ 5.6% ඍණාත්මක ප්‍රතිලාභ හේතුවෙන් වසර තුළදී මණ්ඩලයට ප්‍රාග්ධන ලාභ ලබාගැනීම අඩාල විය. කෙසේ වෙතත්, සමස්ත ආයෝජන ආදායම 209 වසරේදී රු.මිලියන 31,623 ක් වූ අතර, එය රු.මිලියන 28,316 ක් වූ 2018 වසරට වඩා 11.7% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

රූප සටහන 2 - ආයෝජන කළඹේ සංයුතිය: 2019 වසර

31.12.2019 වන දිනට කලඹෙහි සංයුතිය



1.1 ආයෝජන ආදායම

මණ්ඩලය 2019 වසර තුළදී, 2018 වසරේ වාර්තා වූ රු.මි. 28,277 හා සන්සන්දනාත්මකව ගත් විට රු.මි.31, 528 ක ආයෝජන පොළී ආදායමක් උත්පාදනය කරගනිමින් 11.5% ක වර්ධනයක් වාර්තා කරන ලදී. පෙර වසරේදී ලැබූ රු.මිලියන 21,278 ට සාපේක්ෂව රාජ්‍ය බැඳුම්කරවලින් පමණක් 2019 වසරේදී රු. මිලියන 23,839 ක් උත්පාදනය කරමින් 12% ක වර්ධනයක් වාර්තා කරන ලදී.

2. මෙහෙයුම් පරිසරය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ වසර 38ක ඉතිහාසය තුළ පළමු වරට රන් සම්මාන දෙකක් ලබාගැනීමට සමත් විය. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ රාජ්‍ය අංශය වන රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරිවරුන්ගේ සංගමය විසින් BMICH හිදී සංවිධානය කළ හොඳම වාර්ෂික වාර්තා සම්මාන තරගාවලියේ රාජ්‍ය අංශය සඳහා මෙම සම්මාන ලැබිණි.



රාජ්‍ය අංශයේ ආයතනවල වාර්ෂික වාර්තාකරණය සහ ආයතනික අනාවරණය කිරීම් යන ක්ෂේත්‍රවල විනිවිදභාවය, වගවීම, සමාජ වගකීම සහ ආයතනික පාලනය පිළිබඳ ඉහළම ප්‍රමිතීන් අනුගතවීම සඳහා මෙම සම්මාන ප්‍රදානය රටේ වඩාත්ම කීර්තිමත් වේදිකාවක් ලෙස සැලකිය හැකිය.

ව්‍යවස්ථාපිත මණ්ඩල, අධිකාරී සහ කොමිෂන් සභා කාණ්ඩයේ ජයග්‍රාහකයා ලෙස මණ්ඩලය විසින් රන් සම්මාන ලබා ගත් අතර විශ්ව විද්‍යාල, බලකා, දෙපාර්තමේන්තු, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, මහ නගර සභා, ප්‍රාදේශීය සභා, ව්‍යවස්ථාපිත මණ්ඩල, අධිකාරී සහ කොමිෂන් සභා ඇතුළු තරඟකාරී රාජ්‍ය ආයතන 64 අතර "සම්මාන උළෙලේ සමස්ත ජයග්‍රාහකයා" යන සම්මානයෙන් පිදුම් ලැබීය.

2.1 දායක මුදල් රැස්කිරීම් හා සේවායෝජක සබඳතා

2019 දී සේවා යෝජකයින් විසින් ඔවුන්ගේ සේවකයින් වෙනුවෙන් ගෙවන ලද මුළු දායක මුදල රු. බිලියන 27.5 ක් වන අතර එය පසුගිය වසරට සාපේක්ෂව රු. බිලියන 2.2 ක වැඩි වීමකි. පසුගිය වසර අවසානයේදී සාමාජිකයින්ගේ අරමුදලේ මුළු වටිනාකම රු. බිලියන 306ක් වූ අතර එය සමාලෝචිත වර්ෂයේදී රු. බිලියන 339 ක් දක්වා වැඩි වී තිබිණි.

පසුගිය වසර හා සසඳන විට ප්‍රාදේශීය කාර්යාල 19 ක් හරහා දිවයින පුරා සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි සිදු කරන ලද පරීක්ෂණවල ප්‍රතිඵලයක් ලෙස සේවා යෝජකයින්ගේ සංඛ්‍යාව 82,375 දක්වා ඉහළ ගොස් තිබේ. මෙහෙයුම් කටයුතුවල සාර්ථකත්වය සහ ප්‍රාදේශීය කාර්යාලවල අධීක්ෂණ කටයුතු සඳහා ආයතනයේ තොරතුරු තාක්ෂණ ජාලය මනා රුකුලක් විය.

කොමර්ෂල් බැංකුව, ලංකා බැංකුව, මහජන බැංකුව, සම්පත් බැංකුව, හැටන් නැෂනල් බැංකුව සහ ජාතික සංවර්ධන බැංකුව වැනි බැංකු රාශියක් හරහා දායක මුදල් ගෙවීම සහ සාමාජික තොරතුරු මාර්ගගතව අන්තර්ජාල බැංකු හරහා සම්ප්‍රේෂණය කිරීම සම්බන්ධ කටයුතු සාර්ථකව ක්‍රියාත්මක කරන ලද අතර ඒ ආකාරයෙන් එකතු කරන ලද මුදල, මුළු දායක මුදලෙන් 50% ඉක්මවා ගොස් තිබිණි. තවද, 2019 වර්ෂය තුළදී එහි සමස්ත අනුකූලතා ගෙවීම් අනුපාතය 74% ක මට්ටමක පවත්වා ගැනීමට ආයතනයට හැකි විය. ප්‍රාදේශීය කාර්යාල ජාලය හරහා නිතිපතා පවත්වනු ලබන දැනුවත් කිරීමේ වැඩසටහන් මෙම වාසිදායක තත්ත්වය පවත්වා ගැනීම සඳහා බෙහෙවින් ප්‍රයෝජනවත් විය.

2.2 සාමාජික සේවා

සාමාජිකයන්ට ගෙවිය යුතු මුදල් නැවත ලබාදීම සහ සුබසාධන ප්‍රතිලාභ

වර්ෂය තුළ මුදල් ආපසු ගෙවීමේ හිමිකම් ඉල්ලුම්පත් 196,382 ක කටයුතු නිමකිරීමට හැකිවූ අතර, ඒ සඳහා රු. බිලියන 19.7 ක් ගෙවා ඇත. ඊට සාපේක්ෂව 2018 වසරේ හිමිකම් ඉල්ලුම්පත් 183,688 ක් සඳහා රු. බිලියන 18.3ක් ගෙවීමට හැකිවී ඇත. සමාලෝචනයට භාජනය වූ කාල සීමාව තුළ, එක් හිමිකම් පෑමක් සඳහා 2018 දී ගෙවන සාමාන්‍ය මුදල රු. 99,581 ක් වූ අතර 2019 වසරේදී එය රු. 100,202 දක්වා වැඩිවීමක් පෙන්නුම් කරයි. සේවා

නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සිය සුවිශේෂී කඩිනම් හිමිකම් ඉල්ලීමේ ක්‍රියාවලිය අඛණ්ඩව ක්‍රියාත්මක කරන අතර එමගින් එය රටේ වඩාත්ම කාර්යක්ෂම රාජ්‍ය ආයතනයක් බවට පත් කර ඇත. සාමාජික අරමුදල් ශේෂය සඳහා පොලී සහ ලාභාංශ ගෙවීම් වලට අමතරව, සාමාජිකයන් සහ පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය සහ අ.පො.ස.(උ.පෙ) විභාගය සමත් වන ඔවුන්ගේ දරුවන්ට මූල්‍ය සහය ලබා දෙන සුබසාධන ප්‍රතිලාභ ක්‍රම 08 ක් ක්‍රියාත්මක කරයි. ඒ අනුව 2019 වර්ෂය තුළ ප්‍රතිලාභ හිමිකම් 14,254 ක් සැකසීමෙන් පසු රු.මිලියන 728 ක් ගෙවා ඇත. විවිධ සුභසාධන ප්‍රතිලාභ යෝජනා ක්‍රම යටතේ 2019 වර්ෂය තුළ ගෙවීම් බෙදා හැරීම පහත දැක්වේ. සාමාන්‍යයෙන්, මෙම සුභ සාධන ප්‍රතිලාභ යෝජනා ක්‍රම අපගේ බොහෝ සාමාජිකයින්ගේ ජීවන තත්ත්වය විවිධ ආකාරවලින් ඉහළ නැංවීමට උපකාරීවී තිබේ.

මෙම ක්ෂේත්‍රය පිළිබඳ මනා දැනුමක් ඇති පිරිස්ගෙන් සමන්විත ශ්‍රම බලකායක් සිටීම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව මානව සම්පත් ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන පසුගිය වසර තුළ දියත් කරන ලදී. මෙම වැඩසටහන සම්පූර්ණ වූ පසුව එයට අදාළ අවසන් වාර්තාව 2019 වර්ෂය තුළ නිකුත් කරන ලදී. ක්ෂේත්‍ර අධ්‍යයනයකින් අනතුරුව මෙම වාර්තාව සම්පාදනය කරන ලද්දේ වැඩ ප්‍රමාණය තක්සේරු කිරීම, රැකියා විස්තරය නිර්මාණය කිරීම, මානව සම්පත් සංවර්ධන සැලැස්ම, කාර්ය සාධන ඇගයීම සහ සේවක සංවර්ධනය ඇතුළු ප්‍රධාන අංශ පහක් ආවරණය කරමිනි.

ප්‍රසන්න සේවා පරිසරය සහ මණ්ඩලයේ වරප්‍රසාද සමඟින් කාර්ය මණ්ඩලයේ පිරිවැටුම අවම කර ඵලදායිතාව උපරිම කිරීමට කටයුතු කරන ලදී.

ප්‍රතිලාභ යෝජනා ක්‍රම



සාමාජික ගිණුම් පවත්වා ගැනීම

වර්ෂය අවසාන වන විට අරමුදල සමඟ ඇති මුළු ක්‍රියාකාරී හා අක්‍රීය ගිණුම් සංඛ්‍යාව දළ වශයෙන් මිලියන 15.3 ක් වූ අතර, එම සාමාජික ගිණුම් වලින් 96% ක් 2019 වසර අවසන් වන විට යාවත්කාලීන කර ඇත. මෙම සාමාජික ගිණුම් වලින් ගිණුම් මිලියන 12.7 ක් අක්‍රිය බව වාර්තා වී ඇති අතර සාමාජික ගිණුම් මිලියන 2.6 ක් සක්‍රීයව පවතී. සමාලෝචනය කරන ලද වර්ෂය තුළ, සක්‍රීය ගිණුම් සඳහා වාර්ෂික සාමාජික ප්‍රකාශන අදාළ සේවා යෝජකයන්ට නිකුත් කර ඇත.

2.3 මානව සම්පත් සංවර්ධනය

සේවකයන් 1,110 කින් සමන්විත මණ්ඩලයේ මානව සම්පත ආයතනයේ සුවිශේෂී වත්කමක් ලෙස කැපී පෙනේ. ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම සමාජ ආරක්ෂණ අරමුදල ලෙස මණ්ඩලයේ ප්‍රධාන වගකීම වන්නේ එහි සාමාජිකයින්ට උසස් තත්ත්වයේ හා කාර්යක්ෂම සේවාවක් සැපයීමයි. මෙම පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා, කාර්ය මණ්ඩලයේ දැනුම හා කුසලතා වැඩිදියුණු කිරීමේ පරමාර්ථය ඇතිව, ඔහුගේ හෝ ඇයගේ අදාළ විෂය ක්ෂේත්‍රයට හෝ වෘත්තියට අනුව අවශ්‍ය පුහුණු පාඨමාලා හැදෑරීම සඳහා මූල්‍ය ආධාර ලබා දෙනු ලැබේ. මෙම යෝජනා ක්‍රමය යටතේ, රු. 400,000 ක උපරිම සීමාවක් සහිතව පාඨමාලා ගාස්තු වලින් 75% ක ප්‍රතිපූරණය කරනු ලැබේ. විශ්ව විද්‍යාලවල හෝ පිළිගත් උසස් අධ්‍යාපන ආයතනවල මෙම අධ්‍යයන පාඨමාලා හැදෑරීමට අවස්ථාව ලබා දී ඇත. 2019 වර්ෂය තුළ එවැනි අධ්‍යයන පාඨමාලා 34 ක් හැදෑරීමට අනුමැතිය ලබා දී ඇති අතර රු. මිලියන 2.2 ක් පාඨමාලා ගාස්තු ලෙස ප්‍රතිපූරණය කර ඇත.

2019 වර්ෂය තුළ කාර්ය මණ්ඩලයේ කුසලතා ඉහළ නැංවීම සඳහා අදාළ විෂය ක්ෂේත්‍ර ආවරණය වන පරිදි පුහුණු වැඩසටහන් 55 කට ආසන්න ප්‍රමාණයක් සංවිධානය කරන ලද අතර දළ වශයෙන් රු. මිලියන 1.4 ක් ඒ සඳහා වැය කර ඇත. තවද, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා වෙනත් ආයතන සමඟ සම්බන්ධව අනුග්‍රහය දක්වන විදේශීය පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් 30 දෙනෙකුට සහභාගී වීමට අවස්ථාව ලබා දෙන ලදී.

මේ ආකාරයට, එවැනි අධ්‍යයන පාඨමාලා සහ පුහුණු වැඩසටහන් තුළින් සේවකයින්ගේ දැනුම, කුසලතා සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පියවර ගනු ලබන අතර අපගේ සාමාජිකයින්ට සහ අනෙකුත් පාර්ශවකරුවන්ට ඉහළ මට්ටමේ සේවාවක් ලබා දීමට ඔවුන් බල ගැන්වේ.

2.4 තොරතුරු තාක්ෂණය

සේවා නියුක්තයන්ගේ භාර අරමුල් මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ මෙහෙයුම් පද්ධතිය පිළිබඳ නවීකරණ ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) තාක්ෂණික හා මූල්‍යමය සහාය ඇතිව ආරම්භ කරන ලද අතර 2019 වසර අවසන් වන විට ව්‍යාපාර ක්‍රියාවලී අධ්‍යයනය ඇතුළත් වන, පළමු අදියර සාර්ථකව සම්පූර්ණ කරන ලදී. ඒ අතර පද්ධති විශ්ලේෂණය සහ මෘදුකාංග සංවර්ධනය ඇතුළත් වන දෙවන අදියර සමාලෝචිත වසර අවසානයේදී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.

ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය සමඟ ඒකාබද්ධව නව තාක්ෂණය හඳුන්වා දෙමින්, පවතින ව්‍යාපාර ක්‍රියාවලිය ප්‍රති -ඉංජිනේරුකරණය කිරීමේ අරමුණින් ආරම්භ කළ ETFB ICTA ව්‍යාපෘතිය, වර්තමානයේ මණ්ඩලය සම්බන්ධව සිටින ප්‍රධානතම ව්‍යාපෘතිය වේ. දැනට මෙම ව්‍යාපෘතිය මෘදුකාංග සංවර්ධන අවධියේ සිටින අතර එය දත්ත සංක්‍රමණ අදියරට සමාන්තරව ක්‍රියාත්මක වේ.

බාහිර තොරතුරු තාක්ෂණ උපදේශන සමාගමක් සමඟ ඒකාබද්ධව, පවත්නා අභ්‍යන්තර ව්‍යාපාර හා තාක්ෂණික සම්පත් වල මග පෙන්වීම මත අපි ව්‍යාපාර ක්‍රියාවලි වැඩිදියුණු කිරීමේ අධ්‍යයනයක් සිදු කර ඇති අතර, අනාගතයේදී මණ්ඩලීය ව්‍යාපාර ක්‍රියාවලිය ඩිජිටල්කරණය සඳහා එකතු කරන ලද අති නවීන තාක්ෂණික අංග කිහිපයක් සමඟ පුළුල් ව්‍යාපාර ක්‍රියාවලි වැඩිදියුණු කිරීමේ වාර්තා සම්පූර්ණ කර ඇත්තෙමු.

ඉදිරි ගමන

අතිගරු ජනාධිපතිතුමාගේ චින්තනයට සමගාමීව 2020 ජනවාරි මස දී සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය ප්‍රතිව්‍යුහගත කරන ලද අතර, මෙම ආයතනය තවදුරටත් පරිවර්තනය කිරීමේ දැක්මක් සහිතව ජනාධිපතිතුමා විසින් නිසි හැකියාවෙන් පිරි වෘත්තිකයන් සහ ස්වාධීන මතදාරීන් පත් කරනු ලැබ ඇත. සාමාජිකත්වය සඳහා සිය සේවා කාර්යක්ෂමතාව වේගයෙන් වැඩිදියුණු කිරීම, සිදුකරන ලද සියලුම ආයෝජනවල විනිවිදභාවය සහ වගවීම වැඩිදියුණු කිරීම, නුදුරු අනාගතයේ දී නව මෙහෙවර පියස ගොඩනැගිල්ල වෙත ගොස් එහි භෞතික යටිතල පහසුකම් නවීකරණය කිරීම සහ එහි මෙහෙයුම් වලදී තාක්ෂණය තවදුරටත් භාවිතා කිරීම පිළිබඳව මණ්ඩලය දැන් අවධානය යොමු කරයි. මණ්ඩලය මෑතකදී සිය ඉහළ කළමනාකාරිත්වය ශක්තිමත් කර ඇති අතර හොඳම වෘත්තීය කුසලතා රාජ්‍ය අංශයේ පළපුරුද්ද සමඟ මුසු කිරීමට උත්සාහ කරමින් සිටින අතර, නව සභාපති හා නායකත්ව කණ්ඩායම අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ සමීපව කටයුතු කරමින් ඉදිරි ගමනේ මීළඟ අදියර දියත් කිරීමට යුහුසුළුව කටයුතු කරමින් සිටී.



ශ්‍රියාන් ද සිල්වා විජයරත්න
සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී

පාලන වාර්තාව

පරිපාලනය ප්‍රධාන ප්‍රමුඛතාවයක් ලෙස සලකන අර්ධ රාජ්‍ය සංවිධානයක් වන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, සාමාජිකයින්ගේ ප්‍රතිලාභ ඉහළ නැංවීමේ අරමුණින් වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය නංවාලීම සඳහා කැපවී සිටී. සියළුම ව්‍යාපාරික මෙහෙයුම් හරහා ව්‍යවස්ථාපිත හා නියාමන අවශ්‍යතා පිළිපැදීමට මණ්ඩලය බැඳී සිටී. විනිවිදභාවය, විශ්වසනීයත්වය සහ අනුකූලතාවය යනු එහි පාලන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මණ්ඩලය යොමු කරන මූලධර්ම මාර්ගෝපදේශ වේ. මෙම වාර්තාව මූලික වශයෙන් අවධාරණය කරනුයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම සහ ආයතනික පාලනයේ ඉහළම ප්‍රමිතීන් පවත්වාගෙන යාමේ වගකීමයි.

ආයතනික පාලනයේ කාර්ය රාමුව



ආයතනික පාලනය පිළිබඳ විස්තරය

පාලන ප්‍රතිපත්ති		2019 වසර පිළිබඳ අර්තකථනය
1.	**අධ්‍යක්ෂ මණ්ඩලය**	
1.1.	මණ්ඩලය	රජය සහ එහි පාර්ශවකරුවන් වෙනුවෙන් අරමුදලේ භාරකාරත්වය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට ව්‍යවස්ථාපිත වගකීමක් ඇත.
1.1.1.	මණ්ඩලයට පත් කිරීම	මණ්ඩලය පහත සාමාජිකයින් නව දෙනාගෙන් සමන්විත වේ. • සාමාජිකයින් සිව් දෙනෙකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලබයි • මූල්‍ය විෂයය භාර අමාත්‍යවරයා විසින් එක් සාමාජිකයෙකු නම් කරනු ලබයි • වෙළෙඳ විෂය භාර අමාත්‍යවරයා විසින් එක් සාමාජිකයෙකු නම් කරනු ලබයි • ලංකා හාම්පුතුන්ගේ සම්මේලනය විසින් එක් සාමාජිකයෙකු නම් කරනු ලබයි • 100,000 කට වැඩි සාමාජිකයින් සහිත සෑම වෘත්තීය සමිතියකම විධායකය සමඟ සාකච්ඡා කර අමාත්‍යවරයා විසින් සාමාජිකයින් දෙදෙනෙකු පත් කරනු ලබයි
1.1.2.	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම	මණ්ඩලය සාමාන්‍යයෙන් මාසයක විරාම කාලයකදී සහ අවශ්‍ය වූ විට රැස්වේ. මෙම වසර තුළ මණ්ඩලය වැකොළොස් (11) වරක් රැස් විය. මණ්ඩල රැස්වීම්වල ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා මණ්ඩල රැස්වීම් වලට පෙර වැඩකරන දින තුනකට නොඅඩු කාලයකට පෙර මණ්ඩල පත්‍රිකා බෙදා හරිනු ලැබේ. 2019 රැස්වුණු මණ්ඩල රැස්වීම්වල පැමිණීම පහත පරිදි වේ. 
1.1.3.	මණ්ඩලයේ වගකීම්	අධ්‍යක්ෂ මණ්ඩලය පොදු ජනතාව සතු සම්පත්වල භාරකරුවකු ලෙස තමන් වෙත බලය පවරනු ලැබ ඇති අයිතිවාසිකම් හා වගකීම් අවංකව හා සද්භාවයෙන් යුතුව ඉටුකළ යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලය සිය භාරදූර වගකීම් පිළිබඳව සෑම විටම සවිඥානිකව කටයුතු කළ යුතු වන්නේ ඔවුන් විසින් නිසි සැලසුමකින් තොරව ගනු ලබන තීරණ හා ඉටුකරනු ලබන ක්‍රියා හේතුවෙන් උද්ගතවන ප්‍රතිඵලය අවසානයේදී දැරීමට සිදුවන්නේ පොදු මහජනතාවට වන හෙයිනි. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී විමසුමට භාජනය විය යුතු කරුණු හා ගැටලු • ප්‍රතිපත්ති සම්පාදනය • අරමුදලේ කාර්ය සාධනය අධීක්ෂණය කිරීම හා ඇගයීම • පරිපාලිත/ ආශ්‍රිත සමාගම්වල හා වෙනත් ආයෝජනවල කාර්යසාධනය අධීක්ෂණය සහ ඇගයීම • වාර්ෂික කාර්ය සාධන සමාලෝචනය • කාරක ප්‍රාග්ධනය • කාර්තුමය, අර්ධ වාර්ෂික හා වාර්ෂික කාර්ය සාධන වාර්තා • මණ්ඩල පත්‍රිකා

1.1.4.	මණ්ඩලීය ලේකම්	නියමිත කාර්ය පරිපාටි, අණපනත් හා වෙනත් අදාළ නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූලතාව දැක්වීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් දීම සහ මණ්ඩලය වෙත කලට වේලාවට විශ්වාසදායක සහ අදාළ වන්නා වූ තොරතුරු සැපයීම අරබයා මණ්ඩලයට වගකිව යුතු වෘත්තීය වශයෙන් සුදුසුකම්ලත් ආයතනික ලේකම්වරයෙකුගේ උපදෙස් හා සේවා සලසා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම සාමාජිකයන් හට ඉඩ ප්‍රස්ථාව ඇත. ලේකම්, අධ්‍යක්ෂ මණ්ඩල කාර්ය පරිපාටි නිසි අයුරින් අනුගමනය කෙරෙන බවට වගබලා ගන්නා අතර කලට වේලාවට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා බෙදා හැරීම ඇතුළු මණ්ඩලයේ ඵලදායී ක්‍රියාකාරිත්වය පිළිබඳවද වග බලා ගතයුතුය.
1.1.5.	මණ්ඩලීය ලේකම්ගේ භූමිකාව	මණ්ඩලීය ලේකම්, අධ්‍යක්ෂ මණ්ඩල කාර්ය පරිපාටි නිසි අයුරින් අනුගමනය කෙරෙන බවට වගබලා ගත යුතු අතර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කටයුතු හා සම්බන්ධ නෛතික නියමයන් පිළිබඳ මාර්ගෝපදේශ ලබාදිය යුතු ය. ඊට අමතර වශයෙන්, පහත සඳහන් කටයුතු ද ලේකම්වරයාගේ කාර්යභාරයෙහිලා ගැනේ - • අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පිළිබඳ දැනුම්දීම්, රැස්වීම් වාර්තා හා මණ්ඩල පත්‍රිකා අනෙකුත් අදාළ ලිපිලේඛන සමග දන්වා යැවීමට සැලැස්වීම • අධ්‍යක්ෂ මණ්ඩල තීරණ සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු ඉටු කිරීම • අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට අවශ්‍ය අභ්‍යන්තර හා බාහිර තොරතුරු සපයාදීමෙන් ඔවුන්ට සහය සැලසීම
1.1.6.	අධ්‍යක්ෂ මණ්ඩලයේ සමබරතාව	අධ්‍යක්ෂවරු විවිධ ක්ෂේත්‍රවල (මූල්‍ය, වෙළඳ, හාම්පුතුන්ගේ සම්මේලනය, වෘත්තීය සමිති යනාදිය) නිරතව සිට පැමිණෙන්නන් වෙති. ඔවුහු අධ්‍යක්ෂ මණ්ඩලයට සමතුලිත වේදිකාවක් සපයති. ඔවුහු එක් එක් කරුණු සම්බන්ධයෙන් ස්වාධීන මතයක් පළ කරනු ලබති.
1.1.7.	ඵලදායී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් සඳහා ප්‍රමාණවත් කාල වෙලාව	සාමාන්‍යයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය මාසික කාල විරාමයක් සහිතව රැස්වේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් සඳහා වැයවන සාමාන්‍ය කාලය පැය 03 ක් පමණ වෙයි.
1.2.	**සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී**	
1.2.1.	සභාපතිවරයා පත්කිරීම	සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරීවරයා ද වන අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන්නේ ය.
1.2.2.	සභාපතිවරයාගේ වගකීම්	සමස්ත ආයතනික පාලන තන්ත්‍ර ව්‍යුහයේ වැදගත්ම පුරුක වන සභාපතිවරයා / ප්‍රධාන විධායක නිලධාරීවරයා ස්වකීය සේවා කණ්ඩායම සහ ආයතනය නිවැරදි දිශානතියක් වෙත මෙහෙයවීම සඳහා නායකත්වය ගෙන ක්‍රියා කරයි. කලින් නිශ්චය කරනු ලැබූ ඉලක්ක මුදුන් පමුණුවා ගැනීම පිණිස ප්‍රධාන කර්තව්‍යයන්ට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහාත්, සැලසුම් හා වැඩ සටහන් සැකසීම සඳහාත් ඔහු වගකිව යුත් වන්නේ ය.
2.	**වගවීම සහ විගණනය**	
2.1.	**මූල්‍ය වාර්තාකරණය**	මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රකාරව පිළියෙල කර ගිණුම්කරණ සහ විගණන ප්‍රමිත අධීක්ෂණ මණ්ඩල පනතට අනුකූලව ඉදිරිපත් කරනු ලැබ ඇත.
2.1.1.	ව්‍යවස්ථාමය හා නියාමන වාර්තාකරණය	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වැනි වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ විගණකවරයා වන්නේ විගණකාධිපතිවරයාය.
2.1.2.	මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් විගණක වරයාගේ වගකීම	විගණකාධිපතිවරයාගේ වාර්තාව බලන්න (පිටු අංක 99)
2.1.3.	වාර්ෂික වාර්තාවෙහි අන්තර්ගත අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව	අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය බලන්න (පිටු අංක 36)
2.1.4.	මූල්‍ය ප්‍රකාශ හා සම්බන්ධ අධ්‍යක්ෂ වරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශය	අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය බලන්න (පිටු අංක 36)
2.1.5.	කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය	කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය බලන්න(පිටු අංක 36)
2.2.	**අභ්‍යන්තර පාලනය**	
2.2.1.	අභ්‍යන්තර විගණන කාර්යය	සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට තමන් සතු අභ්‍යන්තර විගණන අංශයක් ඇත.
2.2.2.	අභ්‍යන්තර පාලනයේ ඵලදායිතාව පිළිබඳ විගණන කමිටු සමාලෝචනය	අභ්‍යන්තර විගණන අංශය අරමුදල් මණ්ඩලයේ අභ්‍යන්තර පාලන පද්ධතියේ ඵලදායීතාව පිළිබඳව විගණන කමිටුව වෙත නිරන්තරව වාර්තා කරයි.

අනු කමිටු

ආයතනික පාලනයේ පුර්ව අවශ්‍යතාවයන්ට අනුව කටයුතු කිරීම පිණිස ඇතැම් නියමයන් හා අනුගතව ක්‍රියාකිරීමට මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණය බැඳී සිටී. එහිලා අනු කමිටු ස්ථාපනය කිරීම ප්‍රධාන ප්‍රමුඛතාවක් වන්නේ ය. ව්‍යාපාරික මෙහෙයුම් කටයුතුවල ඵලදායී ක්‍රියාකාරිත්වය තක්සේරු කිරීම සඳහා මෙම කමිටු මණ්ඩලයට සහය වන අතර ආයතනය පුරා දිවෙන සියලු ක්‍රියාදාමයන් පිළිබඳව සවිමත් තීරණවලට එළඹීමට ද එම කමිටු වග බලා ගනිති. මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් සැලකිය යුතු බලපෑමක් ඇති කරන ගැටලු නිරාකරණය කිරීම පිණිස අදාළ ප්‍රවීණත්වයකින් හෙබි වෘත්තිකයන් ගෙන් මෙම කමිටු සමන්විත විය යුතු වන්නේ ය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිහිටුවා ඇති ඇතැම් ප්‍රධාන කමිටු සමහරක් පහත දක්වා ඇත.

1. විගණන කමිටුව

මෙම කමිටුව යටත් පිරිසෙයින් විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකුගෙන් වත් සමන්විත විය යුතු වන අතර භාණ්ඩාගාර නියෝජිතවරයා හෝ මූල්‍ය කළමනාකරණය පිළිබඳ ප්‍රමාණවත් නිපුණතාවක් ඇති තැනැත්තෙකු විසින් එහි සභාපතිත්වය දරනු ලැබිය යුතු ය. මෙම කමිටුව අඛණ්ඩ පදනමක් මත අන්තර් ක්‍රියාකාරිව කටයුතු කරමින් යටත් පිරිසෙයින් තුන් මසකට එක් වතාවක්වත් රැස්විය යුතු අතර ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා රැස්වීම් කැඳවුම්කරු ලෙස ක්‍රියා කළ යුතුය.

විගණන කමිටුවේ විෂය පථය

- අභ්‍යන්තර විගණනයේ වගකීම් නිශ්චය කිරීම සහ වාර්ෂික විගණන සැලැස්ම ඇගයීම
- ආයතනයේ සියළුම ක්‍රියාකාරකම් සම්බන්ධව අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ ඇගයීම
- පිරිවැය ඵලදායී ලෙස කළමනාකරණය උදෙසා සහ අධික අමතර වියදම් වැනි දෑ වැළැක්වීම සඳහා නිශ්චිත කාල පරාස තුළ ප්‍රගතිය සමාලෝචනය කිරීම
- බාහිර විගණක සමග සහයෝගීතාවයෙන් කටයුතු කිරීම සහ විගණකාධිපතිවරයාගේ කළමනාකරණ ලිපි සම්බන්ධයෙන් අවධානය යොමුකර සුදුසු පියවර ගැනීමට මඟ පෙන්වීම
- ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන්ට නීති රෙගුලාසි හා චක්‍රලේඛ වලට අනුකූලවීම පිළිබඳව සොයා බැලීම
- මූල්‍ය ප්‍රකාශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලවීම පිළිබඳව සමාලෝචනය කිරීම
- අභ්‍යන්තර විගණන සහ බාහිර විගණන වාර්තා, කළමනාකරණ ලිපි සුදුසු පියවර ගැනීම සඳහා සමාලෝචනය කිරීම
- රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ අනු කමිටුවේ නිර්දේශ /විධාන ක්‍රියාමාර්ග පිළිබඳව සමාලෝචනය කිරීම
- වාර්ෂික වාර්තාවට ඇතුළත් කිරීම සඳහා විගණන කමිටු වාර්තා පිළියෙළ කිරීම

විගණන කමිටුවේ සංයුතිය

- **පී.බී.එස්.සී නෝනිස් මයා**
  විගණන කමිටුවේ සභාපති/අධ්‍යක්ෂ
  අධ්‍යක්ෂ
  මුදල් අමාත්‍යවරයා විසින් පත් කරන ලද
- **එම්. ඒ. තාජුඩීන් මයා**
  අතිරේක ලේකම්/අධ්‍යක්ෂ
  වෙළෙඳ අමාත්‍යාංශයේ නියෝජිත
- **පී. රණවකආරච්චි මහතා**
  අධ්‍යක්ෂ
  වෘත්තීය සමිති නියෝජිත
- **අතිරේක සාමාන්‍යාධිකාරී**
- **සියලුම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරු සහ සහකාර සාමාන්‍යාධිකාරිවරු**

2. කළමනාකරණ කමිටුව

සේවා නියුක්තයින්ගේ අරමුදල් මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු කළමනාකරණය කිරීමේ වගකීම සභාපතිවරයාගේ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ පාලනය යටතට පැවරී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලබන තීරණ ඵලදායී ලෙස ක්‍රියාවට නැංවීමේ වගකීම ඔවුහු දරති. සභාපතිවරයා හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම මනා විමසුම් සහගත තීරණවලට එළඹීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත තොරතුරු හා කරුණු පැහැදිලි කිරීම් ලබා දෙයි. ඔවුහු මණ්ඩලයේ ඉලක්ක හා අරමුණු මුදුන් පමුණුවා ගැනීමට කටයුතු කරන අතරම එහි කාර්යක්ෂම කළමනාකරණය උදෙසා වූ සැලසුම්, අයවැය ලේඛන, පිළිගත් පද්ධති, ක්‍රියාපටිපාටි හා පාලන විධි සැකසීමෙහිද නිරතව සිටිති.

එබැවින්, සේවා නියුක්තයින්ගේ අරමුදල් මණ්ඩලයේ වාරමය ප්‍රගති පිරික්සුමෙහි ප්‍රධාන කොටසක් ලෙස කළමනාකරණ කමිටුව හැඳින්විය හැකිය. කමිටුවේ විශේෂ අවධානය යොමුවන කරුණු පහත දැක්වේ: -

- මේ දක්වා ක්‍රියාත්මක කර නොමැති මීට පෙර රැස්වීම්වලදී ගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩල තීරණ.
- කාර්ය සාධන ක්‍රියාදාමයෙහි ඇතිවන පරතර හඳුනා ගැනීම සහ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග හඳුනා ගැනීම.
- ඉදිරි කාර්තු සඳහා වන මුදල් ප්‍රවාහයේ ආකාරය හා ඉලක්ක ගත අවශ්‍යතා ඇගයීම.
- ණය සහ මුදල් කළමනාකරණය.
- හදිසි මිලදී ගැනීම් වළක්වනු පිණිස ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි ප්‍රමාදවීම් ඇත්නම් ඒවා පිළිබඳව පසු විපරම් ක්‍රියාමාර්ග ගැනීම.
- සේවක අර්ථ සාධක අරමුදල, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල හා බදු යනාදිය ආශ්‍රිත ගෙවීම් නියමිත පරිදි සිදුවන බවට වගබලා ගැනීම.
- මණ්ඩලයේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය පහසුවනු පිණිස යුක්ති සහගත හේතු මත අවශ්‍ය උසස් තාක්ෂණ ක්‍රමවේද සලසා ගැනීම
- විවිධ මාධ්‍ය ඔස්සේ පළවන පැමිණිලි ඇතුළුව ගනුදෙනුකරුවන්ගේ තෘප්තිමත්භාවය/ අතෘප්තිමත්භාවය පිළිබඳ පසුවිපරම් කටයුතු කරමින් ඒවා වැඩි දියුණු කිරීම/නිවැරදි කිරීම සඳහා ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම
- සංශෝධිත ආයතනික සැලැස්ම තුළ ඇතුළත් කළ යුතු යම් නව යෝජනා වේ නම් ඒවා ඉදිරිපත් කිරීම.
- පරිපාලනමය හා ආයතනික කාර්යයන්ට අදාළ සියලු කටයුතු.
- මෙහෙයුම් කාර්යයන් අළලා එදිනෙදා උද්ගත වන වෙනත් යම් ගැටලු.

3. ආයෝජන කමිටුව

ආයෝජන අනුසාරයෙන් අරමුදලට අයත් මුදල් යෙදවීම පිළිබඳව මණ්ඩලයේ මූලික පරමාර්ථය වනුයේ, එම මුදල් බලය ලත් ආයෝජනවල ප්‍රශස්ත ලෙස යොදා ගැනීම මගින් ආයෝජ සුරක්ෂිත භාවය රැකගනිමින් තම මුල්‍ය බැඳීම් ප්‍රතිපූර්ණය සඳහා ද්‍රවශීලතාව කළමනාකරණය කරන අතරතුර උපරිම ආයෝජන ප්‍රතිලාභ සලසා දීමට කටයුතු කිරීමයි. ඒ අනුව, ආයෝජන කමිටුව පහත සඳහන් අරමුණු තුන සාක්ෂාත් කර ගැනීමට ප්‍රයත්න දරයි.

- **ආරක්ෂාව**

විශ්වාසදායී ආයෝජන ඉඩ ප්‍රස්ථා සලසා ගැනීම මණ්ඩලයේ ප්‍රධාන පරමාර්ථයකි. මෙම අවශ්‍යතාව සපුරා ගැනීම පිණිස මණ්ඩලය ස්වකීය ආයෝජන කළඹෙන් සැලකිය යුතු ප්‍රමාණයක් අතිශය සුරක්ෂිත රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීමට කටයුතු කරයි.

- **ද්‍රවශීලතාව**

විශ්වාසවන්ත ලෙස ඉදිරියේදී අපේක්ෂා කල හැකි සියලු මෙහෙයුම් කටයුතුවල අවශ්‍යතාව සපුරා ගැනීම මණ්ඩලයට පහසු කරනු පිණිස මණ්ඩලයේ ආයෝජන කාර්ය භාරය මුදල් කළ හැකි ප්‍රමාණවත් ද්‍රවශීලතා මට්ටමකින් පැවතිය යුතුය.

- **ආයෝජන මත ප්‍රතිලාභ**

බලයලත් ආයෝජන විධික්‍රම උපයෝගී කර ගනිමින් ඉහළම ප්‍රතිලාභ අත්කර ගැනීම සඳහා ආයෝජන කළඹ සැලසුම් කළ යුතුය.

ආයෝජන කමිටුව සාමාජිකයන් හය දනෙකුගෙන් සමන්විත වේ. වෙළෙඳපළ තත්වයන් මත පදනම්ව අරමුදල සඳහා සුදුසු ආයෝජන අවස්ථා සම්බන්ධයෙන් ඔවුහු තීරණවලට එළඹෙති.

මණ්ඩලීය අනු කමිටු	ආවරණය	සංයුතිය
I. විගණන කමිටුව	■ අභ්‍යන්තර පාලන විධි සමාලෝචනය ■ අභ්‍යන්තර විගණන සමාලෝචනය ■ බාහිර විගණන සමාලෝචනය ■ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය	■ අධ්‍යක්ෂවරුන් තිදෙනෙකි ■ සියලුම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරු සහ සහකාර සාමාන්‍යාධිකාරිවරු
II. කළමනාකරණ කමිටුව	■ මෙහෙයුම් කටයුතු සමාලෝචනය ■ සුදුසු උත්ශ්‍රේණි කටයුතු සමාලෝචනය ■ කාර්ය සාධන සමාලෝචනය	■ සභාපති ■ ක්‍රියාකාරී අධ්‍යක්ෂ ■ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය
III. ආයෝජන කමිටුව	■ මණ්ඩලීය ආයෝජන ප්‍රතිපත්තිය ■ ආයෝජන කළඹ සහ ඒවායේ කාර්ය සාධනය ■ වත්මන් පාරිසරික සාධක සමාලෝචනය	**ආයෝජන කමිටුව** ■ භාණ්ඩාගාර නියෝජිත ■ රේඛීය අමාත්‍යාංශ නියෝජිත ■ අතිරේක සාමාන්‍යාධිකාරී ■ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ආයෝජන) ■ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) ■ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන- නිරීක්ෂක)

අවදානම් කළමනාකරණ වාර්තාව

සමස්ත අවදානම් කළමනාකරණය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන ප්‍රමුඛ විශ්‍රාම පාර්තෝෂික ගෙවීමේ අරමුදලක් සේ සැලකේ. මාසික පදනමක් මත අරමුදල වෙත ගලා එන පුද්ගලික අංශය සහ අර්ධ රාජ්‍ය අංශය යන දෙඅංශයේ සේවයේ නියුතු විශ්‍රාම වැටුපකට හිමිකම් නොලබන සේවක සේවිකාවන් වෙතින් දිගු කාලයක් තිස්සේ ලබා ගන්නා දායක මුදල් උපයෝගි කර ගනිමින් ඔවුන් වෙත මූල්‍ය රැකවරණයක් සලසා දීම පිණිස සද්භාවයෙන් යුතුව ක්‍රියා කිරීම උදෙසා මණ්ඩලය කැපවී සිටියි. තවද, සියලුම සේවක සේවිකාවන්ට ඔවුන්ගේ සේවයෙන් විශ්‍රාම ගැනීම මත එකී අදාළ තැනැත්තන්ට අයත් නිශ්චිත ප්‍රතිලාභ ඔවුන් වෙතම ලැබෙන බවට මණ්ඩලය විසින් වගබලා ගත යුතු වන අතර අරමුදලට අයත් විවිධ වර්ගයේ ආයෝජන සමුච්චයක් තුළ යොදවා එසේ ආයෝජනය කළ ප්‍රාග්ධනයේ සුරක්ෂිත භාවය ද තහවුරු කර දිය යුතුය. සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට අයත් ආයෝජන කාර්ය භාරයේ සැලකිය යුතු ප්‍රමාණයක් රජයේ ඇප සුරැකුම්පත් වලින් සමන්විත වේ. තවද, 2019 දෙසැම්බර් මස 31 වන දිනට සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය කොළඹ කොටස් වෙළඳපළ තුළ පැවති මුළු වෙළඳපළ ප්‍රාග්ධනීකරණයෙන් සියයට 0.4 % ක ප්‍රතිශතයක් හිමිව සිටියේය. ඒ අනුව, අවදානම් කළමනාකරණය, ව්‍යාපාර මෙහෙයුම් කටයුතුවලට අයත් සෑම අදියරකදීම කිසියම් බලපෑමක් ඇති කළ හැකි ප්‍රධාන ප්‍රමුඛතා කරුණක් සේ සැලකේ.

සමකාලීන ව්‍යාපාරික සංදර්භය තුළ, ණය අවදානම, වෙළෙඳපළ අවදානම, ද්‍රවශීලතා අවදානම සහ මෙහෙයුම් කටයුතු අවදානම යන අවදානම්වලට මණ්ඩලය නිරාවරණය වී තිබේ.

ණය අවදානම

කිසියම් අවස්ථාවක ණයගනුවා විසින් ණයදෙනුවා හට ගෙවිය යුතු මුදල් ගෙවීම පැහැර හරින විට ණය අවදානම උද්ගත වෙයි. මගින් එක් ණය ගනුවකු වෙනුවෙන් දැරිය යුතු පිරිවැය ඉහළ නැංවෙන අතර ණයදෙනුවෙකුගේ දෘෂ්ඨි කෝණයෙන් බලන විට ණය ඒකරාශි වීමක් ලෙසද සැලකිය හැකිය. ණය අවදානම්, නිසැකවම වටිනා මූල්‍ය ඉඩ ප්‍රස්ථාවල ප්‍රතිඵලයක් ලෙස යම් නිශ්චිත කාල පරිච්ඡේදයක් තුළ ණය දෙන්නේකු විසින් අත්කරනු ලැබිය හැකිව තිබූ කිසියම් ආර්ථික හෝ මූල්‍ය ප්‍රතිඵල කෙරෙහි සීමාවන් පනවයි. 2019 දෙසැම්බර් මස 31 වන දිනට මණ්ඩලය සතු අරමුදල් වලින් සියයට 77.5 ක ප්‍රතිශතයක් අවදානම් රහිත රජයේ ඇප සුරැකුම්පත්හී ආයෝජනය කරනු ලැබ තිබේ. එහෙයින් ණය අවදානම අඩු මට්ටමක පවත්වා ගැනීමට මණ්ඩලයට හැකි විය. ණයකරවල යොදවන ලද ආයෝජනය මුළු ආයෝජන සමුච්චයෙන් සියයට 1.1 ක ප්‍රතිශතයක් ලෙස ගණනය විය. පූර්ණ විශ්ලේෂණයක් මගින් අධ්‍යයනයට ලක්කර ශ්‍රේණිගත ආයතනික ණය සාධන පත්‍ර ආයෝජනවල පමණක් මණ්ඩලය මුදල් යොදවයි. තවද නියමිත ප්‍රති ගැනුම් ගිවිසුම් සහ එක් රැයක් සඳහා සිදුවන ප්‍රති ගැනුම් ගිවිසුම් රජයේ



සුරැකුම්පත් හරහා ප්‍රමාණවත් අයුරින් සුරක්ෂිත කරනු ලැබ තිබේ. මෙම අවදානම් වළක්වා ගැනීමේ ක්‍රියාමාර්ගය ණය අවදානම් අවම මට්ටමක රඳවා තබාගැනීම සඳහා සඳහා මණ්ඩලයට උපකාරී වී තිබේ.

මෙහෙයුම් අවදානම

මෙහෙයුම් අවදානම්වලට ආයතනයක් සතු මෙහෙයුම් ශක්තතාව පිරිහීයාමට සැලැස්විය හැකිය. එය, මූල්‍යකරණය හා ක්‍රමවත් අවදානම නිශ්චය කරනු ලැබීමෙන් අනතුරුව උද්ගතවන අවශේෂ අවදානම වන අතර ඊට අභ්‍යන්තර කාර්ය පරිපාටි කඩාවැටීම් හා පුද්ගල හා පද්ධති කඩාවැටීම් යනාදියට සම්බන්ධ අවදානම් ද අන්තර්ගත වේ. මණ්ඩලයේ මෙහෙයුම් අවදානම්හී ප්‍රධාන ප්‍රභවයන් වනුයේ, තොරතුරු තාක්ෂණයේ බිඳවැටීම්, මිනිස් වැරදි හා මැදිහත්වීම් සහ ස්වාභාවික ව්‍යසන යනාදියයි. මෙම අවදානම් සමනය කරගනු පිණිස සවිමත් මෙහෙයුම් අවදානම් කළමනාකරණ ක්‍රියාවලියක් මණ්ඩලය විසින් සම්පාදනය කරනු ලැබ තිබේ. අදාළ මෙහෙයුම් කටයුතු ස්වාධීන අභ්‍යන්තර විගණක වරයෙකු විසින් විගණනය කරනු ලබන අතර වීවායේ දුර්වලතා හා විෂමතා වහා විසඳාගැනීම සඳහා නිරන්තර පදනම මත එකී විගණන මගින් උද්ගත වන නිගමන සාකච්ඡාවට භාජනය කෙරේ.

වෙළෙඳපොල අවදානම

වෙළඳපළ අවදානම්වලට යම් ආයතනයක් නිරාවරණය වී සිටීමේ අනතුරුදායක බව මූල්‍ය වෙළඳපළ තුළ පවතින අවිනිශ්චිතතාවන් මගින් ඉහළ නංවයි. පොලී අනුපාතය තුළ ඇතිවන උච්චාවචන සහ කොටස් හිමිකම් අවදානම් වෙළඳපළ අවදානමෙහි පවත්නා මූලික අංග ලෙස හඳුනා ගනු ලැබ ඇත. වෙළඳපළ අවදානම ආයෝජන මත ලබන ප්‍රතිලාභය පිරිහී යාමට සලස්වයි. භාණ්ඩාගාර බැඳුම්කර මත පොලී අනුපාත තුළ උඩු සීග්‍රතාවක් නිරූපණය වන විට වටිනාකමෙහි අඩුවීමක් සිදුවිය හැක. ඊට ප්‍රතිවිරුද්ධ වශයෙන් පොලී අනුපාත තුළ ක්‍රමික අඩුවීමක් (මිල අවදානම) නිරූපණය වන විට අඩු පොලී අනුපාතය මත අරමුදල් ප්‍රති ආයෝජනය (ප්‍රති ආයෝජන අවදානම) කිරීමට සිදුවේ. එමගින් ලාභ උත්පාදනයේ ධාරිතාව හීන විය හැක. වෙනස් කාල සීමා හා ප්‍රතිලාභ යටතේ භාණ්ඩාගාර බැඳුම්කර අත්කර ගැනීමේ උපාය මාර්ගයක් සහිතව කටයුතු කිරීම මගින් වෙළඳපළ අවදානමට නිරාවරණය වීම යම්තාක් දුරකට සාමාන්‍ය කරගනු ලැබිය හැකිය. ප්‍රාග්ධන වෙළඳපළවල් තුළ සිදුවන යම් අහිතකර උච්චාවචන, ප්‍රධාන වශයෙන් කොටස් වැනි ප්‍රාග්ධන වෙළඳපළ සාධනපත්‍රවල අගය හීනකරවීමට හේතුකාරක විය හැකිය. ප්‍රමුඛ කාර්යකරණයක් සහිත වෙළඳපළ අංශ කීපයක් තුළ රැඳී පැවතීම පුළුල් කිරීම මගින් යම් උද්ගත විය හැකි මූල්‍ය අලාභ වලක්වා ගනු පිණිස ආයෝජන විවිධාංගීකරණ මාර්ග වෙත ප්‍රවේශය සලසා ගැනීම සහ මිල බණ්ඩ අනුගමනය කිරීම වැනි අවදානම අඩු කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට හැකිය. ප්‍රතිරෝධී ආයෝජනවල මුදල් යෙදවීමට පෙර ඒ පිළිබඳ විස්තීර්ණ විශ්ලේෂණයක් සිදුකළ යුතුය. කෙසේ වුවද, මණ්ඩලයේ මුළු ආයෝජන විස්තර සටහන තුළ කොටස් මත සිදුකරන ලද ආයෝජන සියයට 3.48 ක ප්‍රතිශතයක් ලෙස ගණනය වූ බැවින් මණ්ඩලයේ කොටස් හිමිකම් සමුච්චය කෙරෙහි ඇතිකළ සමස්ත බලපෑම සාපේක්ෂ වශයෙන් අඩු අගයක් ගන්නේ ය.

ද්‍රවශීලතා අවදානම

කෙටිකාලීන මූල්‍ය ඉල්ලුම් සපුරා ගනු පිණිස ප්‍රමාණවත් නොවන අඩු මුදල් තත්වයක් පැවතීම ද්‍රවශීලතා අවදානම යනුවෙන් සරල ලෙස අර්ථකථනය කළ හැකිය. මණ්ඩලයේ දෘෂ්ටිකෝණයට අනුව, මෙම කාණ්ඩය තුළ ගැනෙන අවදානම් මගින් ද විභව ආයෝජන ඉඩ ප්‍රස්ථා වැළැක්විය හැකි අතර මූල්‍ය උපකරණවල අලෙවිකළ හැකි බව ද ඉන් පහත වැටේ. සාමාන්‍ය වශයෙන් ප්‍රතිලාභ ගෙවීමෙන් පසු මණ්ඩලයේ ශුද්ධ දායක මුදල් ප්‍රමාණය මගින් ධනාත්මක මුදල් ප්‍රවාහයක් උත්පාදනය වූ අතර එමගින් මණ්ඩලයේ ද්‍රවශීලතා ස්ථාවරය තුළ උඩු ප්‍රවනතාවක් සනිටුහන් වූයේය. 2019 වර්ෂය අවසාන වන විට, ආදායම හා කල්පිරීමේ මුදල් වැනි වෙනත් මුදල් ප්‍රවාහවලින් ලත් ඉපැයුම් හැර වාර්ෂික ප්‍රතිලාභ ආපසු ගෙවුම් ප්‍රමාණය තුළ මුළු මුදල් ප්‍රවාහයෙන් සියයට 72 ක් ලෙස විද්‍යාමාන වූයේ ය. වඩාත්ම ද්‍රවශීලී ආකාරයේ ආයෝජන ගණයේලා සැලකිය හැකි රජයේ සුරැකුම් පත් තුළ අරමුදල් වලින් සැලකිය යුතු ප්‍රමාණයක් ආයෝජනය කරනු ලබන හෙයින් ද්‍රවශීලත්ව උගුලෙහි සිර නොවී වැළකී සිටීමට මණ්ඩලයට හැකි වූයේ ය. මෙම යාන්ත්‍රනය මගින් සිදුවිය හැකි ඕනෑම දුවශීලතා පසුබෑම්වලට එරෙහි අතිරේක රැකවරණයක් සලසා දෙනු ලබයි. අකර්මණ්‍ය අරමුදල්වලින් සාධාරණ ප්‍රතිලාභයක් උත්පාදනය කිරීමේ අභිප්‍රාය සහිතව දෛනික ද්‍රවශීලතා කළමනාකරණ මෙවලමක් ලෙස සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය දෛනිකව එක් රැයකින් මුදල් උපයාගත හැකි ප්‍රති මිලදී ගැනුම් වෙළඳපොළ තුළ අරමුදල් ආයෝජනය කරයි. එබැවින් අරමුදල විෂයෙහි පවත්නා ද්‍රවශීලතා අවදානම ද අඩු මට්ටමක පවතී.



අවදානම් ඇගයීම



උපාය මාර්ගික අවදානම

1. වෙළෙඳපොල අවදානම
2. තාක්ෂණික අවදානම
3. සමාජ ආර්ථික සහ දේශපාලන අවදානම
4. තොරතුරු පද්ධති අවදානම

මෙහෙයුම් අවදානම

5. මෙහෙයුම් අවදානම
6. අභ්‍යන්තර පාලන අවදානම
7. මානව ප්‍රාග්ධනය සහ ශ්‍රම අවදානම
8. ප්‍රසම්පාදන අවදානම

මූල්‍ය අවදානම

9. ආයෝජන අවදානම
10. වංචා අවදානම

අනුකූලතා අවදානම

11. කීර්ති නාම අවදානම
12. අනුකූලතා අවදානම

අංක	අවදානම	විස්තරය	බලපෑම් අවම කිරීමේ උපාය මාර්ගය
1	වෙළෙඳපොල අවදානම	පොලී අනුපාතය තුළ ඇතිවන උච්චාවචන සහ කොටස් හිමිකම් අවදානම් වෙළඳපළ අවදානමෙහි පවත්නා මූලික අංග ලෙස හඳුනා ගනු ලැබ ඇත.	ආයෝජන කළඹ විවිධාංගිකරණය
2	තාක්ෂණික අවදානම	සම්පත් වැඩි දියුණු කිරීම සඳහා උසස් තොරතුරු තාක්ෂණය ප්‍රධාන ගාමක බලවේගය වනු ඇත.	EISA ව්‍යාපෘති හඳුන්වා දීම
3	සමාජ. සමාජ ආර්ථික සහ දේශපාලන අවදානම	සමාගමේ මෙහෙයුම් හා ආයෝජන කටයුතුවලට සමාජ ආර්ථික හා දේශපාලන සාධක සෘජුවම බලපායි.	ආයතනික සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී සමාජ ආර්ථික හා දේශපාලන සාධක ඇගයීම.
4	තොරතුරු පද්ධති අවදානම	ඵලදායී තීරණ ගැනීම සඳහා දත්ත ලබා ගැනීම සඳහා ප්‍රමාණවත් පද්ධති නොමැතිකම.	ICTA ව්‍යාපෘති හඳුන්වා දීම
5	මෙහෙයුම් අවදානම	මෙහෙයුම් අවදානම් යනු ඵලදායී මෙහෙයුම් සඳහා පහසුකම් නොමැතිකම හේතුවෙන් අලාභයක් සිදුවීමේ අවදානමයි.	නිරන්තර ප්‍රගති සමාලෝචන සහ අයවැය පාලනයන් සහ ඒ අනුව පූර්වාරක්ෂක ක්‍රියාමාර්ග ගැනීම.
6	අභ්‍යන්තර පාලන අවදානම	හොඳ අභ්‍යන්තර පාලන පද්ධති ස්ථාපිත කිරීමෙන් අපට මෙහෙයුම් ඵලදායීතාව සහ කාර්යක්ෂමතාව සහතික කළ හැකිය	අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර පාලනයන් අධීක්ෂණය කිරීම.
7	මානව ප්‍රාග්ධනය සහ ශ්‍රම අවදානම	ප්‍රධාන කළමනාකරණ පිරිස් ආකර්ෂණය කර ගැනීමට හා රඳවා ගැනීමට අපොහොසත් වීම, අවශ්‍ය විශේෂඥතාවයේ ඌනතාවයට හෝ අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග නොමැති වීමට හේතු විය හැක.	කාර්ය මණ්ඩලය සඳහා දේශීය හා විදේශීය වශයෙන් අඛණ්ඩ පුහුණුව හා සංවර්ධනය.
8	ප්‍රසම්පාදන අවදානම	ප්‍රසම්පාදන කාර්යක්ෂම ප්‍රවාහයක් සහතික කිරීම සඳහා සැපයුම්කරුවන් සමඟ මනා සබඳතා අවශ්‍ය වේ.	සැපයුම්කරුවන් තෝරා ගැනීම සඳහා විනිවිද පෙනෙන ටෙන්ඩර් පටිපාටි අනුගමනය කිරීම.
9	ආයෝජන අවදානම	ආයෝජන අසමත් වීම / අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට ඇති නොහැකියාව සහ අනාගත ලාභදායීතාවය සහ මණ්ඩලයේ තිරසාර බව මෙයට ඇතුළත් වේ.	ලබා දී ඇති අයවැය සහ කාල නියමයන් තුළ ව්‍යාපෘති භාරදීම සහතික කිරීම සඳහා ප්‍රගතිය සමීපව නිරීක්ෂණය කිරීම
10	වංචා අවදානම	වංචා අවදානම අභ්‍යන්තර පාලනයන්හි දුර්වලතා නිසා පැන නගින අතර එමඟින් මූල්‍යමය පාඩු සිදුවිය හැකිය	අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් වංචා සිදුවීමට ඉඩ ඇති ප්‍රදේශවල නිතිපතා විගණන පවත්වනු ලැබේ.
11	කීර්ති නාම අවදානම	කීර්තිනාමය අවදානම යනු යම් සිදුවීමක් හෝ සිදුවීමක් මණ්ඩලයේ ප්‍රතිරූපයට හානි කිරීමේ අවදානමයි	මණ්ඩලයේ කාර්යසාධනය එහි ඉලක්කවලට අනුකූල බව සහතික කිරීම සඳහා මාසික පදනමින් අයවැය ක්‍රියාවලියක් සහ අයවැය පාලන යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම.
12	අනුකූලතා අවදානම	සමාගමට අදාළ වන කිසියම් නීතියක් හෝ නියාමන අවශ්‍යතා පිළිපැදීමට අපොහොසත් වීම නිසා අනුකූලතා අවදානම ඇතිවිය හැකිය.	අදාළ නීති හා රෙගුලාසි වලට අනුකූල වීම සහතික කිරීම.





03

මූලික තොරතුරු

	සටහන	සමූහය		මණ්ඩලය	
		2019	2018	2019	2018
		රු. '000	රු. '000	රු. '000	රු. '000
මුළු අදායම					
පොලී ආදායම	4	31,583,332	28,330,988	31,554,779	28,301,818
(-) පොලී වියදම - 3.0% (සේනිහා අරමුදල් පනතේ 22 වන වගන්තිය අනුව)		(9,423,454)	(8,434,536)	(9,423,454)	(8,434,536)
ශුද්ධ වෙළෙඳ කටයුතු ආදායම	5	(144,896)	201,061	-	-
ලාභාංශ ආදායම	6	481,081	346,254	481,081	346,254
ලාභ/අලාභ ගිණුම් මත මූලික වත්කම් සාධාරණ අගයට ගැළපීමෙන් ලද ලාභ/අලාභ	7	(386,360)	(307,891)	(386,360)	(307,891)
වෙනත් ආදායම්	8	446,109	484,282	429,011	462,952
		22,555,811	**20,620,158**	**22,655,056**	**20,368,597**
මුළු මෙහෙයුම් වියදම්					
සේවක මණ්ඩල වියදම්	9	1,379,882	1,243,448	1,292,861	1,144,968
පරිපාලන වියදම්	10	244,825	242,253	179,517	183,496
මූල්‍ය වියදම්	11	27,368	20,648	4,122	5,184
සාමාජික වියදම්	12	523,298	488,148	523,298	488,148
ක්ෂයවීම් හා ක්‍රමක්ෂයවීම්	13	128,362	80,428	53,983	14,219
ප්‍රවර්තන වර්ෂයේ සාමාජිකයන් වෙත ගෙවන ලද පොලී		260,709	240,937	260,709	240,937
කොටස් හිමිකම් අයෝජනයන්හි වත්කම් හානිකරණය	14	399	-	399	-
		2,564,844	**2,315,863**	**2,314,889**	**2,076,953**
බදු වලට පෙර ලාභය		**19,990,967**	**18,304,295**	**20,340,167**	**18,291,644**
ආදායම් බදු වියදම	15	(4,155,085)	(3,410,284)	(4,242,123)	(3,394,806)
බදු වලට පසු ලාභය		**15,835,882**	**14,894,011**	**16,098,044**	**14,896,838**
ප්‍රවර්ථන වර්ෂයේ ලාභය සඳහා ගැලපීම		-	(45,925)	-	(45,925)
වර්ෂය සඳහා ලාභය		**15,835,882**	**14,848,086**	**16,098,044**	**14,850,912**
ලාභය ආරෝපනය :					
සමාගම් කොටස් හිමියන්		15,862,098	14,847,816	16,098,044	14,850,912
පාලනයට ප්‍රයෝජනවත් නොවන අයිතීන්		(26,216)	270	-	-
වර්ෂය සඳහා ලාභය		**15,835,882**	**14,848,086**	**16,098,044**	**14,850,912**
ඉ/ගෙ. රඳවාගත් ලාභය		3,699,948	5,983,654	2,929,788	5,210,398
විසර්ජනය සඳහා වූ ලාභය		**15,835,882**	**14,848,086**	**16,098,044**	**14,850,912**
විසර්ජනය සඳහා වූ මුළු ලාභය		**19,535,829**	**20,831,740**	**19,027,832**	**20,061,310**
අඩු කළා: යෝජිත විභජනය - ලාභාංශ 5.0% (2018-6.0%)		(15,705,756)	(16,869,072)	(15,705,756)	(16,869,072)
අඩු කළා: ලාභාංශ - ලංකා ලුණු සමාගම		(67,500)	-	-	-
අඩු කළා: පාලනයෙන් තොර පොළී		26,216	(270)	-	-
විසර්ජනයට පසු ලාභය		**3,788,789**	**3,962,398**	**3,322,075**	**3,192,238**

	සටහන	සමූහය		මණ්ඩලය	
		2019	2018	2019	2018
		රු. '000	රු. '000	රු. '000	රු. '000
අනෙකුත් විස්තීර්ණ ආදායම					
වස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ප්‍රතිවර්ගීකරණය කළ හෝ කළ හැකි අයිතම					
		-	-	-	-
විකිණීම පිණිස ඇති මූල්‍ය උපකරණ සංචිතයට මාරු කිරීම		(8,665)	(593,418)	(8,665)	(593,418)
විකිණීම සඳහා ඇති සංචිත (ඒකක)		1,513	(45,261)	1,513	(45,261)
වස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ප්‍රතිවර්ගීකරණය නොකළ අයිතම					
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් මත ආයු ගණක ලාභය / (අලාභය)		(41,900)	13,560	(41,900)	13,560
වෙනත් විස්තීර්ණ ආදායම/(වියදම) සඳහා ආදායම් බදු		-	-	-	-
වර්ෂය සඳහා වූ බදු පසු වෙනත් මුළු විස්තීර්ණ ආදායම		**(49,053)**	**(625,118)**	**(49,053)**	**(625,118)**
වර්ෂය සඳහා වූ බදු පසු මුළු විස්තීර්ණ ආදායම		**15,786,829**	**14,222,967**	**16,048,991**	**14,225,794**
විභජනය කළ හැකි මුළු විස්තීර්ණ ආදායම					
සමාගමේ කොටස් හිමිකම් හිමියන්		15,813,046	14,222,698	16,048,991	14,225,794
පාලනයට ප්‍රමාණවත් නොවන අයිතීන්		(26,216)	270	-	-
බදුවලට පසු වර්ෂය සඳහාවූ මුළු ශුද්ධ විස්තීර්ණ ආදායම		**15,786,829**	**14,222,967**	**16,048,991**	**14,225,794**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

2019 දෙසැම්බර් මස 31 දිනට

	සටහන	සමූහය		මණ්ඩලය	
		2019	2018	2019	2018
		රු. '000	රු. '000	රු. '000	රු. '000
වත්කම්					
මුදල් හා මුදල් සමානයන්		591,254	781,142	548,572	738,070
ලාභ හා අලාභ ඔස්සේ සාධාරණ අගයට නිශ්චය කරන ලද මූල්‍ය වත්කම්	16	2,699,451	2,886,959	2,699,451	2,886,959
පරිපාලිත සමාගමෙහි ආයෝජන	17	-	-	470,961	470,961
වෙනත් විස්තීරණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට නිශ්චය කරන ලද මූල්‍ය වත්කම්	18	7,899,643	7,563,896	7,899,643	7,563,896
ක්‍රමක්ෂය පිරිවැය යටතේ මූල්‍ය වත්කම්	19	324,974,213	292,928,563	324,688,318	292,668,381
අනෙකුත් වත්කම්	20	3,454,166	3,337,230	2,839,598	2,411,767
දේපළ, පිරියත සහ උපකරණ	21	1,260,761	1,196,569	365,206	218,161
කල් බදු දේපල	22	3,485	4,182	-	-
අස්පෘශ්‍ය වත්කම්	23	1,039	102	1,039	102
ආයෝජන දේපළ	24	3,812,500	3,812,500	3,812,500	3,812,500
මුළු වත්කම්		**344,696,512**	**312,511,143**	**343,325,287**	**310,770,798**
බැරකම්					
පොලී දරන ණය සහ ණය ගැනුම්	25	199,354	155,545	-	-
ප්‍රදාන සහ සහනාධාර	26	29,136	30,199	-	-
නිශ්චිත ප්‍රතිලාභ බැරකම	27	477,383	433,819	252,600	212,163
ප්‍රවර්තන බදු බැරකම	28	1,298,360	1,903,071	1,298,360	1,903,071
අනෙකුත් බැරකම්	29	1,157,450	871,610	817,448	540,815
විලම්භිත බදු වගකීම්	30	7,050	94,088	-	-
ප්‍රතිපාදන	31	104,603	132,784	104,603	132,784
මුළු බැරකම්		**3,273,335**	**3,621,116**	**2,473,010**	**2,788,833**
කොටස් හිමිකම්		341,318,991	308,752,125	340,852,277	307,981,965
පාලනය රහිත පොලී		104,186	137,902	-	-
මුළු කොටස් හිමිකම්		**341,423,177**	**308,890,027**	**340,852,277**	**307,981,965**
මුළු බැරකම් සහ කොටස් හිමිකම්		**344,696,512**	**312,511,143**	**343,325,287**	**310,770,798**

පිටු අංක 63 සිට 94 දක්වා ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල මුඛ්‍ය කොටසක් වේ.

නිවැරදි බවට සහතික කළේ,

එම්. ඒ. වී. කුමුදිනි
මූල්‍ය කළමනාකාරිනි

එන්. ඩබ්ලිව්. විමලවීර
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)

මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශ අනුමත කර අත්සන් කරන ලදි.

ශ්‍රියාන් ද සිල්වා වජයරත්න
සභාපති / ප්‍රධාන විධායක නිලධාරී

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

2019 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

සමූහය	සමාගමේ කොටස් හිමියන්ට ආරෝපණීය										
	සාමාජික අරමුදල										
	දායකත්වය	පොළිය	ලාභාංශය	සාමාජික අරමුදල	රඳවාගත් ලාභය	විකුණුම් සඳහා ලඳ හැකි සංචිතය	වෙනත් සංචිත	ලාභාංශ සැමයීම් සංචිත අරමුදල	පශ්චාත් අත්පත්කරගැනීම් සංචිත	අපාලිත පොළිය	එකතුව
01.01.2018 වන දිනට ශේෂය	**-**	**-**	**-**	**274,159,747**	**5,210,398**	**(1,141,071)**	**(40,894)**	**142,000**	**767,730**	**137,632**	**279,235,543**
පූර්ව වසර ගැලපුම් (කොටස් අපහායනය)	-	-	-	-	(45,925)	-	-	-			(45,925)
කොටස් මත ලබාගත් ප්‍රාග්ධන ලාභය - කොටස් සංචිත ගිණුම	-	-	-	-	-	(638,679)	-	-			(638,679)
පූර්ව වසර දායකත්වය ගැලපුම්	-	-	-	1,035	-	-	-	-			1,035
ලැබුණු දායකත්වය	25,282,293	-	-	25,282,293	-	-	-	-			25,282,293
දායකත්ව මුදල් නැවත ලබාදීම	(18,291,873)	-	-	(18,291,873)	-	-	-	-			(18,291,873)
සමාජික අරමුදල් ශේෂය මත පොළිය 3.0%	-	8,434,536	-	8,434,536	(8,434,536)	-	-	-			-
"ලාභාංශය		6'0]¯	16,869,072	16,869,072	(16,869,072)	-	-	-			-
වසරේ සමුච්චිත ලාභය	-	-	-	-	23,331,374	-	-	-		270	23,331,644
ආයුගණක ලාභය/(පාඩුව)	-	-	-	-	-	-	13,560	-			13,560
අනුබද්ධ ආයතන මගින් ගෙවූ ලාභාංශය										-	-
අනුබද්ධ ආයතන ස්කන්ධ චලනය									2,429		2,429
31.12.2018 වන දිනට ශේෂය	**6,990,420**	**8,434,536**	**16,869,072**	**306,454,810**	**3,192,238**	**(1,779,750)**	**(27,334)**	**142,000**	**770,160**	**137,902**	**308,890,027**
01.01.2019 වන දිනට ශේෂය				306,454,810	3,192,238	(1,779,750)	(27,334)	142,000	770,160	137,902	308,890,027
පූර්ව වසර ගැලපුම්					(262,450)						(262,450)
කොටස් මත ලබාගත් ප්‍රාග්ධන ලාභය - කොටස් සංචිත ගිණුම	-	-	-	-	-	(7,153)	-	-			(7,153)
පූර්ව වසර දායකත්වය ගැලපුම්	-	-	-	(7,993)	-	-	-	-			(7,993)
ලැබුණු දායකත්වය	27,476,206	-	-	27,476,206	-	-	-	-			27,476,206
දායකත්ව මුදල් නැවත ලබාදීම	(19,807,895)	-	-	(19,807,895)	-	-	-	-			(19,807,895)
සමාජික අරමුදල් ශේෂය මත පොළිය 3.0%	-	9,423,454	-	9,423,454	(9,423,454)	-	-	-			-
"ලාභාංශය		5'0]¯	15,705,756	15,705,756	(15,705,756)	-	-	-			-
වසරේ සමුච්චිත ලාභය	-	-	-	-	25,521,498	-	-	-		(26,216)	25,495,282
ආයුගණක ලාභය/(පාඩුව)	-	-	-	-	-	-	(41,900)	-			(41,900)
අනුබද්ධ ආයතන මගින් ගෙවූ ලාභාංශය										(7,500)	(7,500)
අනුබද්ධ ආයතන ස්කන්ධ චලනය									(303,446)		(303,446)
31.12.2019 වන දිනට ශේෂය	**7,668,311**	**9,423,454**	**15,705,756**	**339,244,338**	**3,322,075**	**(1,786,902)**	**(69,234)**	**142,000**	**466,714**	**104,186**	**341,423,177**

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය
2019 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය	සමාගමේ කොටස් හිමියන්ට ආරෝපණීය								එකතුව
	සාමාජික අරමුදල				රඳවාගත් ලාභය	විකුණුම් සඳහා ලඳ හැකි සංචිතය	වෙනත් සංචිත	ලාභාංශ සැමයීම් සංචිත අරමුදල	
	දායකත්වය	පොළිය	ලාභාංශය	සාමාජික අරමුදල					
01.01.2018 වන දිනට ශේෂය				**274,159,747**	**5,210,398**	**(1,141,071)**	**(40,894)**	**142,000**	**278,330,180**
පූර්ව වසර ගැලපුම් (කොටස් අපහායනය)	-	-	-	-	(45,925)	-	-	-	(45,925)
කොටස් මත ලබාගත් ප්‍රාග්ධන ලාභය - කොටස් සංචිත හිඟුම	-	-	-	-	-	(638,679)	-	-	(638,679)
පූර්ව වසර දායකත්වය ගැලපුම්	-	-	-	1,035	-	-	-	-	1,035
ලැබුණු දායකත්වය	25,282,293	-	-	25,282,293	-	-	-	-	25,282,293
දායකත්ව මුදල් නැවත ලබාදීම	(18,291,873)	-	-	(18,291,873)	-	-	-	-	(18,291,873)
සමාජික අරමුදල් ශේෂය මත පොළිය 3%	-	8,434,536	-	8,434,536	(8,434,536)	-	-	-	-
"ලාභාංශය		6'0]¯	16,869,072	16,869,072	(16,869,072)	-	-	-	-
වසරේ සමුච්චිත ලාභය	-	-	-	-	23,331,374	-	-	-	23,331,374
ආයුගණක ලාභය/(පාඩුව)	-	-	-	-	-	-	13,560	-	13,560
31.12.2018 වන දිනට ශේෂය	**6,990,420**	**8,434,536**	**16,869,072**	**306,454,810**	**3,192,238**	**(1,779,750)**	**(27,334)**	**142,000**	**307,981,965**
01.01.2019 වන දිනට ශේෂය				306,454,810	3,192,238	(1,779,750)	(27,334)	142,000	307,981,965
පූර්ව වසර ගැලපුම්					(262,450)				(262,450)
කොටස් මත ලබාගත් ප්‍රාග්ධන ලාභය - කොටස් සංචිත හිඟුම						(7,153)			(7,153)
පූර්ව වසර දායකත්වය ගැලපුම්				(7,993)					(7,993)
ලැබුණු දායකත්වය	27,476,206			27,476,206					27,476,206
දායකත්ව මුදල් නැවත ලබාදීම	(19,807,895)			(19,807,895)					(19,807,895)
සාමාජික අරමුදල් ශේෂය මත පොළිය 3%		9,423,454		9,423,454	(9,423,454)				-
ලාභාංශය		5'0]¯	15,705,756	15,705,756	(15,705,756)				-
වසරේ සමුච්චිත ලාභය					25,521,498				25,521,498
ආයුගණක ලාභය/(පාඩුව)							(41,900)		(41,900)
31.12.2019 වන දිනට ශේෂය	**7,668,311**	**9,423,454**	**15,705,756**	**339,244,338**	**3,322,075**	**(1,786,902)**	**(69,234)**	**142,000**	**340,852,277**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2019 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සමූහය		මණ්ඩලය	
	2019	2018	2019	2018
	රු. '000	රු. '000	රු. '000	රු. '000
මෙහෙයුම් ක්‍රියාකාරකම්				
FVTPL ලෙස නියම කළ මූල්‍ය උපකාරක අලෙවියෙන් ලත් මුදල	263,759	335,452	263,759	335,452
කල් පිරෙන තෙක් රඳවාගත් මූල්‍ය උපකාරකවල කල් පිරීම්	128,394,676	95,688,858	128,394,676	95,688,858
ණය සහ ලැබිය යුතු මූල්‍ය උපකාරකවල කල් පිරීම්	124,578	105,939	124,578	105,939
FVTPL ලෙස නියම කළ මූල්‍ය උපකාරක මිලදී ගැනීම් සඳහා ගෙවීම	(828,966)	(1,508,499)	(828,966)	(1,508,499)
කල් පිරෙන තෙක් රඳවාගත් මූල්‍ය උපකාරක මිලදී ගැනීම් සඳහා ගෙවීම	(160,674,715)	(124,860,207)	(160,674,715)	(124,860,207)
අත්පත්කර ගැනීම් සඳහා ලබාදුන් ණය සහ ලැබිය යුතු මූල්‍ය උපකාරක	(239,676)	(288,605)	(239,676)	(288,605)
පාරිභෝගිකයින්ගෙන් ලත් මුදල්	1,748,418	1,633,286	-	-
සැපයුම්කරුවන්ට ගෙවූ මුදල්	(1,711,011)	(1,595,326)	-	-
ලැබූ පොළිය	31,440,122	25,164,823	31,440,122	25,164,823
ලැබූ ලාභාංශ	291,553	162,387	291,553	162,387
ලැබූ වෙනත් ආදායම්	399,859	489,164	399,859	489,164
ගෙවූ මෙහෙයුම් වියදම්	(1,221,942)	(1,230,308)	(1,221,942)	(1,230,308)
ගෙවූ සාමාජික වියදම්	(332,405)	(170,128)	(332,405)	(170,128)
ගෙවන ලද ආදායම් බදු	(4,690,504)	(199,596)	(4,690,504)	(199,596)
ගෙවූ පොළිය	(283,956)	(260,052)	(260,709)	(244,589)
ගෙවූ නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය	(12,591)	(22,225)	-	-
ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ගෙවූ බිම් කුලිය	(9,477)	(1,458)	-	-
5 වසර ශිෂ්‍යත්ව (ගෙවීම්)/නැවත මුදල් ගෙවීම	(92,207)	(89,664)	(92,207)	(89,664)
උසස් අධ්‍යාපනය ශිෂ්‍යත්ව (ගෙවීම්)/නැවත මුදල් ගෙවීම	(71,616)	(19,284)	(71,616)	(19,284)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	**(7,506,101)**	**(6,665,441)**	**(7,498,194)**	**(6,664,255)**
ආයෝජන කටයුතු				
දේපළ සහ උපකරණ මිලදී ගැනීම	(274,412)	(90,400)	(249,515)	(36,144)
දේපළ සහ උපකරණ අලෙවියෙන් උත්පාදිතයන්	2,595	7,993	38	6,548
අයෝජන අත්පත්කර ගැනීම්	(26,421)	(9,527)	-	-
ලැබූ පොළිය	28,711	29,715	-	-
කාර්ය මණ්ඩල ණය නැවත ගෙවීම/ශුද්ධ (ප්‍රදාන)	707	2,553	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	**(268,819)**	**(59,667)**	**(249,477)**	**(29,596)**
මූල්‍ය කටයුතු				
ලැබුණු දායකත්වය	27,366,900	25,007,383	27,366,900	25,007,383
නැවත මුදල් ලබාදීම්	(19,806,558)	(18,314,698)	(19,806,558)	(18,314,698)
ගෙවූ මූල්‍ය වියදම්	(2,168)	(3,889)	(2,168)	(3,889)
ගෙවූ ලාභාංශ	(16,950)	(69,842)	-	-
පොළී දරන ණය සහ ණය ගැනුම් නැවත ගෙවීම	-	-	-	-
මූල්‍ය කල්බදු බැරකම් යටතේ මූලික ගෙවීම	(6,757)	(8,112)	-	-
මූල්‍ය කටයුතුවලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	**7,534,466**	**6,610,843**	**7,558,173**	**6,688,797**
මුදල් සහ මුදලට සමාන දේවල ශුද්ධ වැඩි වීම	(240,454)	(114,265)	(189,499)	(5,053)
ජනවාරි 01 වනදා වන විට මුදල් හා මුදල් සමාන දෑ	644,209	758,474	738,070	743,124
දෙසැම්බර් 31 වන දා වන විට මුදල් හා මුදල් සමාන දෑ	**403,755**	**644,209**	**548,572**	**738,070**

2019/12/31 වන දිනට භාණ්ඩාගාර බැඳුම්කර කළඹෙහි වෙළෙඳපල අගය

වසර	ප්‍රකාශිත අගය	මිලදී ගැනුම් පිරිවැය	වෙළෙඳපොළ අගය	ක්‍රමක්ෂය කළ පිරිවැය
2019	-	-	-	-
2020	1,310,000,000	1,365,395,730	1,335,712,549	1,335,320,736
2021	13,239,549,988	13,372,115,110	13,860,495,905	13,682,112,717
2022	68,269,879,361	73,360,993,562	73,123,533,144	73,127,161,060
2023	25,110,647,923	28,278,397,689	27,270,180,704	27,616,845,668
2024	8,676,180,634	8,400,596,577	9,371,265,475	8,845,772,371
2025	28,520,884,000	28,761,978,260	30,483,021,504	29,676,114,996
2026	20,985,000,000	19,762,773,149	23,012,066,672	20,653,649,158
2027	22,984,641,000	23,661,162,542	25,467,252,728	24,219,823,176
2028	25,089,079,000	25,355,084,215	27,271,365,527	26,190,411,360
2029	6,825,000,000	7,329,673,539	8,161,029,240	7,456,997,520
2030	1,268,684,000	1,330,929,793	1,358,369,175	1,348,830,967
2031	6,050,000,000	6,050,563,988	6,687,504,835	6,257,729,033
2033	5,126,118,000	5,247,410,313	5,766,013,873	5,508,219,073
2034	2,825,000,000	2,816,446,943	2,917,751,530	2,902,225,578
2035	1,426,190,000	1,522,598,027	1,601,667,134	1,571,192,315
2039	7,600,000,000	7,676,207,906	8,011,520,240	7,980,157,275
	245,306,853,906	**254,292,327,343**	**265,698,750,234**	**258,372,563,003**

2018/12/31 වන දිනට භාණ්ඩාගාර බැඳුම්කර කළඹෙහි වෙළෙඳපල අගය

වසර	ප්‍රකාශිත අගය	මිලදී ගැනුම් පිරිවැය	වෙළෙඳපොළ අගය	ක්‍රමක්ෂය කළ පිරිවැය
2019	17,530,710,000	15,721,962,699	17,940,773,783	17,993,579,542
2020	1,310,000,000	1,365,395,730	1,299,477,949	1,348,216,804
2021	13,239,549,988	13,372,115,110	13,238,772,786	13,710,759,598
2022	68,269,879,361	73,360,993,562	68,584,433,728	73,821,142,801
2023	23,385,647,923	26,556,500,717	23,756,752,280	26,255,606,168
2024	6,026,180,634	5,777,227,487	6,191,033,812	6,116,141,181
2025	28,520,884,000	28,761,978,260	28,429,579,627	29,699,824,153
2026	20,985,000,000	19,762,773,149	21,113,433,832	20,561,378,889
2027	10,569,000,000	11,140,125,501	10,599,928,065	11,154,459,832
2028	15,045,667,000	15,444,705,750	14,865,674,083	15,954,010,554
2029	3,740,000,000	3,927,974,937	4,053,185,356	4,008,458,862
2030	-	-		-
2031	-	-		-
2033	5,126,118,000	5,247,410,313	5,117,246,740	5,511,890,766
2034	-	-	-	-
2035	-	-	-	-
2039	-	-	-	-
	213,748,636,906	**220,439,163,215**	**215,190,292,042**	**226,135,469,151**

රාජ්‍ය සුරැකුම්පත්වල සාධාරණ අගය පදනම් වන්නේ පිළිවෙළින් 2018 සහ 2019 වසරවල මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කළ මිලදී ගැනීම් සහ විකුණුම් සාමාන්‍යයන් මත පදනම්වයි.

2019/12/31 වන දිනට ලැයිස්තුගත ණයකර කළඹෙහි වෙළෙඳපල අගය

සමාගමේ නම	මිලදී ගත් දිනය	නිදහස් කරගත් දිනය	විකුණුම්කර		වෙළෙඳපොළ අගය			ක්‍රමක්ෂය කළ පිරිවැය (රු.)
			ගණන	පිරිවැය (රු.)	විකුණුම් කරයකට	රු.	අනුපාතය (වසරකට)	
ජාතික සංවර්ධන බැංකුව පීඑල්සී	24.06.2015	24.06.2020	6,000,000	600,000,000	87.00	522,000,000	9.40%	653,580,000
සී/ස ලංකා කොමර්ෂල් බැංකුව	28.10.2016	27.10.2021	1,494,900	149,490,000	90.00	134,541,000	12.00%	152,684,581
හැටන් නැෂනල් බැංකුව	01.11.2016	01.11.2023	547,100	54,710,000	100.00	54,710,000	13.00%	55,898,631
පීපල්ස් ලීසිං ෆයිනෑන්ස් පීඑල්සී	16.11.2016	16.11.2021	4,000,000	400,000,000	100.00	400,000,000	12.60%	406,351,781
එල් බී ෆයිනෑන්ස් පීඑල්සී	11.12.2017	11.12.2022	2,000,000	200,000,000	100.00	200,000,000	12.75%	201,467,124
පීපල්ස් ලීසිං ෆයිනෑන්ස් පීඑල්සී	18.04.2018	18.04.2023	5,000,000	500,000,000	100.00	500,000,000	12.80%	545,238,356
සී/ස ලංකා කොමර්ෂල් බැංකුව	23.07.2018	22.07.2023	1,859,700	185,970,000	100.00	185,970,000	12.00%	195,874,813
සම්පත් බැංකුව පීඑල්සී	28.02.2019	28.02.2024	1,750,000	175,000,000	104.85	183,487,500	13.90%	195,459,658
ඩීඑෆ්සීසී බැංකුව පීඑල්සී	28.03.2019	28.03.2024	7,500,000	750,000,000	100.00	750,000,000	13.50%	827,393,836
ජාතික ඉතිරිකිරීමේ බැංකුව	10.09.2019	10.09.2024	13,500,000	,350,000,000	100.00	1,350,000,000	11.25%	1,397,018,836
හැටන් නැෂනල් බැංකුව පීඑල්සී	23.09.2019	22.09.2024	3,500,000	350,000,000	100.00	350,000,000	12.30%	361,794,521
එකතුව				**4,715,170,000**		**4,630,708,500**		**4,992,762,135**

ලැයිස්තුගත කර ඇති ආයතනික ණයකරවල ප්‍රකාශිත අගය පදනම් වන්නේ කොළඹ කොටස් වෙළෙඳපොළ මගින් 2019 දෙසැම්බර් 31 ප්‍රකාශිත මිල ගණන් අනුවය.

2018/12/31 වන දිනට ලැයිස්තුගත ණයකර කළඹෙහි වෙළෙඳපල අගය

සමාගමේ නම	මිලදී ගත් දිනය	නිදහස් කරගත් දිනය	විකුණුම්කර		වෙළෙඳපොළ අගය			ක්‍රමක්ෂය කළ පිරිවැය (රු.)
			ගණන	පිරිවැය (රු.)	විකුණුම් කරයකට	රු.	අනුපාතය (වසරකට)	
ලංකා බැංකුව	22.09.2014	21.09.2019	2,000,000	200,000,000	96.87	193,740,000	8.00%	204,206,027
සම්පත් බැංකුව පීඑල්සී	15.12.2014	14.12.2019	1,500,000	150,000,000	90.28	135,420,000	8.25%	161,756,250
සෙලාන් බැංකුව පීඑල්සී	23.12.2014	22.12.2019	750,000	75,000,000	99.99	74,992,500	8.60%	75,151,089
සියපත ෆිනෑන්ස් පීඑල්සී	24.12.2014	24.12.2019	500,000	50,000,000	99.98	49,990,000	8.90%	54,227,500
ජාතික සංවර්ධන බැංකුව පීඑල්සී	24.06.2015	24.06.2020	6,000,000	600,000,000	87.00	522,000,000	9.40%	653,580,000
සී/ස ලංකා කොමර්ෂල් බැංකුව	28.10.2016	27.10.2021	1,494,900	149,490,000	102.66	153,466,434	12.00%	152,524,852
හැටන් නැෂනල් බැංකුව පීඑල්සී	01.11.2016	01.11.2023	547,100	54,710,000	100.00	54,710,000	13.00%	55,839,199
පීපල්ස් ලීසිං ෆයිනෑන්ස් පීඑල්සී	16.11.2016	16.11.2021	4,000,000	400,000,000	100.00	400,000,000	12.60%	406,034,192
එල් බී ෆයිනෑන්ස් පීඑල්සී	11.12.2017	11.12.2022	2,000,000	200,000,000	100.00	200,000,000	12.75%	201,393,767
පීපල්ස් ලීසිං ෆයිනෑන්ස් පීඑල්සී	19.04.2018	18.04.2023	5,000,000	500,000,000	100.00	500,000,000	12.80%	542,809,863
සී/ස ලංකා කොමර්ෂල් බැංකුව	23.07.2018	22.07.2023	1,859,700	185,970,000	100.00	185,970,000	12.00%	195,321,489
එකතුව				**2,565,170,000**		**2,470,288,934**		**2,702,844,228**

ලැයිස්තුගත කර ඇති ආයතනික ණයකරවල ප්‍රකාශිත අගය පදනම් වන්නේ කොළඹ කොටස් වෙළෙඳපොළ මගින් 2018 දෙසැම්බර් 31 ප්‍රකාශිත මිල ගණන් අනුවය.

2019 දෙසැම්බර් මස 31 දිනට වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගය මත නැවත වර්ගීකරණය කරන ලද ලැයිස්තු ගත කොටස් වෙළඳපොල ආයෝජන

	ආයතනයේ නම	ගැණුම් මිල	සාධාරණ වටිනාකම	වෙළඳපොල වටිනාකම
		(රු)	(රු)	(රු)
1	ඒසිල් කේබල්ස් පීඑල්සී	78,555,367	54,795,150	86,487,480
2	ඒ්හොට් දේපල සමාගම	58,216,640	33,001,554	31,082,859
3	එයිටිකන් ස්පෙන්ස් පීඑල්සී	381,225,196	125,325,386	123,227,890
4	එයිටිකන් ස්පෙන්ස් හොටෙල් පීඑල්සී	206,276,390	64,009,035	64,246,106
5	බයිරහා ෆාම්ස් පීඑල්සී	287,636,683	148,910,320	137,751,046
6	කාසන් කම්බර්බැච් පීඑල්සී	16,146,881	6,210,404	8,087,968
7	සෙන්ට්‍රල් ෆිනෑන්ස් පීඑල්සී	258,881,908	207,028,962	246,555,927
8	සිලෝන් ඉන්වෙස්ට්මන්ට්ස්	8,523,353	2,667,678	3,584,265
9	සිලෝන් ගාඩියන් ආයෝජන සමාගම	143,302,106	34,124,361	44,828,117
10	කලම්බු ෆොට්ලන්ට් පීඑල්සී	55,326,764	10,500,450	9,240,396
11	කොමර්ෂල් බැංකුව පීඑල්සී	1,136,127,566	954,974,516	791,831,460
	කොමර්ෂල් බැංකුව (X) පීඑල්සී	471,111,161	365,284,042	318,959,024
12	සීඅයිසී හෝල්ඩින්ග්ස් පීඑල්සී	28,169,480	8,987,909	13,652,520
13	ඩීඑෆ්සීසී බැංකුව පීඑල්සී	646,951,842	370,879,536	366,492,789
14	ඩොක්යාර්ඩ් පීඑල්සී	437,865,195	96,384,630	107,672,920
15	ඩයලොග් ඒසියාටියා	110,391,841	97,387,410	113,001,084
16	ඩිප්ඩි ප්‍රොඩක්ට්ස් පීඑල්සී	2,119,708	1,401,650	1,370,319
17	ඊඩින් හෝටෙල්ස් පීඑල්සී	75,884,504	21,356,231	29,265,946
18	එක්ස්පෝලංකා පීඑල්සී	43,035,287	13,946,800	17,782,170
19	හේකාර්ඩි පීඑල්සී	140,778,782	98,384,454	148,357,510
20	හැටන් නැෂනල් බැංකුව (X) පීඑල්සී	100,719,056	98,091,543	78,982,137
21	ජොන් කීල්ස් පීඑල්සී	15,799,868	8,839,376	8,329,412
22	ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් පීඑල්සී	2,836,575,220	2,736,157,860	2,873,826,180
23	කැළණි කේබල්ස් පීඑල්සී	9,031,561	6,737,474	8,409,896
24	ලංකෙම් සිලෝන් පීඑල්සී	16,823,136	1,983,020	2,098,217
25	ලාෆ් ගෑස් පීඑල්සී	815,346	433,114	806,330
26	ලාෆ් ෆවර් පීඑල්සී	815,346	433,114	230,380
27	ජාතික සංවර්ධන බැංකුව පීඑල්සී	1,078,147,081	923,207,003	863,269,700
28	පීපල්ස් ලීසිං පීඑල්සී	58,420,245	39,417,336	43,451,051
29	පිරමල් ග්ලාස් පීඑල්සී	32,227,612	14,364,973	17,389,178
30	ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට්ස් පීඑල්සී	4,937	39,870	42,600
31	රේණුකා හොල්ඩිංග්ස් පීඑල්සී	114,531,974	49,252,177	56,538,002
32	රිසර්ස් බලශක්ති පීඑල්සී	58,851,088	43,625,999	51,287,875
33	රෝයල් සෙරමික්ස් පීඑල්සී	52,566,675	35,807,370	42,422,387
34	සම්පත් බැංකුව පීඑල්සී	333,971,715	325,203,518	276,670,225
35	සෙලාන් බැංකුව පීඑල්සී	357,120,054	297,346,533	228,102,778
	සෙලාන් බැංකුව (X) පීඑල්සී	74,487,288	56,776,516	48,313,205
36	සිංගර් ෆිනෑන්ස් පීඑල්සී	23,608,130	16,254,048	15,201,628
37	ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී	110,340,299	77,601,418	105,670,016
38	ට්‍රාන්ස් ඒෂියා පීඑල්සී	37,071,514	50,559,584	39,864,288
39	වැලිබල් පවර් පීඑල්සී	47,175,248	33,785,148	32,745,605
40	වැලිබල් වන්පීඑල්සී	43,284,082	29,276,380	30,137,450
	එකතුව	**9,988,914,131**	**7,560,753,853**	**7,487,266,331**

2019 දෙසැම්බර් මස 31 දිනට වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගය මත නොවන වර්ගීකරණය කරන ලද ලැයිස්තු ගත නාවන කොටස් වෙළඳපොල ආයෝජන

	ආයතනයේ නම	විකුණුම් මිල (රු)	ශුද්ධ වත්කම් වටිනාකම (රු)	ශුද්ධ වත්කම් වටිනාකම (රු)
			31.12.2018	31.12.2019
1	සීමාසහිත ෆිච් රේටින් ලංකා	1,649,375	2,186,250	2,856,250
2	සීමාසහිත ෆස්ට් කැපිටල් ට්‍රෙෂරීස්	73,649,700	158,773,500	216,904,950
	එකතුව	**75,299,075**	**160,959,750**	**219,761,200**

2019.12.31 වන දිනට පරිපාලිතයේ ආයෝජන

	ආයතනයේ නම	විකුණුම් මිල (රු)
3	ලංකා ලුණු සමාගම	470,960,938
	එකතුව	**470,960,938**

2019.12.31 වන දිනට ලාභ හෝ අලාභ තුළින් සාධාරන අගය මත වර්ගීකරණය කරන ලද ලැයිස්තුගත කොටස් ආයෝජනය

	ආයතනයේ නම	විකුණුම් මිල	සාධාරණ වටිනාකම	වෙළඳපොල වටිනාකම
		(රු '000)	(රු '000)	(රු '000)
1	ඒසිවිල් කේබල්ස් පීවිල්සී	153,062,370	94,945,959	149,860,649
2	කොමර්ෂල් බැංකුව පීවිල්සී	1,308,552,337	1,096,608,194	920,102,265
	කොමර්ෂල් බැංකුව (X) පීවිල්සී	149,066,768	133,496,470	116,566,567
3	ඩිප්ඩ් ප්‍රොඩක්ට්ස් පීවිල්සී	163,099,055	111,763,525	109,265,282
4	ඩයලොග් ආසියාටා පීවිල්සී	32,003,128	32,003,128	31,142,284
5	හැටන් නැෂනල් බැංකුව පීවිල්සී	404,132,911	386,322,156	322,667,862
	හැටන් නැෂනල් බැංකුව (X) පීවිල්සී	114,124,426	109,391,961	90,033,382
6	ජෝන් කීල්ස් පීවිල්සී	168,088,359	185,576,850	194,914,050
7	ලංකා අයිඕසී පීවිල්සී	92,233,029	57,028,479	45,294,224
8	ලාෆ් ගෑස් පීවිල්සී	3,196,446	1,496,743	2,786,490
	ලාෆ් පවර් පීවිල්සී	3,196,446	1,496,743	796,140
9	සම්පත් බැංකුව පීවිල්සී	768,856,369	683,176,272	544,702,925
10	සෙලාන් බැංකුව පීවිල්සී	78,177,352	72,107,723	55,315,782
	සෙලාන් බැංකුව (X) පීවිල්සී	120,742,492	101,621,414	86,473,397
11	සිංගර් ෆිනෑන්ස් පීවිල්සී	48,442,641	31,574,156	29,529,786
	එකතුව	**3,606,974,129**	**3,098,609,773**	**2,699,451,084**

2019 12 31 දිනට ලැයිස්තුගත ඒකක භාර

	ආයතනයේ නම	විකුණුම් මිල	සාධාරණ වටිනාකම	වෙළඳපොල වටිනාකම
		(රු '000)	(රු '000)	(රු '000)
1	කොම්ට්‍රස්ට් කොටස් අරමුදල	14,261,339	25,146,091	23,660,972
2	ජාතික ස්කන්ධ අරමුදල	41,680,708	114,893,964	116,961,990
3	නාමල් වර්ධන අරමුදල	4,500,000	51,062,355	51,992,325
	එකතුව	**60,442,047**	**191,102,410**	**192,615,287**

1 සාංගමික තොරතුරු

1.1 නීත්‍ය පදිංචි හා නෛතික ආකෘතිය

1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත යටතේ 1981 මාර්තු 01 දින ස්ථාපිත කරන ලද සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය රජය සතු ව්‍යවසායකි. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

ලංකා සෝල්ට් ලිමිටඩ් හෙවත් සීමාසහිත ලංකා ලුණු සමාගම ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත කරනු ලැබ නීත්‍ය පදිංචිය සහිත පොදු සීමිත සමාගමකි. මෙම සමාගමේ ලියාපදිංචි කරන ලද කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය හම්බන්තොට මහලේවාය යන ස්ථානයෙහි පිහිටා ඇත.

1.2 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය

වර්ෂය තුළ, මෙම මූල්‍ය ප්‍රකාශ තුළ සිටිමින් මෙහෙයවන ලද සමාගමට හා එහි අනුබද්ධිත සමාගම්වලට අයත් ප්‍රධාන කාර්යයන් පහත දැක්වෙන පරිදි වූයේ ය.

ආයතනයේ නම	ව්‍යාපාරයේ සවභාවය
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය	රාජ්‍ය සේවා විශ්‍රාම වැටුපට හිමිකම් නොලබන සියලුම රාජ්‍ය සේවක සේවිකාවන් හා පෞද්ගලික අංශට අයත් සියලුම සේවා නියුක්තයන් මෙම අරමුදලෙහි සාමාජිකයන් වන අතර, එම ආයතනයන්හි ඔවුන්ගේ සේවා යෝජකයින් විසින් සේවක සේවිකාවන්ගේ දළ මාසික ඉපයීමෙන් 3% ක් වූ ප්‍රමාණයක් මෙම අරමුදල වෙත ප්‍රේෂණය කළ යුතු වන්නේ ය. මෙම අරමුදලට විගමනික ශ්‍රමිකයන් සහ ස්වයං රැකියා ක්ෂේත්‍රවල නියුතු සේවක සේවිකාවන් ද අන්තර්ගත වේ. මෙම අංශය තවදුරටත් ඉදිරියේදී වඩාත් ප්‍රසාරණය වීමට නියමිතය. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, මෙම අරමුදල කළමනාකරණය කිරීමට අමතර වශයෙන් ස්වකීය සේවා නියුක්තයන්ගේ සේවා කාලය තුළ ඔවුන් වෙත සමාජීය හා සුභසාධන ප්‍රතිලාභ ගණනාවක් සලසා දීමේ කාර්යයෙහි ද නිරතව සිටී.
ලංකා ලුණු සමාගම	මෙම සමාගමෙහි ප්‍රධාන කර්තව්‍යය වනුයේ ලුණු නිෂ්පාදනය කර බෙදා හැරීමයි.

1.3 මව් ව්‍යවසාය සහ අත්‍යන්ත මව් ව්‍යවසාය

සමාගම සතු අත්‍යන්ත මව් ව්‍යවසායක් නොමැත. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය මව් ව්‍යවසාය ලෙස කටයුතු කරයි.

1.4 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම්

2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධාන හා ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති (LKAS/SLFRS) අනුව සමූහයේ සහ මණ්ඩලයේ මූල්‍ය ප්‍රමිති සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සතු වගකීමකි

1.5 නිකුතුව සඳහා බලය පවරන ලද දිනය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශ 2020 පෙබරවාරි මස 27 වන දිනැති අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව ප්‍රකාරව නිකුත් කරනු ලැබීම සඳහා බලය පවරන ලදී.

2 වැදගත් ගිණුම් ප්‍රතිපත්තිවල සම්පිණ්ඩනය

2.1 පොදු ප්‍රතිපත්ති

2.1.1 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශ ඉදිරිපත් කිරීම

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ඉදිරිපත් කරනු ලැබ ඇති ව්‍යාපාර ආයතනය සතු වත්කම් හා බැරකම් වීවාරයේ ස්වභාවය අනුව කාණ්ඩ ගතකර වීවාරයේ සාපේක්ෂ ද්‍රවශීලතාව නිරූපිත වන අයුරින් ලැයිස්තු ගත කර ඇත. මූල්‍ය

ප්‍රකාශ කෙරෙහි බලපෑම් ඇති කරන උද්ධමනීය සාධකයන් සඳහා ගැළපුම් කිසිවක් සිදුකර නොමැත. රජෝර්තු දිනයේ සිට මාස 12 ක් ඇතුළත සහ මාස 12 කට වැඩි කාලයකින් පසුව ආපසු අයකර ගනු ලැබීම් හෝ බේරුම් කරනු ලැබීම් පිළිබඳ විශ්ලේෂණයක් මෙහිදී ඉදිරිපත් කරනු ලැබ තිබේ.

2.1.2 අනුකූලතාව දැක්වීමේ ප්‍රකාශය

2018 දෙසැම්බර් මස 31 වන දින වන විට හා එදිනට අවසන් වර්ෂය සඳහා වන සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා සටහන් ("මූල්‍ය ප්‍රකාශ") සමඟ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් හා වියදම් ප්‍රකාශය, කොටස් හිමිකම් හි වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කරනු ලැබ ඇත්තේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හා අනුකූලතාව දක්වන අයුරිනි. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම 2007 අංක 07 දරන සමාගම් පනතෙහි දක්වා ඇති නියමයන් හා අනුකූල වේ.

සීමාසහිත ලංකා ලුණු සමාගමේ මූල්‍ය ප්‍රකාශ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාර ආයතන සඳහා වන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති හා අනුකූල වන පරිදි පිළියෙළ කරනු ලැබ තිබේ. මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම 2007 අංක 07 දරන සමාගම් පනතෙහි දක්වා ඇති නියමයන් හා අනුකූල වේ.

2.1.3 වැදගත් ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

මණ්ඩලය ස්වකීය අනාගතය සම්බන්ධයෙන් ඇතැම් ඇස්තමේන්තු වලට හා උපකල්පන වලට එළැඹේ. එකී ඇස්තමේන්තු හා විනිශ්චයන් ඓතිහාසික පරිචය හා අනාගත අපේක්ෂා ද ඇතුලත් වෙනත් සාධකයන් මත අඛණ්ඩව ඇගයුමට ලක් කෙරේ.

සීමාසහිත ලංකා ලුණු සමාගමේ මූල්‍ය ප්‍රකාශ කුඩා හා මධ්‍ය පරිමානයේ ව්‍යාපාර ආයතන සඳහා වන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රතිපත්ති හා අනුකූලතාව දැක්වෙන පරිදි සැකසීම සඳහා ඇතැම් සුවිශේෂී ගිණුම් ඇස්තමේන්තු භාවිතය අවශ්‍ය වේ. ඉහළ මට්ටමේ නිශ්චයමතියක් හෝ සංකීර්ණතාවයක් සම්බන්ධ වන්නා වූ ක්ෂේත්‍ර හෝ මූල්‍ය ප්‍රකාශ කෙරෙහි උපකල්පනයන් හා ඇස්තමේන්තු වැදගත් වන්නා වූ ක්ෂේත්‍ර පහත සඳහන් පරිදි හෙළිදරව් කර ඇත.

විනිශ්චයන්

විලම්බිත බදු වත්කම්:

සියලු ආභාවිත බදු අලාභ වෙනුවෙන් විලම්බිත බදු වත්කම් හඳුනා ගැනෙනුයේ, අලාභ උපයෝජනය කොටගත හැකි බදු අයකර ගත හැකි අලාභ එල්ලේ ඒවා පවතිනු ලැබෙතැයි අනුමාන කෙරෙන තාක් දුරකට ය. හඳුනා ගනු ලැබිය හැකි විලම්බිත බදු වත්කම්වල ප්‍රමාණය නිශ්චය කිරීම පිණිස ඉදිරි බදු සැලසුම්කරණයෙහි මූලොපායන් ද සහිත අනාගත බදු අයකර ගත හැකි ලාභ ප්‍රමාණ උද්ගත විය හැකි කාල නිර්ණය හා ඒවායේ මට්ටම මත පදනම් වූ වැදගත් කළමනාකරණ නිශ්චයමතියක් අවශ්‍ය වේ.

2.1.4 මානනය කිරීමේ පදනම

ඇතැම් වත්කම් හා බැරකම් හැරුණු විට මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික සම්මුතිය යටතේ සාධාරණ අගය මත පිළියෙළ කරනු ලැබ ඇත.

සීමාසහිත ලංකා ලුණු සමාගමේ මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනමක් මත පිළියෙළ කරනු ලැබ තිබේ.

2.1.5 ක්‍රියාකාරී හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය

සමාගමේ ක්‍රියාකාරී ව්‍යවහාර මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල අනුසාරයෙන් මෙම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරන ලැබ ඇත. සියලු මූල්‍ය තොරතුරු ශ්‍රී ලංකා රුපියල් අනුසාරයෙන් ඉදිරිපත් කර තිබේ.

2.1.6 වැටයීම

"මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම" පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය - LKAS 1 විසින් අවසර දී ඇති ආකාරයට හැර වෙනත් ආකාරයකින් දක්වා ඇති අවස්ථා හැර, මූල්‍ය ප්‍රකාශනවල ඇති මුල්‍ය ආසන්නතම රුපියල් දහස් ගණනක් දක්වා වටයා ඇත.

2.1.7. හිලව් කිරීම

ගිණුම්කරණ ප්‍රමිතියක් හෝ අර්ථ නිරූපණයක් මගින් අවශ්‍ය හෝ අවසර දී ඇත්නම් මිස ආදායම් ප්‍රකාශයේ ආදායම් හා වියදම් හිලව් කර නැත (IFRS අර්ථ නිරූපණ කමිටුව සහ සම්මත අර්ථ නිරූපණ කමිටුව විසින් නිකුත් කරන ලදී) මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් හිලව් කෙරෙන්නේ සහ මූල්‍ය තත්ව ප්‍රකාශයේ ශුද්ධ අගයන් වාර්තා කෙරෙන්නේ හඳුනාගත් මුදල හිලව් කිරීමට නෛතිකව බලාත්මක අයිතියක් ඇති විට පමණක් වන අතර ශුද්ධ පදනමින් නිරවුල් කිරීමට හෝ වත්කම් හඳුනාගෙන බැරකම් ඒ සමගම නිරවුල් කිරීමට අපේක්ෂා කෙරේ.

2.1.8. ද්‍රවයමය භාවය සහ සමූහනය

සමාන අයිතමයන්ගේ සෑම ද්‍රව්‍ය පංතියක්ම මූල්‍ය ප්‍රකාශවල වෙන්කර දක්වා ඇත. 2016 ජනවාරි 1 වන දින සිට බලපැවැත්වෙන "අනාවරණය කිරීමේ මූලාරම්භය" පිළිබඳව LKAS 1 සහ LKAS 1 වෙත කළ සංශෝධන මගින් අවසර දී ඇති පරිදි එකිනෙකට වෙනස් ස්වභායක් හෝ ක්‍රියාකාරිත්වයක් ඇති අයිතම වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ.

2.1.9 අඛණ්ඩ පැවැත්ම

නුදුරු ආනගත කාලය තුළ ක්‍රියාත්මක ව්‍යාපාරයක් වශයෙන් මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමට ඊට ඇති හැකියාව සම්බන්ධයෙන් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය තක්සේරුවක් කර ඇති අතර ස්වකීය මෙහෙයුම් කටයුතු නොකඩවා සිදුකර ගෙන යාමට අවශ්‍ය තරම් ප්‍රමාණවත් සම්පත් එය සතුව පවතින බවට මණ්ඩලය සෑහීමට පත්ව සිටී. තවද, ක්‍රියාත්මක තත්වයේ ව්‍යාපාරයක් ලෙස ආයතනය පවත්වාගෙන යා හැකි මණ්ඩලයේ හැකියාව සම්බන්ධයෙන් වැදගත් සැක සංකා මතු කෙරන යම් සැලකිය යුතු අවිනිශ්චිතතා පවතීදැයි කළමනාකරණය දැනුවත් නොමැත. එහෙයින්, මණ්ඩලය අඛණ්ඩ පැවැත්මක් සහිත ව්‍යාපාරයක්ය යන පදනම මත පිහිටා එහි මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම නොකඩවා සිදු කෙරේ.

සීමාසහිත ලංකා ලුණු සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය තම සමාගම ක්‍රියාත්මක ව්‍යාපාර තත්වයෙන් පවත්වාගෙන යාමේ ඇති හැකියාව පිළිබඳව තක්සේරුවක් කර ඇති අතර සමාගම සතු ව්‍යාපාරය ඈවර කිරීමට හෝ එහි වෙළඳ කටයුතු නවතා දැමීමට හෝ ඔවුහු අපේක්ෂා නොකරති.

2.1.10 සංසන්දනාත්මක තොරතුරු

සමාගම විසින් ගිණුම් ප්‍රතිපත්ති සුසංගත අයුරින් යොදා ගනු ලැබ ඇති අතර ඉකුත් වසරට අදාළ ගිණුම් ප්‍රතිපත්ති සමඟ ද සාරානුකූල වේ. පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය සංශෝධනය කර ඇති අතර වඩා හොඳ ඉදිරිපත් කිරීමකට අදාළ වන අතර වත්මන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ සැසඳිය හැකිය

2.2 ඒකාබද්ධ කිරීමේ පදනම

(අ) ඒකාබද්ධ කිරීම

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ තුළ, 2018 දෙසැම්බර් මස 31 වන දිනට අයත් සමාගමේ සහ එහි පාලිත සමාගමේ මූල්‍ය ප්‍රකාශ අන්තර්ගත වේ.

පාලිත සමාගම, එය සමාගමට අත්කර ගත් දිනයේ සිට එනම්, සමූහය එහි පාලනය ලබාගත් දිනයේ සිට ඒකාබද්ධ කරනු ලැබ ඇති අතර එකී පාලනය නතර කෙරෙන දිනය දක්වා එසේ ඒකාබද්ධව පැවතීම අඛණ්ඩව සිදුවනු ඇත. පාලිත සමාගමට අයත් මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කරනු ලබනුයේ ද එහි මව් සමාගමට අදාළ සමාන රපෝර්තු කාල පරිච්ඡේදයට අනුව ය.

එසේ වුවද, මෙම ආයතන දෙකෙහි ගිණුම් ප්‍රතිපත්ති වෙනස් වන අතර ඒවා සමූහයට අයත් ගිණුම් ප්‍රතිපත්ති තුළ ඉස්මතු කර දක්වා ඇත.

(ආ) පාලිත සමාගම්

පාලිත සමාගම් යනු, ඡන්දය දීමේ අයිතිවාසිකම් වලට අයත් එක් අර්ධයකට වැඩි ප්‍රමාණයේ කොටස් හිමිකාරීත්වයක් පොදුවේ දරනු ලබන්නාවූ ද, අදාළ මූල්‍ය හා මෙහෙයුම් ප්‍රකාශ සෘජුව හෝ වක්‍රව පාලනය කළ හැකි වන පරිදි සමූහය සතුව බලය පවතින්නා වූ ද සියලුම ව්‍යාපාරික ආයතන වන්නේ ය. දැනට භාවිතා කළ හැකි හෝ පරිවර්තය සේ සැලකෙන ඡන්දය දීමේ අයිතිවාසිකම් පැවතීම හෝ ඒවායින් සිදුවිය හැකි බලපෑම, සමූහය විසින් වෙනත් ව්‍යාපාර ආයතනයක් පාලනය කරනු ලබන්නේ ද යනුවෙන් තක්සේරුවකට එළැඹීමේදී සලකා බැලෙනු ඇත. පාලනය සමූහය වෙත පවරා දෙනු ලබන දිනයේ සිට පාලිත සමාගම් පූර්ණ වශයෙන් ඒකාබද්ධ කෙරේ. එකී පාලනය නතර කෙරෙන දිනයේ සිට ඒවායේ ඒකාබද්ධ කිරීම අත් හැරේ.

වීකාබද්ධ කිරීමේදී මණ්ඩලයට සහ එහි පාලිත සමාගම්වලට අයත් වර්ෂය වෙනුවෙන් ඇතුළත් කරන ලද මුළු ලාභ හෝ අලාභ ප්‍රමාණ සහ වීකාබද්ධ කිරීමේදී අන්තර්ගත කළ මණ්ඩලයට සහ එහි පාලිත සමාගම්වලට අයත් මුළු වත්කම් හා බැරකම් ප්‍රමාණ, වීකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි සහ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි පිළිවෙළින් දක්වා ඇත.

(ඇ) වාර්තාකරන දිනය

පාලිත සමාගම් හී මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කරනු ලබන්නේ පොදු වාර්තා කිරීමේ කාල පරිච්ඡේදය වන දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන්නා වූ දොළොස් මසක කාල සීමාවක් සඳහාය.

2.3 ලාභය සහ අලාභය මානනය කිරීමේ පදනම

2.3.1 ආදායම

ආදායම හඳුනා ගැනෙනුයේ එමඟින් ආර්ථික ප්‍රතිලාභ ව්‍යාපාරික ආයතනය වෙත ගලා එතැයි අනුමාන කෙරෙන හා එම ආදායම විශ්වාසදායක ලෙස මානනය කළ හැකිතාක් දුරකටය. ආදායම හඳුනා ගැනීමට පෙර පහත දැක්වෙන විශේෂිත හඳුනාගැනීමේ නිර්නායක ද සපුරාලිය යුතු වන්නේය.

භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම හඳුනා ගැනෙනුයේ, භාණ්ඩ විකිණීම සඳහා පිටත් කර යවනු ලැබ එහි අයිතිය පවරා දෙනු ලැබ ඇති කල්හී ය. වට්ටම් සහ අලෙවි කටයුතු ආශ්‍රිතව රජය වෙනුවෙන් රැස් කරනු ලබන බදු මුදල් රහිත වූ ලද හෝ ලැබීමට නියමිත මුදල් ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගය මත ආදායම මානනය කෙරේ. ආදායම හඳුනා ගැනීමට පෙර පහත දැක්වෙන විශේෂිත හඳුනා ගැනීමේ නිර්නායක ද සපුරාලිය යුතු වන්නේ ය.

භාණ්ඩ විකිණීම

සාමාන්‍යයෙන් විකිණීම සඳහා භාණ්ඩ පිටත් කරනු ලැබීම මත භාණ්ඩවලට ආවේනික සුවිශේෂී අවදානම් සහ භාණ්ඩවල හිමිකාරිත්වය සතු ප්‍රතිලාභ ඒවා මිලදී ගනු ලබන්නා වෙත පවරා දෙනු ලැබ ඇති කල්හි භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම හඳුනා ගැනේ.

සේවා ඉටු කිරීම

එක් එක් කොන්ත්‍රාත්තුව සඳහා ඇස්තමේන්තුගත කරන ලද මුළු මිනිස් ශ්‍රම පැය ගණනේ ප්‍රතිශතයක් ලෙස වත්මන් දිනය දක්වා වැය කළ මුළු මිනිස් ශ්‍රම පැය ගණන සැලකිල්ලට ගනිමින් නිශ්චය කරන ලබන අදාළ කාර්යයන් නිමකළ අදියරට සැදිහුම් දක්වමින් සේවා ඉටු කිරීම මඟින් ලබා ගන්නා ආදායම හඳුනා ගැනේ. අදාළ කොන්ත්‍රාත් කාර්යයෙහි ප්‍රතිඵලය විශ්වාසදායක ලෙස මිණිය නොහැකි විට ආපසු අයකර ගත හැකි දරන ලද වියදමේ ප්‍රමාණය දක්වා වූ දුරකට පමණක් ආදයම හඳුනා ගැනේ.

පොලිය

වත්කම් මත සඵල පොලී අනුපාතය ගණනය කිරීමේ කාල අනුපාතික පදනමක් මත ආදායම හඳුනා ගැනේ.

2.3.2 පොලී සහ සමාන ආදායම් සහ වියදම්

සියලුම මූල්‍ය උපකරණයන් ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලැබේ. පොලිය දරන මූල්‍ය වත්කම්, ලාභ හෝ අලාභ ගිණුම් හරහා විකිණීම සඳහා පවත්නා මූල්‍ය වත්කම් ලෙස සාධාරණ අගය අනුව වර්ගීකරණය කරනු ලබන අතර පොලී ආදායම හෝ වියදම සඵල පොලී අනුපාත භාවිතයට ගනිමින් වාර්තා කරනු ලැබේ. සඵල පොලී අනුපාතය යනු අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම් වල ඇස්තමේන්තු කළ ආදළ පරිදි වන්නාවූ අපේක්ෂිත ආයු කාලයක් හෝ ඊට අඩු කාලයක් තුළ මූල්‍ය වත්කමෙහි හෝ මුදල් බැරකමෙහි හෝ ශුද්ධ ධාරණ වටිනාකම වේ. එම ගණනය මඟින් මූල්‍ය මෙවලමෙහි දැක්වෙන සියලුම ගිවිසුම්ගත කොන්දේසි (නිදසුනක් වශයෙන් පෙර ගෙවුම් විකල්ප) සලකා බලනු ලබන අතර අදාළ මූල්‍ය මෙවලමට සෘජුවම ආරෝපනය කළ හැකි සඵල පොලී අනුපාතයේ ද මුඛ්‍යාංගයක් වන එහෙත් අනාගත ණය අලාභ නොවන යම් ගාස්තු හෝ වර්ධක පිරිවැය වැනි ගණනයෙහිලා අන්තර්ගත වේ. පොලී ආදායම තුළ කූපන් ආදායම සහ වට්ටම් ක්‍රමක්ෂය කිරීම හෝ මෙවලම් අධි මිල කිරීම මත ලැබූ යම් ලාභ හෝ අලාභ සමන්විත වේ.

දුබලතා අලාභයක් හේතුවෙන් මූල්‍ය වත්කමක හෝ වත්කම් සමූහයක වාර්තා කරන ලද වටිනාකම අඩු කරනු ලැබ ඇති කල්හි දුබලතා අලාභ ගණනය කිරීමේ කාර්යය සඳහා ඉදිරි මුදල් ප්‍රවාහ වට්ටම් කිරීම පිණිස යොදා ගැණුනු මුල් පොලී අනුපාතය භාවිතයට ගනිමින් පොලී ආදායම හඳුනා ගැනීම නොකඩවා සිදු කෙරේ.

සේවා නියුක්තයින්ගේ භාර අරමුදල් මණ්ඩල පනතේ 22 වන වගන්තියට අනුව පොළී වියදම හඳුනාගැනේ. ඉන් කියැවෙනුයේ, "අරමුදලේ ආයෝජනයෙන් ලැබෙන ආදායමෙන්, අමාත්‍ය වරයා සහ මුදල් විෂය භාර අමාත්‍ය වරයාගේ එකඟත්වය ඇතිව මණ්ඩලය විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි, වර්ෂයක සියයට තුනකට නොඅඩු යම් අනුපාතයක පොලියක්, එකී වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනට අරමුදලේ එක් එක් සාමාජිකයාගේ පෞද්ගලික ගිණුමේ බැරට තිබෙන මුදලට එක් එක් වර්ෂය සඳහා ගෙවනු ලැබිය යුතුය" යනුවෙනි.

2.3.3 ලාභාංශ ආදායම් හා වියදම්

ලාභාංශ ආදායමට අදාළ ගෙවීම් ලබා ගැනීමේ ව්‍යාපාරික ආයතනය සතු අයිතිය තහවුරු වූ කල්හි ලාභාංශ ආදායම හඳුනා ගැනේ. ලාභාංශ වියදම් හඳුනා ගැනෙනුයේ, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 14 වන වගන්තිය අනුවය. ඉන් කියැවෙනුයේ, අරමුදලේ මුදල් ආයෝජනයන්ගෙන් ලබා ගත් ලාභවලින් ලාභාංශ ප්‍රකාශ කරනු ලැබිය යුතුය යනුවෙනි.

2.3.4 වෙනත් ආදායම්

සේවකයන්ගේ සේවා කාලය මුළුල්ලේ ක්‍රමක්ෂය කරනු ලබන සේවක මණ්ඩල ණය මුදල්හි සාධාරණ අගය මානනය කිරීම මත ලැබෙන පොළී ආදායම හැරුණු විට, වෙනත් අදාළ ගෙවීම් ලබා ගැනීමේ ව්‍යාපාරික ආයතනය සතු අයිතිය තහවුරු වූ කල්හි වෙනත් ආදායම් හඳුනා ගැනේ.

2.4 බදුකරණය

2.4.1 ප්‍රවර්තන බදු

වාර්තාකරන දිනට පනවන ලද හෝ ප්‍රමාණවත් ලෙස පනවන ලද බදු අනුපාතික සහ ඉකුත් වසරට අදාළව ගෙවිය යුතු බදු සඳහා වන යම් ගැළපුම් යොදා ගනිමින් වර්ෂය සඳහා බදුවන අදායම හෝ අලාභය මත ගෙවිය යුතු හෝ ලැබිය යුතු වන්නා වූ අපේක්ෂිත බදු ප්‍රවර්තන බදු වන්නේ ය.

ක්‍රමක්ෂය ලාභය සහ ආදායම් බදු වියදම පිළිබඳව යුක්ති සහගත මතයක් ලබා ගැනීමේ අරමුණින් යුතුව එය ක්‍රමක්ෂය ලාභ ගිණුමට ආපසු එකතු කරනු ලැබීමේ අටියෙන් වර්ෂය සඳහා වූ භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත් මත ඉපැයූ ආදායමට අදාළ රඳවා ගැනීමේ බද්දෙහි ප්‍රමාණය හඳුනා ගනු පිණිස මණ්ඩලය ස්වකීය ගිණුම් ප්‍රතිපත්තිය වෙනස් කළේය.

ගෙවිය යුතු ප්‍රවර්තන බද්ද පදනම්වී ඇත්තේ වර්ෂය සඳහා බදුවන ලාභය මතය. ආදායම් බදු සඳහා වන ප්‍රතිපාදනය පදනම්වී ඇත්තේ මූල්‍ය ප්‍රකාශවල වාර්තා කර ඇති පරිදි සහ දේශීය ආදායම් පනතේ විධිවිධාන අනුව ආගණනය කර ඇති පරිදි වන්නා වූ අදායම් හා වියදම් මූලාංග මත පිහිටා ය.

2.4.2 විලම්බිත බදුකරණය

විලම්බිත බදු ප්‍රතිපාදනය කරනු ලබනුයේ, වත්කම්වල හා බැරකම්වල බදු පදනම් සහ මූල්‍ය වාර්තාකරණ කාල පරිච්ඡේදය සඳහා වූ ඒවායේ ධාරණ අගයන් අතර ශේෂ පත්‍රයේ දිනට පවත්නා සියලුම තාවකාලික වෙනස්කම් මත බැරකම් ක්‍රමය භාවිතයට යොදා ගනිමිනි.

අනාගතයේදී බදු ගෙවිය යුතු වන ලාභයෙහි ඉහළ යාමක් අපේක්ෂිත සියලුම තාවකාලික වෙනස්කම් වෙනුවෙන් විලම්බිත බදු බැර හඳුනා ගැනේ. අනාගතයේදී බදු ගෙවිය යුතු වන ලාභයෙහි පහළ යාමක් අපේක්ෂිත සියලුම තාවකාලික වෙනස්කම් වෙනුවෙන් ද, යම් අප්‍රයෝජිත බදු අලාභ හෝ අප්‍රයෝජිත බදු බැර සඳහා ද විලම්බිත බදු බැර හඳුනා ගැනේ. ආපසු අයකර නොගැනිමේ වැඩි හැකියාවක් ඇති ඉහළම මුදල් ප්‍රමාණයට, ප්‍රවර්තන හෝ ඇස්තමේන්තුගත අනාගත බදුවන ලාභය පදනම් කරගෙන, විලම්බිත බදු මානනය කෙරේ.

සෑම වාර්තාකරන දිනයකදී ම විලම්බිත බදු වත්කම්වල ශුද්ධ ධාරණ අගය සමාලෝචනයට හසු කෙරන අතර අනාගතයේදී බදු මත ලාභවල ප්‍රවර්තන තක්සේරුව නිරූපණය වනු පිණිස ගළපනු ලැබේ. යම් ගැළපුමක් වෙතොත්, ඒවා ලාභයෙහි හෝ අලාභයෙහි හඳුනා ගැනේ.

විලම්බිත බදු ගණනය කෙරෙනුයේ, විලම්බිත බදු වත්කම උපලබ්ධි වෙතැයි අපේක්ෂා කරන කාල පරිච්ඡේදයට අයත් බදු මත ලභය (බදු ආලභය) කෙරෙහි අදාළ වීමට අපේක්ෂිත බදු අනු ප්‍රමාණ හෝ බේරුම් කළ යුතු වන්නා වූ විලම්බිත බදු බැරකම් අනුව, රජෝර්තු කාල පරිච්ඡේදය අවසානය වන විට පනවා ඇති හෝ ප්‍රමාණවත් ලෙස පනවනු ලැබ ඇති බදු අනු ප්‍රමාණවල පදනම මත පිහිටා ය.

2.5 විදේශ ව්‍යාවහාර මුදල් පරිවර්තනය

සමාගමේ කෘත්‍යාත්මක හා ඉදිරිපත් කරනු ලැබීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල අනුසාරයෙන් මූල්‍ය ප්‍රකාශ පිළිගන්වනු ලැබේ. විදේශ ව්‍යාවහාර මුදල් වලින් සිදු කෙරෙන ගනුදෙනු, අදාළ ගනුදෙනුව සිදුවන දිනයේ පාලනය වන කෘත්‍යාත්මක මුදල් ඒකකය මත මූලික වශයෙන් වාර්තා කරනු ලැබේ. විදේශ ව්‍යාවහාර මුදල් ඒකක වලින් නාමනය කරනු ලබන මූල්‍ය වත්කම් හා බැරකම්, ශේෂ පත්‍රයේ දිනට පාලනය වන කෘත්‍යාත්මක මුදල් ඒකක විනිමය අනුපාතය අනුව නැවත පරිවර්තනය කෙරේ. සිදුවන සියලු වෙනස්කම් ලාභය හෝ අලාභය වෙත උකහා ගැනේ. විදේශ ව්‍යාවහාර මුදල් ඒකකයක අනුසාරයෙන් වෙතිහාසික පිරිවැය ප්‍රකාරව මානනය කරනු ලබන මුදල්මය නොවන අයිතම, අදාළ මූලික ගණුදෙනු සිදුවූ දිනට පැවති විනිමය අනුපාත යොදා ගනිමින් පරිවර්තනය කෙරේ. විදේශ ව්‍යාවහාර මුදල් ඒකකයක් අනුසාරයෙන් සාධාරණ අගය මත මානනය කරනු ලබන මුදල්මය නොවන අයිතම අදාළ සාධරණ අගය නිශ්චය කළ දිනට පැවති විනිමය අනුපාත යොදා ගනිමින් පරිවර්තනය කෙරේ.

2.6 පෙර වසරේ ලාභයට ගැලපීම්

මූල්‍ය ප්‍රකාශනවල සංසන්දනාත්මක බව වැඩි කරන බැවින් දෝෂ නිවැරදි කිරීම් අතීතයට බලපාන පරිදි ගැල්පුම් කෙරෙනු ලැබේ. ඒ අනුව රඳවා ගත් ඉපැයීම්වල ආරම්භක ශේෂය වැනි දෝෂ නිවැරදි කිරීමෙන් පසුව නැවත ප්‍රකාශයට පත් කෙරෙනු ඇත. පහත දක්වා ඇති පූර්ව කාල දෝෂ 2019 වසරේදී සොයායගන නිවැරදි කරන ලදී.

a) පූර්ව වසර ගැලපීම් පහත දෝෂ නිවැරදි කිරීම්වලට ඇතුළත් වේ

නිවැරදි කිරීමේ ස්වභාවය	ශ්‍රීලං රු.000
ගෘහ භාණ්ඩ සහ උපකරණ අලෙවියෙන් ලාභය	(25)
ප්‍රති මිලදීගැනීම් ගිවිසුම් මත පොළිය	(164,000)
ප්‍රති මිලදීගැනීම් ගිවිසුම් මත පොළිය	(105,000)
ලාභාංශ සහ පොළියට අදාළ ආපසු ලැබෙන ප්‍රතිලාභ (චෙක්පත්)	(307)
ලාභාංශ සහ පොළියට අදාළ ආපසු ලැබෙන ප්‍රතිලාභ (ස්ලිප්)	(116)
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු තැන්පතුව මත අපහායනය	(295)
ජාතික සංවර්ධන බැංකු තැන්පතුව මත අපහායනය	(581)
ලාභාංශ මත නිදහස්කරන ලද ආදායම් බද්ද	(8,945)
භාණ්ඩාගාර බැඳුම්කර ඵලය	237
ණයකර ප්‍රතිපාදන	7,450
අධිභාර	5,093
අධිභාර ආදායම මත පොළී ප්‍රත්‍යාවර්තනය	2,408
අධිප්‍රතිපාදන බදු වගකීම	1,631
එකතුව	**(262,450)**

2.7 ආයෝජන සහ වෙනත් මූල්‍ය වත්කම්

2.7.1 වර්ගීකකරණය

2018 ජනවාරි 1 වන දින සිට අරමුල සිය මූල්‍ය වත්කම් පහත මිනුම් කාණ්ඩවල්ට වර්ග කරයි:

- සාධාරණ අගයයන් පසුකාලීනව මැනිය යුතු වීවා (OCI තුළින් හෝ ලාභ හෝ අලාභ තුළින්), සහ
- ක්‍රමක්ෂය පිරිවැයට මැනිය යුතු වීවා.

වර්ගීකරණය රඳා පවත්නේ මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීම සඳහා වන ව්‍යාපාරයේ ආකෘතිය සහ මුදල් ප්‍රවාහයන්ගේ ගිවිසුම් කෙන්දේසි මතය.

සාධාරණ අගයට මනින ලද වත්කම් සඳහා ලාභ සහ පාඩු එක්කෝ ලාභ හෝ පාඩු හෝ OCI තුළ වාර්තා කෙරෙනු ඇත. වෙළෙඳාම සඳහා රඳවා නොගත් ස්කන්ධ උපකරණ සඳහා මෙය පදනම් වන්නේ වෙනත් විස්තීර්ණ ආදායම

තුළින් සාධාරණ අගයට ස්කන්ධ ආයෝජනය (FVOCI) සඳහා මූලිකව හඳුනාගන්නා ලද කාලසීමාවේදී අරමුදල නැවත හැරවිය නොහැකි තේරීමක් කළේද යන්න මතයි.

ව්‍යාපාර මාදිලිය, චිම වත්කම් වෙනස්කම් කළමනාකරණය සඳහා පමණක් වන විට අරමුදල ණය ආයෝජන නැවත වර්ගීකරණය කරයි.

මූල්‍ය වත්කම් - 2018 ජනවාරි 01 (රු. 000)	**FVTPL**	**FVOCI**	**කල්පිරීම සඳහා රඳවා තබාගත්**	**ක්‍රමක්ෂය කළ පිරිවැය**
2017 දෙසැම්බර් 31 අවසාන ශේෂය- LKAS 39	2,511,005	7,858,744	250,624,342	1,782,340
අළෙවිය සඳහා රඳවාගත් වෙනත් මූල්‍ය වත්කම්	-			
ප්‍රකාශිත කොටස් ආයෝජනය දීර්ඝ කාලීන		-		
ප්‍රකාශ නොකළ කොටස් ආයෝජනය		-		
ප්‍රකාශිත ඒකක භාර		-		
භාණ්ඩාගාර බැඳුම්කර			(205,239,775)	205,239,775
ප්‍රකාශිත - විකුණුම්කර			(2,289,134)	2,289,134
ස්ථාවර තැන්පතු			(38,100,000)	38,100,000
ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුම්			(2,940,528)	2,940,528
බැඳුම්කර - බල ව්‍යාපෘතිය			(2,054,906)	2,054,906
වෙනත් ණය සහ ලැබිය යුතු දෑ				-
2018 ජනවාරි 01 ආරම්භක ශේෂය- SLFRS 09	**2,511,005**	**7,858,744**	**0**	**252,406,682**

වෙළෙඳ කළඹ	2,511,005			
ප්‍රකාශිත කොටස් ආයෝජනය දීර්ඝ කාලීන		7,386,330		
ප්‍රකාශ නොකළ කොටස් ආයෝජනය		133,044		
ප්‍රකාශිත ඒකක භාර		339,370		
භාණ්ඩාගාර බැඳුම්කර				205,239,775
ප්‍රකාශිත - විකුණුම්කර				2,289,134
ස්ථාවර තැන්පතු				38,100,000
ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුම්				2,940,528
බැඳුම්කර - බල ව්‍යාපෘතිය				2,054,906
වෙනත් ණය සහ ලැබිය යුතු දෑ				1,782,340

2.7.2. නැවත වර්ගීකරණය

නිවාස ණය ලබාදීමේ ව්‍යාපාරයේ නියතු ප්‍රමුඛ බලපත්‍රලාභී විශේෂිත බැංකු දෙකක් (ජාතික සංවර්ධන බැංකුව සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව) හරහා තම සාමාජිකයින්ට සහ සේවකයින්ට නිවාස ණය පහසුකම් ලබාදීමට කටයුතු කර ඇත. ගිවිසුම් අනුව, බැංකු දෙකම පෙර තීරිත යෝජනා ක්‍රම යටතේ සාමාජිකයින්ට සහ සේවකයින්ට ලබා දෙන ණය සම්බන්ධ පූර්ණ ණය අවදානම සහ පරිපාලනය භාරගැනීමට එකඟ වේ. මණ්ඩලය චිම බැංකු වලට අරමුදල් පමණක් සපයන අතර ඔවුන් චිම අරමුදල් විශේෂිත තැන්පතු ක්‍රමයක් යටතේ හඳුනාගෙන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වෙනුවෙන් වෙනම තැන්පතු ගිණුමක් තුළ පවත්වාගෙන යයි. ඉහත කරුණු සම්බන්ධව සලකා බලා, අදාළ බැංකුවල් ණය යෝජනා ක්‍රම සඳහා කළ තැන්පත් යටතේ හඳුනාගත් අරමුදල් පහසුකම් නැවත වර්ගීකරණය කිරීමට මණ්ඩලය තීරණය කළේය.

2.7.3. හඳුනාගැනීම සහ හඳුනා නොගැනීම

මූල්‍ය වත්කම් සාමාන්‍ය ලෙස කරනු ලබන මිලදී ගැනීම් සහ විකුණුම්, වෙළෙඳ දිනය මත, එනම් චිම අදාළ වත්කම මිලදී ගැනීම හෝ විකිණීම කළ දිනය අනුව හඳුනාගැනේ. මූල්‍ය වත්කම් වෙතින් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති හිමිකම කල් ඉකුත් වූ විට හෝ අරමුදල විසින් හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ මාරු කළ විට මූල්‍ය වත්කම් ශේෂපත්‍රයෙන් ඉවත් කෙරේ.

2.7.4 මැනුම

මුල හඳුනාගැනීමේදී අරමුදල මූල්‍ය වත්කමක් එහි සාධාරණ අගයට අනුව මනිනු ලබන අතර සාධාරණ අගයට නොව ලාභ හෝ පාඩු තුළින් (FVPL) හඳුනාගන්නා විට එම මූල්‍ය වත්කම අත්පත් කරගැනීමට සෘජුව අදාළ ගනුදෙනු පිරිවැය අනුව මනිනු ලැබේ. FVPL ලෙස මනින ලද මූල්‍ය වත්කම් වල ගනුදෙනු පිරිවැය ලාභ හෝ පාඩු තුළ වියදම් කෙරේ.

බද්ධ වූ වියුත්පන්නයන් සහිත මූල්‍ය වත්කම්, ඒවායේ මූල්‍ය ප්‍රවාහ මුල් මුදලක් සහ පොළිය ගෙවීම තීරණය කරන විට සම්පූර්ණ වශයෙන්ම සලකා බැලේ.

2.7.4.1. ණය උපකරණ

ණය උපකාරක පසුව මැනීම රඳා පවතින්නේ වත්කම් කළමනාකරණය කිරීමට අරමුදලේ ව්‍යාපාර මාදිලිය සහ වත්කමේ මූල්‍ය ප්‍රවාහ ගති ලක්ෂණය මතයි. අරමුදල තම ණය උපකාරක වර්ගීකරණය කිරීමේ මිනුම් වර්ග තුනක් තිබේ:

ක්‍රමක්ෂය කළ පිරිවැය: මුදල් ප්‍රවාහ සම්පූර්ණයෙන්ම ක්‍රමක්ෂය පිරිවැය අනුව මනින ලද මූලික සහ පොළී ගෙවීම නියෝජනය කරන විට හිවිසුම්ගත මුදල් ප්‍රවාහ එක් රැස්කිරීම සඳහා රඳවා තබාගත් වත්කම්. මෙම මූල්‍ය වත්කම් වලින් ලැබෙන පොලී ආදායම ඵලදායී පොලී අනුපාත ක්‍රමය භාවිතා කරමින් මූල්‍ය ආදායමට ඇතුළත් කරනු ලැබේ. ශේෂපත්‍රයෙන් ඉවත් කිරීම මත ඇතිවන ඕනෑම ලාභයක් හෝ පාඩුවක්, ලාභ හෝ පාඩු තුළ සෘජුවම හඳුනාගන්නා අතර විදේශ විනිමය ලාභ සහ පාඩු සමග වෙනත් ලාභ/(පාඩු) තුළ දක්වනු ලැබේ. අපහායන පාඩු ලාභ හෝ පාඩු පිළිබඳ ප්‍රකාශය තුළ වෙනම අයිතමයක් ලෙස ඉදිරිපත් කෙරේ.

වෙනත් විස්තීණ ආදායම් තුළින් සාධාරණ අගය (FVOCI): මුදල් ප්‍රවාහ සම්පූර්ණයෙන්ම වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගය අනුව මනින ලද මූලික සහ පොළී ගෙවීම නියෝජනය කරන විට හිවිසුම්ගත මුදල් ප්‍රවාහ එක්රැස්කිරීම සඳහා සහ මූල්‍ය වත්කම් විකිණීම සඳහා රඳවා තබාගත් වත්කම්. අපහායන ලාභ හෝ පාඩු, ලාභ හෝ පාඩු තුළ හඳුනාගන්නා විදේශ විනිමය ලාභ සහ පාඩු හා පොළී ආදායම් හැර, ධාරක අගය තුළ චලනයන් වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් ලබාගනු ලැබේ. මූල්‍ය වත්කම ශේෂපත්‍රයෙන් ඉවත් වන විට, පෙර වෙනත් විස්තීර්ණ ආදායම තුළ හඳුනාගත් සමුච්චිත ලාභ හෝ පාඩු ස්කන්ධ සිට ලාභ දක්වා හෝ පාඩු දක්වා නැවත වර්ගීකරණය කරන අතර වෙනත් ලාභ/(පාඩු) තුළ හඳුනාගනු ලැබේ. මෙම මූල්‍ය වත්කම් වලින් ලැබෙන පොලී ආදායම ඵලදායී පොලී අනුපාත ක්‍රමය භාවිතා කරමින් මූල්‍ය ආදායමට ඇතුළත් කරනු ලැබේ. විදේශ විනිමය ලාභ සහ පාඩු වෙනත් ලාභ/(පාඩු) තුළ ඉදිරිපත් කරන අතර අපහායන වියදම් ලාභ හෝ පාඩු ප්‍රකාශය තුළ වෙනම අයිතමයක් ලෙස ඉදිරිපත් කෙරේ.

ලාභ හෝ පාඩු තළින් සාධාරණ අගය (FVPL): ක්‍රමක්ෂය පිරිවැය හෝ FVOCI නිර්ණායකයන් යටතට නොපැමිනෙන වත්කම් FVPL ලෙස මනිනු ලැබේ. පසුකාලීනව FVPL ලෙස මනිනු ලබන ණය ආයෝජනවල ලාභ හෝ පාඩු, ලාභ හෝ පාඩු තුළ හඳුනාගන්නා අතර එය ඇතිවන කාලය අනුව වෙනත් ලාභ/(පාඩු) තුළ ඉදිරිපත් කෙරේ.

2.7.4.2 කොටස් හිමිකම් උපකරණ

අරමුදල සිය සියලු කොටස් හිමිකම් ආයෝජන සාධාරණ අගයට අනුව පසු කාලීනව මානනය කරයි. අරමුදල් කළමනාකරණය විසින් වෙනත් විස්තීරණ ආදායම් තුළ කොටස් හිමිකම් ආයෝජන මත සාධාරණ අගය සහිත ලාභ හෝ අලාභ ඉදිරිපත් කරනු ලැබීමට තෝරා ගනු ලැබ ඇති අවස්ථාවක දී, අදාළ ආයෝජනය හඳුනා නොගැනීම මත සිදුවන සාධාරණ අගය සහිත ලාභ හෝ අලාභ, ලාභ හෝ අලාභ කරා පසු කාලීනව ප්‍රතිවර්ගීකරණයට යටත් නොවේ. ගෙවීම් ලබා ගැනීම පිළිබඳ වූ අරමුදලට අයත් ස්වකීය අයිතිය තහවුරු වූ කල්හි ලාභ හෝ අලාභ තුළ වීම ආයෝජන වෙතින් උත්පාදනය වන ලාභාංශ වෙනත් විස්තීරණ ආදායම් වශයෙන් හඳුනා ගැනීම නොකඩවා සිදු වේ.

ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය මත ගණනය කරන ලද මූල්‍ය වත්කම්හි සාධාරණ අගයෙහි සිදුවන වෙනස්කම්, අදාළ වන පරිදි ලාභ හෝ අලාභ ප්‍රකාශය තුළ වෙනත් ලාභ / (අලාභ) යටතේ හඳුනා ගැනේ. වෙනත් විස්තීරණ ආදායම් ඔස්සේ මානනය කරන ලද කොටස් හිමිකම් ආයෝජන මත සිදුවන අපහායන අලාභ (සහ අපහායන අලාභ වල ප්‍රත්‍යාවර්තනය) සාධාරණ අගය විෂයෙහි සිදුවන වෙනස්කම් වලින් වෙන් කරනු ලැබ වාර්තා නොකෙරේ.

මූලික මූල්‍ය මෙවලම්
අලෙවිය සඳහා රඳවාගත් මූල්‍ය වත්කම්, කල්පිරෙන තෙක් රඳවාගත් මූල්‍ය වත්කම්, ණය සහ ලැබීම් නියමිත සහ විකුණුම් සඳහා පවත්නා මූල්‍ය වත්කම් යනුවෙන් මූල්‍ය වත්කම් වර්ගීකරණය කෙරේ. මූලික හඳුනා ගැනීමේ අවස්ථාවේදි සමාගම ස්වකීය මූල්‍ය වත්කම් පිළිබඳ වර්ගීකරණය නිගමනය කරයි.

ණය සහ ලැබීම් නියමිත
ණය ලැබීම් නියමිතවලට මුදල් හා කෙටිකාලීන තැන්පතු, ස්ථාවර තැන්පතු සහ වෙළඳ සහ වෙනත් ලැබීම් නියමිත ඇතුළත්වේ. ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගය අනුව ගණනය කෙරෙන මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් හැරුණු විට, සියළුම මූල්‍ය මෙවලම් ආරම්භක අවස්ථාවේදී මානනය කරනු ලබන්නේ ඒවායේ ගණුදෙනු කිරීමේ පිරිවැය සහිත සාධාරණ අගයට අනුවය.

ණය සහ ලැබීම් නියමිත වනුයේ සක්‍රිය වෙළඳපළක් තුළ මිල ප්‍රකාශ නොවූ ස්ථාවර හෝ නිශ්චයාත්මක ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්ය. මූලික මිනුම්කරණයෙන් පසුව එබඳු මූල්‍ය වත්කම් පසුකාලීනව ක්‍රමක්ෂිත පිරිවැය අනුව මානනය කෙරේ. දුබලතා හේතුවෙන් උද්ගතවන අලාභ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

මූල්‍ය බැරකම්
මූල්‍ය බැරකම් වර්ගීකරණය කෙරෙනුයේ කොන්ත්‍රාත්තුමය ගිවිසුමේ හරය සහ මූල්‍ය බැරකම්වල අර්ථකථනය අනුව ලාභය හෝ අලාභය හරහා හෝ වෙනත් මූල්‍ය බැරකම් හරහා සාධාරණ අගයට ගණානය කළ මූල්‍ය බැරකම් වශයෙනි.

ලාභය හෝ අලාභය හරහා ගණානය කරනු ලැබ සටහන් කරනු ලබන මූල්‍ය බැරකම් සම්බන්ධයෙන් හැරුණු විට, සියලුම මූල්‍ය මෙවලම් ආරම්භයේදි මානනය කරනු ලබන්නේ ගණුදෙනු කිරීමේ පිරිවැය සහිත ඒවායේ සාධරණ අගයට අනුවය.

පොලී දරන ණය සහ ණය ගැනුම් ද, වෙනත් මූල්‍ය බැරකම්ද (වෙළඳ හා අනෙකුත් ගෙවීම් නියමිත) ඇතුළු මූල්‍ය බැරකම් ආරම්භක අවස්ථාවේදි මානනය කරනු ලබන්නේ, අත්කර ගැනීම් කෙරහි සෘජුවම ආරෝපනය කළ හැකි ගණුදෙනු කිරීමේ පිරිවැය අඩුකරන ලද සාධාරණ අගය අනුව වන අතර ඒවා පසුකාලීනව සඵල පොලී අනුපාත ක්‍රමය යොදාගනිමින් ක්‍රමක්ෂිත පිරිවැය අනුව මානනය කෙරේ. ක්‍රමක්ෂිත පිරිවැය ගණනය කරනු ලබන්නේ, නිකුතුව මත වන්නාවූ යම් වට්ටම් හෝ අධිමිල සහ සඵල පොලී අනුපාතයේ මුඛ්‍යාංගයක් වන පිරිවැය සැලකිල්ලට ගනිමිනි. මූල්‍ය බැරකමක් හඳුනා නොගනු ලබන්නේ, බැරකම යටතේ පවත්නා බැඳියාව නිදහස් කරනු ලබන හෝ අවලංගු කරනු ලබන හෝ කල්ඉකුත් වන කල්හීය. දැනටමත් පවත්නා මූල්‍ය බැරකමක් සැලැකිය යුතු අයුරින් වෙනස් කම් දක්වන නියමයන් මත එකම පාර්ශවකරුවා විසින් ඉදිරිපත්කරනු ලබන වෙනත් මූල්‍ය බැරකමකින් ප්‍රතිස්ථාපනය කෙරෙන්නේ නම් හෝ දැනටමත් පවත්නා බැරකමක නියමයන් ප්‍රමාණවත් පරිදි වෙනස් කෙරෙන්නේ නම් එබඳු හුවමාරුවක් හෝ අමුතු කිරීමක් මුල් බැරකම නොපිලිගැනිමක් ලෙසත්, නව බැරකමක් හඳුනා ගැනිමක් ලෙසත් සලකනු ලබන්නේය. මුල් මූල්‍ය බැරකමෙහි ධාරණ අගය සහ ගෙවනු ලබන ප්‍රතිෂ්ඨාව අතර වෙනස ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

2.8 දේපළ, පිරියත හා උපකරණ

ආරම්භක අවස්ථාවේදි දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට අනුව හඳුනා ගනු ලැබේ. ගැණුම් මිල සෘජුව ආරෝපනය කළහැකි පිරිවැය සහ කොටස් ගලවා වෙන් කිරීමේ සහ ඉවත් කිරීමේ කටයුතු සඳහා වැලැක්විය නොහැකි ආකාරයේ අනාගතයේ දැරීමට සිදුවන ඇස්තමේන්තු ගත වර්තමාන පිරිවැය පිරිවැයෙහි අන්තර් ගතවේ. ඊට අනුරූප වන්නාවූ බැරකම් ප්‍රතිපාදන තුළ හඳුනා ගනු ලැබේ.

මුල් අවස්ථාවේ තක්සේරු කර පැවති කාර්යසාධන තත්වයෙන් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ යථාවත්ව පවත්වා ගැනිම සඳහා හෝ නඩත්තු කර ගෙන යාම සඳහා දේපළ, පිරියත හා උපකරණ මත සිදුවන අඛණ්ඩවැඩියාව සහ නඩත්තු කටයුතු වෙනුවෙන් දරන වියදම, එය දරන අවස්ථාවේදි කෙරෙන වියදමක් ලෙස ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගැනේ.

නිශ්චල දේපළ (ආයෝජන දේපළ) සම්බන්ධයෙන් හැරුනු විට ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදනය ගණනය කෙරෙනුයේ හීනවන ශේෂ ක්‍රමය අනුවය. සින්නක්කර ඉඩම් සම්බන්ධයෙන් ක්ෂය ප්‍රතිපාදනය කරනු නොලැබේ. අනෙකුත් සියළුම දේපළ, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් ඒවායේ අවශේෂ අගයක් වේනම් එය අඩු කළ එහි ධාරණ අගය ඒවායේ අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ආර්ථික ආයු කාලය මුළුල්ලේ කපා හැරිය හැකිවන අයුරින් ක්ෂවීම් ප්‍රතිපාදනය කරනු ලැබේ. මෙම වත්කම්වල ඇස්තමේන්තු ගත ප්‍රයෝජ්‍ය ආර්ථික ආයු කාලය පහත දක්වා ඇත.

පරිගණක උපකරණ	20%
අනෙකුත් උපකරණ	20%
ලී බඩු	15%
මෝටර් වාහන	25%
සවිකිරීම් හා වැද්දුම්	33.33%

ගොඩනැගිලිවල ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආර්ථික ආයු කාලය අවශේෂ හීනවන ශේෂ ක්‍රමය මත වාර්ෂිකව 6.67% ක් වූ ප්‍රතිශතයක් වශයෙන් හෙළිදරව් කළයුතු වන්නේය.

වත්කම්හි ක්ෂයවීම ආරම්භ වනුයේ, එය භාවිතය සඳහා යොදා ගැනුණු මාසය තුළ සිට වන අතර එය ව්‍යපහරණය කළ මාසය සඳහා ක්ෂයවීම් ගණනය කරනු නොලබයි.

දේපළ, පිරියත හා උපකරණ ආශ්‍රිත අයිතමයක් ඒවායේ ව්‍යපහරණය මත හෝ ඒවායින් අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන විට හෝ හඳුනා ගැනීමක් සිදුනොකෙරේ. එසේ හඳුනා නොගැනීම නිසා උද්ගතවන යම් ලාභයක් හෝ අලාභයක් එකී වත්කම් නොපිලිගැනෙන වර්ෂය තුළ ආදායම් ප්‍රකාශයේ අන්තර්ගත කරනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ ආශ්‍රිත අයිතම සම්මුච්චිත ක්ෂය සහ යම් දුබලතා අලාභ වෙතොත් ඒවා අඩුකරන ලද වෙතිහාසික පිරිවැයට අනුව මානනය කෙරේ. ක්ෂය විම් සඳහා අය කෙරෙනුයේ වාර්ෂික අනුප්‍රමාණ අඩු කළ වත්කම්හි පිරිවැය වෙන්කර දෙනු ලැබිය හැකි අයුරින් වන අතර පහත දැක්වෙන දේපළ,පිරියත හා උපකරණ ක්ෂය විම් සඳහා එය යොදා ගැනේ.

ගොඩනැගිලි හා සින්නක්කර ඉඩම්	2.5%
පිරියත හා යන්ත්‍රෝපකරණ	10%
උපකරණ	10%
ලීබඩු සහ සවිකිරීම්	10%
මොටර් වාහන	
- මහ මාර්ග නහන	10%
- ට්‍රැක්ටර් සහ ට්‍රේලර්	20%
සංවර්ධන වැඩ	20%
වැඩුනු වතුවගා - පොල්	2%

වත්කමක ක්ෂය අනුපාතය, ප්‍රයෝජන ආයු කාලය හෝ අවශේෂ අගය තුළ සැලකිය යුතු වෙනස්කම් කිසිවක් විද්‍යාමාන වේ නම් එම වත්කම ආශ්‍රිත ශේෂය නව අරමුණුපිළිබිඹු වනු පිණිස ඉදිරියට බලාත්මක වෙන පරිදි ප්‍රතිශෝධනය කෙරේ.

දේපළ, පිරියත හා උපකරණ ආශ්‍රිත අයිතමයක් ඒවායේ ව්‍යාපහරණය මත හෝ එහි භාවිතයෙන් හෝ ව්‍යපහරණයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන විට හඳුනා ගැනීමක් සිදු නොකෙරේ. එසේ වත්කම හඳුනා නොගැනීම නිසා උද්ගත වන ලාභයක් හෝ අලාභයක් (ශුද්ධ ව්‍යපහරණ මුදල හා වත්කමෙහි ධාරණ අගය අතර වෙනස වශයෙන් ගණනය කරන ලද) එකී වත්කම පිළිනොගැනෙන වර්ෂය තුළ ලාභයෙහි හෝ අලාභයෙහි අන්තරගත කරනු ලැබේ.

- **පෙළවත්කම්**
  පෙළ වත්කම්, පරිණත වූ පෙළ වත්කම් සහ පරිණත නොවූ පෙළ වත්කම් යනුවෙන් වර්ග දෙකකට බෙදේ. පරිණත වූ පෙළ වත්කම් වනුයේ, අස්වනු ලබා ගත හැකි අයුරින් විශේෂිතත්වයට පත් වූ හෝ නිරතුරුව අස්වනු දැරිය හැකි හෝ වත්කම් වර්ගයෝයි. පරිණත නොවූ පෙළ වත්කම් වනුයේ, මේ වන විටත් අස්වනු ලබා ගත හැකි අයුරින් විශේෂිතත්වයට පත් නොවූ වත්කම් වර්ගයෝයි. පොල් වගා සහ පැල තවාන් පෙළ වත්කම් ලෙස වර්ගීකරණය කෙරේ. ධාරක පෙළ වත්කම්වලට, විකිණීමට හෝ අස්වනු නෙලා ගැනීමට අදහස් නොකරන එහෙත්, කෘෂි නිෂ්පාදන ලෙස අස්වනු ලබා ගැනීම පිණිස යොදා නොග ැනෙන පෙළ වත්කම් ඇතුළත් වේ.අතීත සිද්ධියක ප්‍රතිඵලයක් වශයෙන්, අදාළ වත්කම් හා බැඳී පවත්නා අනාගත ආර්ථික ප්‍රතිලාභ තමන් වෙත ගලා එනු ඇතැයි සහ එම වත්කම්වල සාධාරණ අගය හෝ පිරිවැය විශ්වාසදායක ලෙස මානනය කරනු ලැබිය හැකි වෙතැයි අස්ථිත්වය විසින් අනුමාන කරනු ලබන කල්හී සහ එම අස්ථිත්වය එකී අදාළ වත්කම් පාලනය කරනු ලබන අවස්ථාවක දී පමණක් එම අස්ථිත්වය තම පෙළ වත්කම් හඳුනා ගනියි. පෙළ වත්කම් විෂයයෙහි සිදුවන ස්ථිර හායනයවීම් පූර්ණ වශයෙන් ලාභ හෝ අලාභ ප්‍රකාශයන් හී අයගත කරනු ලැබ, අදාළ අලාභය නිශ්චය වශයෙන් දැන ගැනීමෙන් පසුව, එකී අලාභය සිදුවූ වසර තුළදී එම වත්කම්වලට අයත් ශුද්ධ ඉදිරියට ගෙන යන ගණන් ප්‍රමාණවලට අවකරණය කරනු ලැබේ.

- **ධාරක පෙේවවත්කම්**
  ධාරක පෙේව වත්කම්, අංක 16 දරන ලංකා ගිණුම් ප්‍රමිත - දේපළ, පිරියත සහ උපකරණ අනුව, ඒවායේ සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හායන අලාභ ඇත්නම් ඒවා ද අඩු කරන ලද පිරිවැය මත, මනිනු ලැබේ.පැල සිටුවීම සහ අස්වනු නෙලීම (පැල රෝපණය කරන ලද ප්‍රදේශය මෝරා වැඩුනු අවස්ථාව වන විට) අතර කාලය තුළ සිදුවූ ඉඩම් පිළියෙළ කිරීම, පුනරුත්ථාපනය, අභිනවයෙන් පැල සිටුවීම, නැවත පැල සිටුවීම, භෝග විවිධාංගීකරණය, අතුරු පැල සිටුවීම සහ පොහොර යෙදීම යනාදිය සඳහා වූ පිරිවැය පරිණත නොවූ වගාවන් ලෙස වර්ගීකරණය කෙරේ. මෙම පරිණත නොවූ වගාවන්, එකී පරිණත නොවූ වගාවන් සඳහා මූල්‍යනය සලසනු පිණිස යොදා ගැනුනු දිගු කාලීන ණය මුදල්වලට ආරෝපණය වන පොලී ප්‍රමාණ ද ඇතුළු අනෙකුත් ආරෝපිත වන්නා වූ පොදු කාර්ය වියදම් සහිත වූ සෘජු පිරිවැයට අනුව ගෙන හැර දක්වනු ලැබේ. වසර තුළදී එල දරන ධාරක පෙේව වත්කම්(පොල්)මත දරනු ලබන වියදම්, පරිණත වූ වගාවන් වෙත මාරු කෙරේ.

2.9 ආයෝජන දේපළ

ආයෝජන දේපළ, ඒවායේ ගණුදෙනු කිරීමේ පිරිවැයද ඇතුළුව ආරම්භක අවස්ථාවේදි පිරිවැයට මානනය කෙරේ. මුල් හඳුනාගැනිමෙන් අනතුරුව, වාර්තාකරණ දිනයට අදාල වෙළඳපොළ තත්වය පිළිබිඹු කෙරෙන සාධාරණ අගයට අනුව ආයෝජන දේපළ සටහන් කරනු ලැබේ. ආයෝජන දේපලවල සාධාරණ වටිනාකම තුළ සිදුවන වෙනස්කම් නිසා උද්ගතවන යම් ලාභ හෝ අලාභ ඒවා පැනනගින කාල පරිච්ඡේදය තුළ ආදායම් ප්‍රකාශයෙහි අන්තර්ගත කරනු ලැබේ.

මණ්ඩලය සතු ආයෝජන සෑම තෙවසරකට ම වරක් විවෘත වෙළඳපොළ තුළ පවත්නා අගය අනුව එහි ධාරණ අගයක් වෙතොත් එහි වෙනසද සමග විස්තීර්ණ අදායම් හිණුමෙහි හඳුනාගනු ලැබ ප්‍රත්‍යාගණනය කළ යුතු වන්නේය. ලැබිය යුතු කුලිය ඒවායේ කල්බදු කාල සීමාව මුළුල්ලේ සරල මාර්ග පදනමක් මත විහිදුවා හැරිය යුතුය. යම් කුලී නිවැසියෙකුට කිසියම් දිරිගැන්වීමක් (කුලී රහිත කාල සීමාවක් වැනි) ලබා දෙන්නේ නම්, අදාළ ආයෝජන දේපළෙහි ධාරණ අගයෙන් මෙම පදනම මත කුලී ආදායම් හඳුනා ගැනිමේ ප්‍රතිඵලයක් ලෙස වෙනමම වත්කමක් සේ වාර්තාවූ මුදල් ප්‍රමාණ කිසිවක් බැහැර විය යුතු වන්නේය.

මණ්ඩලය සතුව කොළඹ 02, නවම් මාවතෙහි පිහිටි අක්කර 2 රූඩ් 1 පර්චස් 28 ක වපසරියකින් යුත් ඉඩමක් පවතින අතර එය, රජයේ තක්සේරුකරු විසින් 2017 නොවැම්බර් මස 15 වන දින තක්සේරු කරන ලද්දේ ය. රජයේ තක්සේරුකරුගේ වාර්තාවට අනුව, එම ඉඩමෙහි සාධාරණ අගය රු.3,812,500.000/- ක් වූ ප්‍රමාණයක් දක්වා ඉහළ ගොස් තිබේ.

2.10 අස්පෘෂ්‍ය වත්කම්

2.10.1 බාහිර වශයෙන් අත්කරගන්නා ලද අස්පෘෂ්‍ය වත්කම්

වෙන් වෙන්ව අත්කර ගත් අස්පෘෂ්‍ය වත්කම් ආරම්භක හඳුනා ගැනිමේ අවස්ථාවේදී පිරිවැයට අනුව මානනය කෙරේ. එසේ ආරම්භක හඳුනාගැනිමෙන් අනතුරුව, අස්පෘශ්‍ය වත්කම් ඉදිරියට ගෙන යනු ලබන්නේ, සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත දුබලතා අලාභ අඩුකළ පිරිවැයට අනුවය. අස්පෘශ්‍ය වත්කම්වල ප්‍රයෝජ්‍ය ආයු කාලය නියත හෝ අනියත වශයෙන් තක්සේරු කරනු ලැබේ.

නියත ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් ඒවායේ ප්‍රයෝජ්‍ය ආර්ථික ආයු කාලය තුළ ක්‍රමක්ෂය කරනු ලබන අතර අදාළ අස්පෘශ්‍ය වත්කම දුබලත්වයට පත්ව ඇති බවක් විද්‍යාමාන වන කල්හි ඒවායේ දුබලතා විල්ලේද තක්සේරු කිරීමක් කරනු ලැබේ. යටත් පිරිසෙයින් එක් වාර්තකරණ කාල පරිච්ඡේදයක් අවසානයේදී, නියත ප්‍රයෝජ්‍ය ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කමක් සඳහාවූ ක්‍රමක්ෂය කිරීමේ කාල පරිච්ඡේදය සහ අදාළ ක්‍රමක්ෂය කිරීමේ ක්‍රමය සමාලෝචනයට භාජනය කෙරේ. වත්කමෙහි අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ආයු කාලය තුළ හෝ වත්කම තුළ අඩංගු අනාගත ආර්ථික ප්‍රතිලාභවල අපේක්ෂිත පරිභෝජන රටාව තුළ සිදුවන වෙනස්කම් සුදුසු පරිදි ක්‍රමක්ෂය කිරීමේ කාලසීමාව හෝ ක්‍රමය වෙනස් කරමින් සලකා බලනු ලබන අතර ගිණුම් ඇස්තමේන්තු තුළ සිදුවන වෙනස්කම් ලෙස සලකනු ලබන්නේය. නියත ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් මත සිදුවන ක්‍රමක්ෂය වියදම් අදාළ අස්පෘශ්‍ය වත්කමෙහි ක්‍රියාකාරිත්වය හා අනුකූල වන පරිදි වියදම් කාණ්ඩය තුළ අදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනු ලැබේ.

අස්පෘශ්‍ය වත්කමක් හඳුනා නොගැනීමෙන් උද්ගතව වන ලාභ හෝ අලාභ, ශුද්ධ ව්‍යපහරණ මුදල සහ වත්කමෙහි ධාරණ අගය අතර වෙනස ලෙස මානනය කරනු ලබන අතර එකී වත්කම නොපිලිගැනෙන අවස්ථාවේදී,එය අදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

2.10.2 පරිගණක මෘදුකාංග පැකේජ

පරිගණක මෘදුකාංග පැකේජ අත්කරගැනීමේ සහ වැඩිදියුණු කිරීමේ අවස්ථාවේදී දරනුලබන මුදල අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා ගනු ලබන අතර වසර තුනක කාල සීමාවක් ඔස්සේ ක්‍රමක්ෂය කරනු ලැබේ.

2.11 කල්බදු දේපළ

දේපළ, පිරියත හා උපකරණ යටතේ කලින් වර්ගීකරණය කර තක්සේරුව අනුව සටහන් කරන ලද ඉඩම් පරිහරණය පිළිබඳ අයිතිවාසිකම් ඇතුළත් කල්බදුකර දේපළ, "කල්බදුකර දේපළ" ලෙස නැවත වර්ගීකරණය කරනු ලැබ තිබේ. හම්බන්තොට පිහිටි ඉඩම සඳහා ගෙවන ලද කල්බදු මුදල වසර 30ක් වූ කල්බදු කාල සීමාවක් මුළුල්ලේ ප්‍රාග්ධනීකරණය කර ක්‍රමක්ෂය කරනු ලැබ ඇත.

2.11.1 මෙහෙයුම් කල්බදු

හිමිකාරිත්වය කෙරෙහි ආනුෂංගික වන්නාවූ අවදානම් හා ප්‍රතිලාභ සියල්ල ප්‍රමාණවත් පරිදි මණ්ඩලය වෙත (මෙහෙයුම් කල්බදු) මාරු කරනු නොලබන අවස්ථාවේදි, බදුකරය යටතේ ගෙවිය යුතුවන්නාවූ මුළුකුලී මුදල් ප්‍රමාණ බදු කාලසීමාව මුළුල්ලේ සරල මාර්ග පදනමක් මත විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට අයගත කෙරේ.

2.11.1 මෙහෙයුම් කල්බදු

හිමිකාරිත්වය කෙරෙහි ආනුෂංගික වන්නාවූ අවදානම් හා ප්‍රතිලාභ සියල්ල ප්‍රමාණවත් පරිදි මණ්ඩලය වෙත (මෙහෙයුම් කල්බදු) මාරු කරනු නොලබන අවස්ථාවේදි, බදුකරය යටතේ ගෙවිය යුතුවන්නාවූ මුළුකුලී මුදල් ප්‍රමාණ බදු කාලසීමාව මුළුල්ලේ සරල මාර්ග පදනමක් මත විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට අයගත කෙරේ.

2.12 වට්ටෝරු භාණ්ඩ

වට්ටෝරු භාණ්ඩ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි වටිනාකම යන මුදලින් අඩු අගයට ගණනය කරනු ලැබේ. එසේ ගණනය කරනු ලබන්නේ අභාවිත හා මන්දගාමීව චලනය වන වට්ටෝරු භාණ්ඩවලට නියමිත පරිදි අවශ්‍ය ඉඩ සලසාදීමෙන් පසුවය.

අභාවිත හා මන්දගාමීව චලනය වන වට්ටෝරු භාණ්ඩවලට නියමිත පරිදි අවශ්‍ය ඉඩ සලසාදීමෙන් පසු එකී වට්ටෝරු භාණ්ඩ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි වටිනාකම යන මුදලින් අඩු අගයට ගණනය කරනු ලැබේ. ශුද්ධ උපලබ්ධි වටිකාම යනු, සාමාන්‍ය වෙළෙඳ ක්‍රියා මාර්ගය තුළ අදාළ වට්ටෝරු භාණ්ඩ විකුණුම සම්පූර්ණ කිරීම පිණිස ඇස්තමේන්තුගත පිරිවැය හා අදාළ විකුණුම් සිදුකිරීම සඳහා අවශ්‍ය වන්නාවූ ඇස්තමේන්තුගත පිරිවැය අඩුකරන ලද එය විකුණනු ලැබිය හැකි මිලය.

පහත දැක්වෙන පිරිවැය විධික්‍රම උපයෝගී කර ගනිමින්, අදාළ වට්ටෝරු භාණ්ඩ ඒවායේ වර්තමාන ස්ථානයට හා තත්වයට ගෙන ඒම සඳහා වැය කරන ලද වියදම ගණනය කරනු ලැබේ.

අමුද්‍රව්‍ය -	පළමුව පැමිණ පළමුව පිටවන පිරිවැය පදනම මතවූ ගැනුම් වියදම අනුව
නිමි භාණ්ඩ -	සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය සහ සුදුසු ප්‍රාදේශිය නිෂ්පාදන පොදු කාර්ය වියදම්වල අනුපාතයන් සඳහාවූ වියදම අනුව
කෙරෙමින් පවත්නා වැඩ-	ඝනත්වයේ 12 වන මට්ටමට සහ ඉන් ඉහළට තැන්පත්ව පැවති ලුණුවල ගණනය කරන ලද ප්‍රමාණයට අනුව විභජනය කරන ලද පසුගිය අස්වනු වාරයේදි පැවති කරදිය සංසරණය සහ ලුණු ලියැදි සැකසිමේ වියදම්න් 25% ක්වූ ප්‍රමාණයට අනුව
පරිභෝජ්‍ය ද්‍රව්‍ය හා අමතර කොටස්-	පළමුව පැමිණ පළමුව පිටවන පදනම මත ගැනුම් පිරිවැය අනුව

ශුද්ධ උපලබ්ධි වටිනාකම යනු සාමාන්‍ය ක්‍රියා මාර්ගය තුළ විකුණුම් සම්පූර්ණ කිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය සහ විකුණුම් සිදු කිරීම සඳහා අවශ්‍ය වන්නාවූ ඇස්තමේන්තුගත පිරිවැය අඩුකරන ලද ඇස්මේන්තු ගත විකුණුම් මිලය.

2.13 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම

2.13.1 සේවක ප්‍රතිලාභ

මණ්ඩලය සන්තකයේ නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් හා නිශ්චිත දායකත්ව සැලසුම් යන දෙවර්ගය ම පවතී. නිශ්චිත දායකත්ව සැලසුමක් යනු, මණ්ඩලය විසින් වෙනත් ආයතනයකට ස්ථාවර දායක මුදල් ගෙවනු ලැබීමක් යටතේ ක්‍රියාත්මක වන විශ්‍රාම සැලසුමකි. නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් මගින්, සේවකයා ස්වකීය සේවයෙන් විශ්‍රාම ගැනිමේදි තමාගේ සේවා කාලය හා ඊට අදාළ වන්දි මුදල මත පදනම්ව ලබා ගන්නා විශ්‍රාම වැටුප් මුදලකි.

2.13.2 නිශ්චිත දායකත්ව සැලසුම්

අදාළ ව්‍යවස්ථා සහ රෙගුලාසි ප්‍රකාරව සේවක සේවිකාවන්ට සේවක අර්ථසාධක අරමුදල් මණ්ඩලයේ දායකත්වයට සහ සේවා නියුක්තයින්ගේ භාර අරමුදල් මණ්ඩලයේ දායකත්වයට සුදුසුකම් ලැබේ. මණ්ඩලය විසින් සේවක සේවිකාවන්ගේ දළ පාරිශ්‍රමිකයෙන් 15% ක් සහ 3% ක් වනසේ පිළිවෙළින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායක මුදල් ගෙවනු ලැබේ.

පවත්නා ව්‍යවස්ථා සහ රෙගුලාසි ප්‍රකාරව සියලුම සේවක සේවිකාවන්ට සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වයට සහ සේවා නියුකතයන්ගේ භාර අරමුදලේ දායකත්වයට සුදුසුකම් ලැබේ.සමාගම විසින් සේවක සේවිකාවන්ගේ දළ පාරිශ්‍රමිකයෙන් 12% ක් සහ 3% ක් වනසේ පිළිවෙළින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායක මුදල් ගෙවනු ලැබේ.

2.13.3 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික

සේවක ප්‍රතිලාභ නැමති ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිත අංක 19 අනුව සියළුම සේවක සේවිකාවන් සඳහා ඔවුන්ගේ සේවා කාලයේ පළමු වසරේ සිට විශ්‍රාම පාරිතෝෂිත ලබාගනු පිණිස ප්‍රතිපාදන සලසා දෙනු ලැබ ඇත. එසේ වුවද 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත අනුව, වසර පහක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව පමණක් සේවකයෙකුට එලෙස පාරිතෝෂිත මුදල් ගෙවීමේ වගකීම උද්ගත වන්නේය. මෙම වගකීම් දැරීම බාහිර වශයෙන් මූල්‍යයනය කෙරෙන්නක් නොවේ.

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු, නිශ්චිත දායකත්ව සැලැස්මක් නොව පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ සැලස්මකි. නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම සැලැසුම් මත ආයතනයේ ශුද්ධ බැදියාව, ප්‍රවර්තන හා පූර්ව සේවා කාල පර්චිඡේදයන් සඳහා සේවක සේවිකාවන්ගේ සේවා දායකත්වය මත උපයන ලද අනාගත ප්‍රතිලාභ ඇස්තමේන්තු කිරීම මගින් ගණනය කරනු ලබන අතර එම ප්‍රතිලාභය අදාළ වර්තමාන වටිනාකම තීරණය කිරිම සඳහා වට්ටම් කරනු ලැබේ. යම් හඳුනානොගත් පූර්ව සේවා පිරිවැයක් වෙතොත් ඒවා අවකරණය කරනු ලැබේ.

ආයතනය සතු බැඳියාවන් හි නියමයන් සමඟ සන්නිකර්ෂනීය වන්නාවූ කල්පිරීමේ දිනයන් ඇත්තාවූ ද, අදාළ ප්‍රතිලාභ ගෙවනු ලැබීම අපේක්ෂිත එක හා සමාන ව්‍යාවහාර මුදල් ඒකක අනුව නාමනය කරනු ලැබ ඇත්තාවුද රපෝර්තු දිනට පවත්නා උසස් තත්වයේ සංස්ථාපිත බැඳුම්කරවල ඵලදාව වට්ටම් අනුපාතය වන්නේය. අදාළ ගණනය කිරීම ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය යොදා ගනිමින් සුදුසුකම් ලත් ආයුගණක විශේෂඥයෙකු ලවා වාර්ෂිකව ඉටු කරවා ගනු ලැබේ.

සැලසුමක අඩංගු ප්‍රතිලාභ වැඩි දියුණු වන කල්හි සේවක සේවිකාවන් විසින් ඉටු කරන ලද අතීත සේවයට අදාළ ඉහළ ප්‍රතිලාභවලට අයත් කොටස, එකි ප්‍රතිලාභ පවරා දෙනු ලබන තෙක්වූ සාමාන්‍ය කාල සීමාව මුළුල්ලේ සරල මාර්ග පදනමක් මත ලාභයෙහි හෝ අලාභයෙහි හඳුනා ගැනේ. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් තුළින් උද්ගතවන සියලු ජීවගණක ලාභ හෝ අලාභ වෙනත් විස්තීර්ණ ආදායම තුළ ආයතනය විසින් හඳුනා ගනු ලැබේ.

සේවක සේවිකාවන්ගේ සේවා කාලය මත හා ඔවුන් විසින් දැනට ලබන මාසික වැටුප්හි ප්‍රතිශතය මත අදාළ ප්‍රතිලාභ පදනම්වී ඇති කල්හි තම සියලුම නිත්‍ය සේවක සේවිකාවන් ආවරණය කරමින් සැදුම්ලත් අරමුදල් නොසැපයූ දායකත්ව නොවන නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් සමාගම සතුව පවතී. අදාළ වගකීමෙහි වටිනාකම ගණනය කිරීමෙහිලා ඇස්තමේන්තුගත අනාගත වැටුප් වැඩිවිමිවල සරල කිරීම්ද, වත්මන් සේවක සේවිකාවන්ගේ අනාගත සේවා කාලද, වත්මන් සේවක සේවිකාවන්ගේ සේවාස්ථ මර්ත්‍යතාව ද 28.19 වගන්තිය ප්‍රකාරව උපයෝගි කරගනු ලැබ තිබේ. පාරිතෝෂිකයට අදාළ වගකීම සම්බන්ධයෙන් අරමුදල් සපයනු ලැබ නොමැති අතර එය ආයුගණක වශයෙන් අගයනු ලැබද නොමැත.

2.14 හිමිකම

2.14.1 සාමාජික අරමුදල

වර්ෂය තුළ සාමාජික සාමාජිකාවන් වෙත ගෙවන ලද ආපසු ගෙවිය යුතු අරමුදල් අඩුකරන ලද සාමාජික සාමාජිකාවන් වෙතින් ලද හා ලැබිය යුතු දායක මුදල් ඊට ඔවුන් වෙනුවෙන් උපචිත වන්නාවූ පොලි හා ලාභාංශද සමඟ සාමාජික අරමුදල සමන්විත වන්නේය.

2.14.2 ලාභාංශ

ලාභාංශ හඳුනාගනු ලබනුයේ, ඒවා ලැබගැනිමේ අරමුදල සතු අයිතිය තහවුරු වූ කල්හිය.

2.14.3 සංචිත

ප්‍රත්‍යාගණන සංචිතය, සින්නක්කර ඉඩමෙහි හා ගොඩනැගිලිවල ප්‍රත්‍යාගණනයට අදාළ වන අතර අදාළ ප්‍රත්‍යාගණන දිනයට පවත්නා ඉඩම් හා ගොනැගිලිවල සාධාරණ අගයෙහි වෙනස්කම් ඉන් නියෝජනය කරයි. ඒ අනුව, නවම් මාවතේ පිහිටි ඉඩමේ ගැණුම් පිරිවැය ඉක්මවූ වෙළඳපොළ වටිනාකමේ ඉහළ යාම අනුව සංචිතය ගොඩ නැගී ඇත.

රඳවාගත් ඉපැයුම් ගිණුමෙන් ලාභාංශ හා පොලි ගෙවීමෙන් පසුව උද්ගතවන අතිරික්ත ලාභය මණ්ඩලය විසින් ලාභාංශ සමකිරීමේ සංචිත ගිණුමට මාරුකරනු ලබයි. මෙම සංචිතය පිහිටුවීමේ අරමුණ වනුයේ, මතු අපේක්ෂිත ලාභාංශ ගෙවීම් සපුරාලීමත්, රඳවාගත් ඉපැයුම් වෙතින් මුදල් විගලනය අඩුකිරීමත් යන කරුණුය.

වත්කම් හඳුනා නොගැනීම හෝ ඒවා දුබලතාවයට පත්වන තෙක් විකුණුම් සඳහා පවත්නා මූල්‍ය ආයෝජනවල සාධාරණ අගයෙහි සමුච්චිත ශුද්ධ වෙනස විකුණුම් සඳහා පවත්නා සංචිතය තුළ සමන්විත වේ.

2.15 ප්‍රතිපාදන

අවිනිශ්චිත කාල නිර්ණ සහ මුදල් ප්‍රමාණ හා බැඳි බැරකම් සඳහා මණ්ඩලය විසින් ප්‍රතිපාදන හඳුනා ගනු ලැබ ඇත. රපෝර්තු දිනය වන විට අදාළ බැඳියාව නිරවුල් කරනු පිණිස අවශ්‍ය වන්නාවූ වියදමෙහි ප්‍රශස්තම වියදම් ඇස්තමේන්තුව මත ප්‍රතිපාදනය මනිනු ලැබ මුදලෙහි කාල වටිනාකම හා බැඳි වර්තමාන වෙළඳපොල තක්සේරුව මත සහ අදාළ බැරකමට විශේෂිත වන්නා වූ අවදානම් පිළිබිඹු වන බදු පූර්ව අනුප්‍රමාණයක් මත එය වට්ටම් ගත කරනු ලැබේ.

අතීත සිදුවිම්වල ප්‍රතිඵලයක් වශයෙන් සමාගම සතුව වර්තමාන නෛතික හෝ සම්ප්‍රයුක්ත බැඳියාවක් පවත්නා විට ද, අදාළ බැඳියාව නිරවුල් කිරීම පිණිස ආර්ථික ප්‍රතිලාභ පවරාදීමක් අවශ්‍ය වේදැයි යනුවෙන් හෝ අදාළ මුදල විශ්වාසදායක අයුරින් ඇස්තමේන්තු කළ හැකි වේදැයි යනුවෙන් අනුමානයක් පවතින කල්හිද නෛතික හිමිකම් ඉල්ලා සිටීම සඳහා ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ.

අදාළ මුදලෙහි කාල වටිනාකම හා බැඳි වර්තමාන වෙළඳපොළ තක්සේරුව සහ එකී බැඳියාවට අදාළ වන්නා වූ විශේෂිත අවදානම් පිළිබිඹු වන බදු පූර්ව අනුප්‍රමාණයක් යොදා ගනිමින් එම බැඳියාව නිරවුල් කිරීම සඳහා අවශ්‍යවන්නාවූ අනාගත මුදල් ප්‍රමාණයෙහි වර්තමාන වටිනාකම මත ප්‍රතිපාදනය මනිනු ලැබේ. කල්ගතවීම නිසා ප්‍රතිපාදනයෙහි සිදුවන වැඩිවිම් පොලි වියදමක් ලෙස හඳුනා ගනු ඇත.

2.16 වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂයන්

බොහොමයක් විකුණුම් සිදු කෙරෙනුයේ සාමාන්‍ය ණය කොන්දේසි පදනමක් මතය. ඊට අදාළ ලැබිම් නියමිත තුළ පොලී නොදැරේ. සාමාන්‍ය ණය කොන්දේසි ඉක්මවා යමින් ණය විස්තාරණයක් සිදුවන අවස්ථාවකදී සවල පොලී අනුපාතය උපයෝගි කර ගනිමින් ලැබිම් නියමිත ගණනය කෙරෙනුයේ ක්‍රමක්ෂිත පිරිවැයට අනුවය. එක් එක් රපෝර්තු කාල පරිච්ඡේදය අවසානයේදි වෙළඳ හා වෙනත් ලැබිම් නියමිතවල ධාරණ අගය, අදාළ මුදල් ප්‍රමාණ ආපසු අයකර ගත නොහැකි වෙතැයි යනුවෙන් යම් විෂය නිශ්‍රිත සාක්ෂි පවතීදැයි නිශ්චය කරනු පිණිස සමාලෝචනයට භාජනය කරනු ලැබේ. එසේ පවතීනම්, වහාම ලාභය හෝ අලාභය තුළ දුබලතා අලාභයක් හඳුනා ගනු ඇත.

2.17 ගෙවිය යුතු වෙළඳ ශේෂයන්

වෙළඳ ගෙවීම් නියමිත යනු සාමාන්‍ය ණය කොන්දේසි මත වන්නාවූ බැඳීම් වන අතර, ඒ සඳහා පොළී නොදැරේ. විදේශ ව්‍යාවහාර මුදල් ඒකකයකින් නාමනය කරන ලද වෙළඳ ගෙවීම් නියමිත වාර්තාකරණ දිනය වන විට පවත්නා විනිමය අනුපාතය යොදා ගනිමින් ශ්‍රී ලංකා රුපියලට පරිවර්තනය කෙරේ. විදේශ ව්‍යාවහාර මුදල් විනිමය ලාභ හෝ අලාභ වෙනත් ආදායම තුළ හෝ වෙනත් වියදම් තුළ අන්තර්ගතවේ.

2.18 මුදල් හා මුදලට සමාන දෑ

මුදල් හා මුදලට සමාන දෑ යනු දන්නා මුදල් අගයන්ට යුහුසුළුව පරිවර්තනය කළහැකි සහ වටිනාකම හා බැඳි වෙනස්කම්වල සැලකිය නොහෙන අවදානමකට යටත් අතැති මුදල් ද, ඍණික තැන්පතු ද, කෙටිකාලීනවූ අතිශය ද්‍රවශීල ආයෝජනද වන්නේය.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යය සඳහා, මුදල් හා මුදලට සමාන දෑ තුළ පරිශේෂව පවත්නා බැංකු අයිරා අඩුකරන ලද අතැති මුදලද, බැංකුවෙහි ඇති තැන්පතුද අඩංගු වන්නේය. කෙටිකාලීන කල්පිරීමක් සහිත ආයෝජන වනම්, ඒවා අත්කරගත් දින සිට තෙමසක් හෝ ඊට අඩු ආයෝජනයන්ද සැලකෙනුයේ මුදලට සමාන දෑ ලෙසය.

2.19 ප්‍රදාන සහ සහනාධාර

ප්‍රදාන ලැබේය යනුවෙන් හා සියලුම සම්බන්ධිත කොන්දේසි අනුව කටයුතු කර ඇතැයි යනුවෙන් යුක්ති සහගත සහතිකයක් පවත්නා අවස්ථාවකදී ප්‍රදාන හඳුනා ගනු ලැබේ. ප්‍රදානය යම් වියදම් අයිතමයකට අදාළ වන කල්හී අදාළ ප්‍රදානය ක්‍රමවත් පදනමක් මත වන්දි ගෙවනු පිණිස අදහස් කරන පිරිවැය හා ගැළපීම සඳහා අවශ්‍ය වන්නාවූ කාල පරිච්ඡේදය මුළුල්ලේ පවත්නා ආදායමක් ලෙස හඳුනා ගනු ලබනවා ඇත. ප්‍රදානය යම් වත්කමකට අදාළ වන කල්හි එය විලම්බිත ආදායමක් ලෙස ස්ථාපනය කෙරේ. මුදල්මය නොවන ප්‍රදාන සමාගම විසින් ලබා ගන්නා අවස්ථාවකදී අදාළ වත්කම හා එම ප්‍රදානය නාමික මුදල් වටිනාකම් මත සටහන් කරනු ලබන අතර පහත දැක්වෙන පරිදි සමාන වාරික කොටස් මගින් අදාළ වත්කමෙහි අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ආයු කාලය මුළුල්ලේ ආදායම් ප්‍රකාශය වෙත එය මුදා හරිනු ඇත.

ලද ප්‍රදාන ප්‍රතිවර්තන ගිණුමකට බැර කරනු ලබන අතර පහත දැක්වෙන පරිදි ආදායම් ප්‍රකාශය තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ.

අයඩීකරණ පිරියත සඳහා ප්‍රදානය	10%
ගොඩනැගිල්ල සඳහා ප්‍රදානය	2.5%
පොම්පාගාරය සඳහා ප්‍රදානය	2.5%
සේවක වන්දි සඳහාවූ ප්‍රදානය	- ගෙවූ වන්දි මුදලින් අඩු කෙරේ.

2.20 වත්කම් අපහායනය

2.20.1 මූල්‍ය වත්කම් අපහායනය

SLFRS 9 අනුව ණයකර ආයෝජන සහ ක්‍රමක්ෂය පිරිවැයෙන් මනිනු ලබන වෙනත් මූල්‍ය උපකරණ සඳහා අපේක්ෂිත ණය පාඩු සඳහා මණ්ඩලය ප්‍රතිභාගයක් වාර්තා කරයි.

ඉදිරි දැක්මක් සහිත අවස්ථා ඇතුළත් කිරීම
අලාභ පාඩු ආකෘතියට ප්‍රතිවිරුද්ධව, SLFRS 9 විසින් හඳුන්වා දුන් ECL ආකෘතිය යටතේ අනාගත අපේක්ෂිත පාඩු තක්සේරු කිරීම අවශ්‍ය වේ. ඒ සඳහා ඉදිරි දැක්මක් සහිත සර්ව ආර්ථික දත්ත සහ ආයතනයට සෘජුව සම්බන්ධ නොවන උපකල්පන භාවිතා කිරීම අවශ්‍ය වේ. මෙය ආර්ථික සාධක ගැලපුම හරහා හානිය ගණනය කිරීම තුළට ඇතුළත් කර ඇත.

ණය සුරැකුම්පත් තුළ ආයෝජනය සඳහා අපහායන එළඹුම (FVTPL නොවන)
ප්‍රතිපාදන ස්ථාපිතකිරීම සඳහා බාහිර ණය ශ්‍රේණිගත කිරීමේ දත්ත භාවිතා කළ හැකිය. තව දුරටත් ණය ශ්‍රේණිගත කිරීම්වල පිරිහීම, ප්‍රකාශිත මූල්‍ය සහ වෙනත් තොරතුරු සමාලෝචනය කළ යුතුව ඇත්නම් යාවජීව ප්‍රතිපාදනයන් සැකසීම සඳහා ණය අවදානමෙහි සැලකිය යුතු වැඩි වීමක් සහ උපකරණ ආයෝජන ශ්‍රේණියක් ද යන්න තක්සේරු කිරීම සඳහා ය. බාහිර ශ්‍රේණිගත කිරීමේ දත්ත නොමැති විට, ECL ස්ථාපිතකිරීම සඳහා ව්‍යුහාත්මක ක්‍රම / ණය පැතිරීම් / ණය ලකුණු භාවිතා කර ගෙවීම් පැහැර හැරීමේ අනුපාත ස්ථාපිතකළ යුය.

අපේක්ෂිත ණය පාඩුවල (ECL) මූලික සංරචක

- **ගෙවීම් පැහැර හැරීමේ සම්භාවිතාව තක්සේරුකිරීම**
  ණයකර, ස්ථාවර තැන්පතු සහ ණය සහ ලැබිය යුදේ සඳහා වෙතිහාසික ගෙවීම් පැහැර හැරීමේ දත්ත නොතිබූ හෙයින්, S&P Global Ratings විසින් ප්‍රකාශයට පත් කළ 2018 Annual Global Corporate Default Study and Rating Transitions හි දත්ත භාවිතා කරන ලදී.

- **පාඩු ඇති කරන පැහැර හැරීම් (LGD) තක්සේරුකිරීම**
  ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් SLFRS 9 අදාළ කරගැනීම සම්බන්ධව බල්පත්‍රලාභී බැංකුවලට නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුව, දත්ත හෝ ආදාන මඳවීම නිසා බලපත්‍රලාභී බැංකුවකට පාඩු ඇති කරන පැහැර හැරීම් ගණනය කරගැනීමට නොහැකි වූ විට, එවැනි බැංකුවක් එවැනි නිරාවරණයක් සඳහා අවම වශයෙන් සියයට 45 ක පාඩු ඇති කරන පැහැර හැරීම් තක්සේරුවක් යොදාගත යුය.

  එබැවින්, අපහායනය ගණනය කිරීමේදී විකුණුම්කර සහ ස්ථාවර තැන්පතු සඳහා 45% ක LGD යොදාගන්නා ලදී.

- **ගෙවීම් පැහැර හැරීම් නිරාවරණය (EAD) තක්සේරුකිරීම**
  අපේක්ෂිත ණය අලාභය මනිනු ලබන්නේ ආයතනය ණය අවදානමට නිරාවරණය වන කාල සීමාව තුළය. EAD යනු ණය අවදානමට නිරාවරණය වන ඇතැම් මූල්‍ය උපකරණවල ආයෝජනය කරන මුදල් ප්‍රමාණයයි.

  2019 ජනවාරි 1 වන දින සිට, අරමුදල සිය ණය උපකරණ සමඟ සම්බන්ධිත අපේක්ෂිත ණය පාඩු (ECL) ක්‍රමක්ෂය පිරිවැය සහ FVOCI සමඟ ඉදිරියට ගෙන යන පදනම මත තක්සේරුකරයි. ණය අවදානමේ සැලකිය යුතු වැඩිවීමක් සිදුවී ඇත්ද යන්න මත හානිකර ක්‍රමවේදය රඳා පවතී.

  මණ්ඩලය, FVTPL ලෙස මැනිය නොහැකි පහත සඳහන් මූල්‍ය උපකරණ මත අපේක්ෂිත ණය පාඩු (ECL) සඳහා වන පාඩු හඳුනා ගනී:
  - ලැයිස්තුගත ණයකර
  - ස්ථාවරතැන්පතු
  - රාජය උකස් හා ආයෝජන බැංකුවේ ණය යෝජනා තැන්පතුව
  - ජාතික සංවර්ධන බැංකුවේ ණය යෝජනා තැන්පතුව

2.20.2 මූල්‍ය නොවන වත්කම් දුබලතාවයට පත්වීම

කිසියම් වත්කමක් දුබලතාවයට පත්වීමේ ලක්ෂණ පහළවී තිබේදැයි යනුවෙන් සෑම රපෝර්තු දිනකම මණ්ඩලය තක්සේරු කර බලයි. ඒ පිළිබඳව හඟවන යම් කරුණු වේ නම් හෝ කිසියම් වත්කමක් විෂයෙහි වාර්ෂික දුබලතා පරීක්ෂණයක් අවශ්‍ය වේ නම් අදාළ වත්කමෙහි ආපසු අයකර ගතහැකි වටිනාකම මණ්ඩලය විසින් තක්සේරු කරනු ලබයි. වත්කමක ආපසු අයකර ගත හැකි මුදල වන්නේ එම වත්කමෙහි හෝ මුදල් උත්පාදන ඒකකයෙහි විකුණුම් පිරිවැය අඩු කළ සාධාරණ අගයෙහි හෝ භාවිත වටිනාකම යන දෙකෙහි ඉහළ අගයයි. වත්කමෙහි හෝ මුදල් උත්පාදන ඒකකයෙහි ධාරණ වටිනාකම ආපසු අයකර ගත හැකි මුදල් ප්‍රමාණය ඉක්මවන්නේ නම් වත්කම දුබලතාවයට පත්වූ ලෙස සලකා එහි ආපසු අයකර ගත හැකි වටිනාකම ලියා දක්වනු ලැබේ.

භාවිත වටිනාකම තක්සේරු කිරීමෙහිලා ඇස්තමේන්තුකළ අනාගත මුදල් ප්‍රවාහ, අදාළ මුදලෙහි කාලානුරූප වටිනාකමෙහි ප්‍රවර්තන වෙළඳපොළ තක්සේරුව හා අදාළ වත්කමට විශේෂිත වන්නා වූ අවදානම් ප්‍රවර්තන වෙළෙඳපොළ තක්සේරුව පිළිඹිඹු වන බදු පූර්ව වට්ටම් අනුපාතයක් යොදා ගනිමින් ඒවායේ ප්‍රවර්තන අගය අනුව වට්ටම් ගත කෙරේ. සාධාරණ අගයෙන් අඩු කළ විකුණුම් පිරිවැය නිශ්චය කිරීමෙහිලා ප්‍රශස්ත තක්සේරු කිරීමේ ආකෘතියක් යොදාගනු ලැබේ. මෙම ආගනනයන්, තක්සේරුවල බහුවිධ ක්‍රම, ප්‍රසිද්ධ වෙළඳ සමාගම් වල මිල ප්‍රකාශිත කොටස් හෝ පවත්නා වෙනත් සාධාරණ අගය දැක්වීමේ දර්ශක මගින් තහවුරු කෙරේ.

වත්කම් සඳහා පූර්ව වශයෙන් හඳුනා ගන්නා ලද දුබලතා අලාභ තව දුරටත් නොපවතින්නේද නැතහොත් අඩුවී තිබේද යන්න පිළිබඳව තක්සේරුවක් සෑම රපෝර්තු දිනයකදීම සිදු කරනු ලැබේ. එබඳු දැනවුමක් පවතී නම්, අදාළ වත්කමෙහි හෝ මූල්‍ය උත්පාදන ඒකකයෙහි ආපසු අයකරගත හැකි වටිනාකම මණ්ඩලය විසින් ඇස්තමේන්තු කරනු ලැබේ. අවසන් දුබලතා අලාභය හඳුනා ගන්නා ලද අවස්ථාවේ වත්කමෙහි ආපසු අයකර ගත හැකි වටිනාකම නිර්ණය කිරීමට භාවිතා කරන ලද උපකල්පනයන් හි වෙනසක් පවතින්නේ නම් පමණක් පූර්ව වශයෙන් හඳුනාගන්නා ලද දුබලතා අලාභය අවලංගු කෙරේ. වත්කම සඳහා පූර්ව වර්ෂ තුළ අදාළ දුබලතා ආලභ කිසිවක් හඳුනාගෙන නොතිබියේ නම්, ක්ෂය වීම් අඩු කළ වත්කමෙහි ධාරණ වටිනාකම එහි ආපසු අයකරගත හැකි මුදල ඉක්මවා නොයන අයුරින් හෝ නිශ්චය කරනු ලැබිය යුතුව තිබූ ඊට අදාළ ධාරණ අගය ඉක්මවා නොයන අයුරින් එකී අවලංගු කිරීම සීමා කරනු ලැබේ. එබඳු අවලංගුකිරීම් ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

2.21 ගිණුම් ප්‍රතිපත්තිවල වෙනස්කම්

2.21.1 ආයෝජනමය දේපළ තක්සේරු කිරීම

ස්වකීය ආයෝජනමය දේපළවල සාධාරණ අගය නිශ්චය කර ගැනීම පිණිස ආයතනය බාහිර තක්සේරු කරුවෙකු ලවා වී්වා හා සම්බන්ධ තක්සේරු කිරීම් ඉටුකරවා ගනියි. මෙම තක්සේරු කිරීම්, අනාගත කුලී ආදායම්, අපේක්ෂිත නඩත්තු පිරිවැය, අනාගත සංවර්ධන වියදම් සහ ප්‍රශස්ත වට්ටම් අනුපාත ඇතුළු උපකල්පන මත පදනම්වී ඇත. මෙහිලා තක්සේරු කරුවා මේ හා සමාන දේපළවල ගණුදෙනු කිරීමේ මිල ගණන් ආශ්‍රිත වෙළඳ පොළ සාක්ෂි පිළිබඳවද අවධානය යොමු කරයි.

2.21.2 මූල්‍ය මෙවලම්වල සාධාරණ අගය

තක්සේරු කිරීමේ ශිල්ප ක්‍රම භාවිතයට ගනිමින් මිල ප්‍රකාශිත නොවූ මූල්‍ය මෙවලම්හි සාධාරණ අගය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබයි. වට්ටම් අනුපාත සහ අනාගත මුදල් ප්‍රවාහවල ඇස්තමේන්තු ඇතුළුව යොදාගනු ලැබ ඇති උපකල්පන මගින් එබඳු ශිල්ප ක්‍රම කෙරෙහි සැලකිය යුතු බලපෑම් ඇති කරයි. වීම කාරණයෙහිලා, වෙලෙස ලබා ගන්නා සාධාරණ අගය පිළිබඳ ඇස්තමේන්තු ස්වාධීන වෙළඳපළ තත්වයන් සමඟ සංසන්දනය කිරීම මගින් සෑම විටම සනාථ කළ නොහෙන අතර බොහෝ අවස්ථාවලදී වී්වා වහා උපලබ්ධි කර ගැනීමේ හැකියාවක්ද නොමැති විය හැකිය.

2.21.3 දේපළ, පිරියත හා උපකරණ සඳහා ප්‍රශස්ත ප්‍රයෝජ්‍ය ආයුකාල සහ අවශේෂ අගය

ආයතනය ස්වකීය ගිණුම් ප්‍රතිපත්තිවලට අනුව කටයුතු කරමින් ඉහත අයිතමවල ප්‍රයෝජ්‍ය ආයු කාලය සහ වී්වායේ අවශේෂ වටිනාකම් වල ඇස්තමේන්තු ප්‍රශස්තව පවතින්නේදැයි වාර්ෂිකව පරීක්ෂා කර බලයි.

2.21.4 ව්‍යාපාර සංකලන සහ පාලනමය නොවන සබැඳියා අත්පත්කර ගැනීම

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය 1997 වර්ෂයේදී සීමාසහිත ලංකා ලුණු සමාගමේ කොටස් වලින් 90% ක්වූ ප්‍රමාණයක් අත්කරගෙන ඇත. වී් හා බැඳි කීර්තිනාමයෙහි වටිනාකම රුපියල් 378,926,440 ක් වශයෙන් ගණනය වන අතර වලෙස වීම කොටස් අත්කරගත් දිනයේ සිට බලපැවැත්වෙන ගිණුම් පරිචයන් මත පදනම්ව අදාළ අත්කරගත් දිනයේ සිට ආරම්භ වන 05 අවුරුදු කාලසීමාවක් මුළුල්ලේ එකී කොටස් වටිනාකම ක්‍රමක්ෂය වන බව හඟිනු ලැබ ඇත.

මෙම ව්‍යාපාර සංකලනය පිළිබඳ විස්තර පහත දක්වේ.

	සමූහය	
	රු. (000)	රු. (000)
පවරන ලද ප්‍රතිශ්ධාව		
හඳුනාගත් ශුද්ධ වත්කම් වල පිළිගන්නා ලද		
වටිනාකමෙහි සමානුපාතික කොටස	-	470,960,938
ප්‍රකාශිත ප්‍රාග්ධනය	31,500,000	
සංචිත	60,534,498	
කීර්ති නාමය		92,034,498
		378,926,440

කීර්ති නාමය පූර්ණ වශයෙන් ක්‍රමක්ෂය කරනු ලැබ තිබූ හෙයින්, සමාලෝචනයට භාජනය වන වසර තුළ ගිණුම් ද්වයම වෙනුවෙන් ගැළපුම් කිසිවක් නොවීය.

3. ප්‍රවර්තන වර්ෂ ගැළපුම්

3.1 2018 වර්ෂයේ සාමාජික අරමුදලට කරන ලද ගැළපුම්

ගැළපුමෙහි ස්වභාවය	රු ශත
හරවා වීවන ලද ප්‍රතිලාභ (චෙක්පත්) - පොලී හා ලාභාංශ	174
හරවා වීවන ලද ප්‍රතිලාභ (පත්‍රිකා) - පොලී හා ලාභාංශ	507
සැසැදු දායක මුදල් - ගි අ 274	16
සැසැදු දායක මුදල් - ගි අ 147	99
වැඩිපුර ගෙවන ලද දායක මුදල් පොළි හා ලාභාංභ	(1,290)
අධිභාර මාරුකිරීම් - පොළි හා ලාභාංශ	(7,500)
	(7,993)

		සටහන	සමූහය		මණ්ඩලය	
			2019	2018	2019	2018
			රු. '000	රු. '000	රු. '000	රු. '000
4	**පොලී ආදායම**					
	ක්‍රමක්ෂය පිරිවැයෙහි මූල්‍ය ආයෝජන	4.1	31,583,332	28,330,988	31,554,779	28,301,818
			31,583,332	**28,330,988**	**31,554,779**	**28,301,818**
4.1	**ක්‍රමක්ෂය පිරිවැයෙහි මූල්‍ය ආයෝජන**					
	ස්ථාවර තැන්පතු පොලිය		6,767,070	6,113,709	6,739,292	6,086,043
	NDB යෝජනා තැන්පතු මත පොලිය		97,222	97,192	97,222	97,192
	SMIB නිවාස ණය තැන්පතු මත පොලිය		7,514	7,037	7,514	7,037
	ණයකර පොලිය		434,619	282,959	434,619	282,959
	භාණ්ඩාගාර බැඳුම්කර මත ආදායම්		23,839,870	21,278,289	23,839,870	21,278,289
	නැවත මිලදීගැනීමේ ගිවිසුම් මත පොලිය		234,152	322,576	234,152	322,576
	මුදල් වෙළඳපොලෙන් ලද පොලිය		2,796	3,273	2,021	1,769
	භාරකාර ගිණුම මත පොලිය		-	31	-	31
	බැඳුම්කර මත පොලිය - විදුලිබල ව්‍යාපෘතිය		182,888	210,373	182,888	210,373
	කාර්යමණ්ඩලය සඳහා ණය					
	ආපදා ණය මත පොලිය (විශේෂ ණය)		525	575	525	575
	රථවාහන ණය සඳහා පොලිය		8,637	7,314	8,637	7,314
	විශේෂ ආපදා ණය මත පොලිය		7,153	6,802	7,153	6,802
	විශේෂ උත්සව ණය මත පොලිය		192	123	192	123
	විශේෂ අත්තිකාරම් මත පොලිය		693	734	693	734
			31,583,332	**28,330,988**	**31,554,779**	**28,301,818**
5	**වෙළඳ කටයුතුවලින් ලද ශුද්ධ ආදායම්**					
	ශුද්ධ ආදායම්	5.1	1,521,523	1,352,482	-	-
	(-) විකුණුම් පිරිවැය		(1,666,419)	(1,151,421)	-	-
			(144,896)	**201,061**	**-**	**-**
5.1	**ශුද්ධ ආදායම්**					
	දළ ආදායම්		1,741,278	1,556,379	-	-
	(-) අඟය වකතු කරන ලද බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු		(219,755)	(203,897)	-	-
			1,521,523	**1,352,482**	**-**	**-**
6	**ලාභාංශ ආදායම්**					
	වෙළඳ කටයුතු සඳහා රඳවාගත් ආයෝජන	6.1	462,241	328,384	462,241	328,384
	අලෙවි කළ හැකි ආයෝජන	6.2	18,840	17,870	18,840	17,870
			481,081	**346,254**	**481,081**	**346,254**
6.1	**FVTPLහි මූල්‍ය ආයෝජන**					
	කොටස් මත ලාභාංශ - ලැයිස්තුගත		462,241	328,384	462,241	328,384
			462,241	**328,384**	**462,241**	**328,384**
6.2	**FVTOCIහි මූල්‍ය ආයෝජන**					
	ඒකක මත ලාභාංශ - ලැයිස්තුගත		4,295	6,005	4,295	6,005
	කොටස් මත ලාභාංශ - ලැයිස්තුගත නොවන		14,545	11,865	14,545	11,865
			18,840	**17,870**	**18,840**	**17,870**

		සටහන	සමූහය		මණ්ඩලය	
			2019	2018	2019	2018
			රු. '000	රු. '000	රු. '000	රු. '000
7	**ලාභ/(පාඩු) හරහා සාධාරණ මිලකදී මූල්‍ය වත්කම්හි ලාභ/(පාඩු)**					
	වර්තමන් කොටස් අලෙවි ලාභය		10,722	28,292	10,722	28,292
	දිගුකාලීන කොටස් විකුණුම් ලාභ/පාඩු		8,098	7,403	8,098	7,403
	කොටස් සංචිත මත උපල්බ්ධි වූ ලාභ		(6,021)	(887)	(6,021)	(887)
	ඒකක අලෙවිය මත ලාභ/පාඩු		-	(11,325)	-	(11,325)
	ඒකක සංචිතය මත ලද ලාභ		-	3,529	-	3,529
	කොටස් මත සාධාරණ වටිනාකම් ගැලපුම්		(399,159)	(334,903)	(399,159)	(334,903)
			(386,360)	**(307,891)**	**(386,360)**	**(307,891)**
8	**වෙනත් ආදායම්**					
	කුලී ආදායම්		811	2,878	253	2,470
	ගෘහභාණ්ඩ හා උපකරණ අලෙවියෙන් ලාභය		1,586	2,070	(196)	1,628
	අධිභාර		338,518	363,643	338,518	363,643
	කඩිනම් ප්‍රතිලාභ ගෙවීම් ආදායම		20,799	25,878	20,799	25,878
	කාර්යමණ්ඩල ණය ආදායම්		33,407	32,709	33,249	32,165
	සුළු ආදායම්		9,970	8,069	5,373	1,519
	භයානක ගාස්තු		-	47	-	47
	රථගාලෙන් ලද ලාභය/(පාඩුව) (නවම් මාවත)		33,114	33,862	33,114	33,862
	නිවාඩු නිකේතනයෙන් ලද ලාභය/(පාඩුව)		(4,099)	(3,404)	(4,099)	(3,404)
	අනුමාන ආදායම		2,000	5,144	2,000	5,144
	ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම		1,063	1,063	-	-
	ප්‍රවාහන නැවත අයකරගැනීම		8,940	12,323	-	-
			446,109	**484,282**	**429,011**	**462,952**
9	**කාර්යමණ්ඩල වියදම්**					
	වැටුප් හා වේතන	9.1	735,771	665,428	678,739	605,849
	කෙටි කාලීන මූල්‍ය සහ මූල්‍ය නොවන ප්‍රතිලාභ	9.2	480,355	434,437	460,351	405,322
	විස්තර කර ඇති ප්‍රතිලාභ සැලසුම්	9.3	35,417	34,435	33,166	32,708
	වෙනත් දිගුකාලීන සේවක ප්‍රතිලාභ	9.4	128,339	109,149	120,605	101,089
			1,379,882	**1,243,448**	**1,292,861**	**1,144,968**
9.1	**වැටුප් හා වේතන**					
	කාර්යමණ්ඩල පිරිවැය (අධ්‍යක්ෂවරයාගේ ගාස්තු ඇතුලු) තුල ඇතුලත් වන්නේ:					
	වැටුප්		590,753	539,541	537,959	484,019
	අධ්‍යක්ෂ ගාස්තු		3,069	2,998	1,044	998
	ජීවන වියදම් දීමනාව		96,312	92,504	96,312	92,504
	ආහාර වේල් දීමනාව		3,880	-	3,880	-
	අතිකාල දීමනාව		27,719	20,672	25,505	18,615
	නිවාඩු දින ගෙවීම්		14,039	9,713	14,039	9,713
			735,771	**665,428**	**678,739**	**605,849**

		සටහන	සමූහය		මණ්ඩලය	
			2019	2018	2019	2018
			රු. '000	රු. '000	රු. '000	රු. '000
9.2	**කෙටි කාලීන මූලය සහ මූලය නොවන ප්‍රතිලාභ**					
	පුහුණු හා සංවර්ධන වියදම්		4,495	5,377	4,488	4,987
	බඳවාගැනීමේ වියදම්		668	821	668	821
	කාර්යමණ්ඩල සුබසාධනය		33,239	33,465	31,539	29,422
	දිරිදීමනා		155,525	132,536	145,504	122,165
	විදේශ පුහුණුව		6,512	2,470	6,512	2,470
	ලබා නොගත් නිවාඩු සඳහා ගෙවීම්		18,146	17,073	18,146	17,073
	ප්‍රසාද දීමනා		109,694	106,426	102,395	93,203
	වෛද්‍ය වියදම් නැවත ගෙවීම		104,087	87,346	103,109	86,259
	කාර්යමණ්ඩල ණය පිරිවැය		33,249	32,165	33,249	32,165
	නිවාස ණය පොලිය		14,142	16,756	14,142	16,756
	සේවක අනතුරු සඳහා වන්දි ගෙවීමේ යෝජනා ක්‍රමය		600	-	600	-
			480,355	**434,437**	**460,351**	**405,322**
9.3	**විස්තර කර ඇති ප්‍රතිලාභ සැලසුම්**					
	පොලී පිරිවැය		22,277	23,666	22,277	23,666
	වත්මන් සේවා පිරිවැය		13,140	10,769	10,889	9,042
			35,417	**34,435**	**33,166**	**32,708**
9.4	**වෙනත් දිගුකාලීන සේවක ප්‍රතිලාභ**					
	සේ. නි. භා. අ. මණ්ඩලීය දායකය		106,970	90,917	100,245	83,908
	සේ. අ. අ. මණ්ඩලීය දායකය		21,065	17,809	20,056	16,758
	විශ්‍රාම වැටුප් දායකය		304	422	304	422
			128,339	**109,149**	**120,605**	**101,089**

		සටහන	සමූහය		මණ්ඩලය	
			2019	2018	2019	2018
			රු. '000	රු. '000	රු. '000	රු. '000
10	**පරිපාලන වියදම්**					
	කුලියට දී ඇති ගොඩනැගිල්ල		70,527	65,829	70,527	65,829
	වරිපනම් බදු		22,647	12,956	756	755
	ජාතිය ගොඩනැගීමේ බදු පිරිවැය		27,865	27,186	-	-
	විදුලි ගාස්තු		21,331	19,742	21,331	19,742
	දුරකථන ගාස්තු		13,450	16,930	11,516	15,444
	ජල ගාස්තු		1,346	1,257	1,346	1,257
	උපදේශක ගාස්තු		3,400	4,053	1,884	2,095
	විගණන ගාස්තු		3,899	3,429	3,371	2,901
	ආරක්ෂක වියදම්		13,134	10,983	13,134	10,983
	නීති ගාස්තු		2,967	1,998	1,176	648
	කුලී වියදම්		3,551	10,159	2,151	8,498
	ලේකම් වියදම්		120	120	120	120
	තැපැල් හා විදුලි පණිවුඩ - පරිපාලන		1,582	2,082	1,248	1,709
	ගමන් වියදම් හා සංයුක්ත දීමනා - පරිපාලන		923	901	923	901
	මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය - පරිපාලන		2,080	2,075	1,917	1,779
	මාධ්‍යය සහ ප්‍රචාරණය - පරිපාලන		1,154	4,829	59	-
	තොරතුරු තාක්ෂණවේද වියදම් - පරිපාලන		313	1,215	313	1,215
	වෙළඳ දැන්වීම් සහ පුවත්පත් දැන්වීම්		1,744	5,273	1,744	5,273
	රථවාහන රක්ෂණය සහ බලපත්‍ර ගාස්තු		4,074	2,372	4,074	2,372
	පුවත්පත් සහ වාර සඟරා		843	969	674	795
	පරිත්‍යාග		1,208	956	-	204
	විනය පරීක්ෂණ		-	151	-	151
	ආපදා කළමනාකරණ ගාස්තු		-	1,342	-	1,342
	වෙනත් රක්ෂණ		0	3	0	3
	කාර්යාල නඩත්තු සහ අවශ්‍යතා		387	585	387	585
	මුද්දර ගාස්තු සහ ලියාපදිංචි කිරීමේ ගාස්තු		91	44	91	44
	විවිධ වියදම්		5,576	8,532	5,576	8,232
	බැහැර කළ - කාර්යමණ්ඩලයෙන් නැවත අයකරගැනීම්		40	-	40	-
	රථවාහන අලුත්වැඩියාකිරීම් හා නඩත්තුව		9,255	9,523	7,587	8,604
	ඉන්ධන ගාස්තු		15,588	14,673	12,738	11,788
	ගොඩනැගිල්ල නඩත්තු කිරීම		11,874	7,246	11,874	7,246
	යන්ත්‍ර සූත්‍ර, ගෘහභාණ්ඩ හා උපකරණ නඩත්තුව		3,858	4,841	2,960	2,981
			244,825	**242,253**	**179,517**	**183,496**
11	**මූලික වියදම්**					
	භාරකාර ගාස්තු		1,954	2,704	1,954	2,704
	බැංකු ගාස්තු		2,168	2,480	2,168	2,480
	පොලී වියදම්		23,246	15,464	-	-
			27,368	**20,648**	**4,122**	**5,184**

		සටහන	සමූහය		මණ්ඩලය	
			2019	2018	2019	2018
			රු. '000	රු. '000	රු. '000	රු. '000
12	**සාමාජික වියදම්**					
	සාමාජික ප්‍රතිලාභ	12.1	454,714	425,400	454,714	425,400
	සාමාජික සේවා	12.2	46,943	43,310	46,943	43,310
	තොරතුරු තාක්ෂණික සේවා	12.3	21,641	19,438	21,641	19,438
			523,298	**488,148**	**523,298**	**488,148**
12.1	**සාමාජික ප්‍රතිලාභ**					
	මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය		110,494	96,979	110,494	96,979
	ස්ථිර ආබාධිත බව සඳහා වන යෝජනා ක්‍රමය		11,754	5,810	11,754	5,810
	අක්ෂි කාච බද්ධ කිරීම් සඳහා වන යෝජනා ක්‍රමය		4,059	3,473	4,059	3,473
	ශ්‍රම සුව රැකවරණ යෝජනා ක්‍රමය		9,930	11,111	9,930	11,111
	හදවත් සැත්කම් යෝජනා ක්‍රමය		172,835	160,590	172,835	160,590
	වකුගඩු බද්ධ කිරීමේ යෝජනා ක්‍රමය		5,708	2,851	5,708	2,851
	5 වසර ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය		93,615	89,505	93,615	89,505
	උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය		46,320	55,080	46,320	55,080
			454,714	**425,400**	**454,714**	**425,400**
12.2	**සාමාජික සේවා**					
	තැපැල් ගාස්තු සහ ටෙලිග්‍රෑම් - සාමාජි.		16,547	15,812	16,547	15,812
	මුද්‍රණ සහ ලිපි ලේඛන- සාමාජි.		17,278	15,357	17,278	15,357
	පරිගණක ලිපි ලේඛන		3,516	3,919	3,516	3,919
	ස්වයං රැකියා ප්‍රවර්ධන වියදම්		423	4	423	4
	සාමාජිකයින් ආශ්‍රිත වියදම්		462	339	462	339
	සේවක දැනුවත් කිරීමේ යෝජනා ක්‍රමය		555	638	555	638
	ප්‍රවාහන සහ උපවේශන- සාමාජි.		5,642	5,200	5,642	5,200
	මාධ්‍ය සහ ප්‍රචාරණය - සාමාජි		552	468	552	468
	සාමාජිකයන් සඳහා වෛද්‍ය උපදේශන		29	19	29	19
	ශිෂ්‍යත්ව වියදම්		1,939	1,555	1,939	1,555
			46,943	**43,310**	**46,943**	**43,310**
12.3	**තොරතුරු තාක්ෂණ සේවාවන්**					
	දෘඩාංග නඩත්තු කිරීම		1,904	4,099	1,904	4,099
	මෘදුකාංග නඩත්තු කිරීම්		441	613	441	613
	ක්ෂය වීම - තොරතුරු තාක්ෂණ		13,294	8,193	13,294	8,193
	රක්ෂණය - තොරතුරු තාක්ෂණ		129	334	129	334
	කල්බදු සම්බන්ධතා (Leased Lines) සඳහා කුලිය		5,872	6,200	5,872	6,200
			21,641	**19,438**	**21,641**	**19,438**
13	**ක්ෂය වීම සහ ක්‍රමක්ෂය**					
	දේපළ, පිරියත සහ උපකරණ ක්ෂය වීම		73,898	33,829	53,983	14,219
	බදු ඉඩම් සහ සංවර්ධන වැඩකටයුතු ක්‍රමක්ෂය වීම		46,169	37,968	-	-
	ජීව විද්‍යාත්මක වත්කම් ක්ෂය වීම/අපහායනය		8,295	8,631	-	-
			128,362	**80,428**	**53,983**	**14,219**

		සටහන	සමූහය		මණ්ඩලය	
			2019	2018	2019	2018
			රු. '000	රු. '000	රු. '000	රු. '000
14	**අපහායන අයකිරීම/ප්‍රතිවර්තනය**					
	විකුණුම්කර අපහායනය		193	-	193	-
	රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු තැන්පතුව මත අපහායනය		180	-	180	-
	ජාතික සංවර්ධන බැංකු තැන්පතුව මත අපහායනය		26	-	26	-
			399	**-**	**399**	**-**

		මණ්ඩලය	
		2019	2018
		රු. '000	රු. '000
15	**ආදායම් බදු වියදම්**		
	14% ක බදු බැරකමට පෙර ගිණුම්කරණ ලාභය/ (පාඩුව)	29,763,621	20,192,809
	10% ක බදු බැරකමට පෙර ගිණුම්කරණ ලාභය/ (පාඩුව)	-	5,678,129
		29,763,621	**25,870,938**
	නිදහස් කිරීම සහ වෙනත් ආදායම් මූලාශ්‍ර	(493,879)	(224,786)
	ඉඩ දිය නොහැකි වියදම්	762,388	585,949
	ඉඩ දිය හැකි වියදම්	(34,629)	-
	ජාතික බදු බැර	-	(554,530)
	ආයෝජන වෙතින් තක්සේරු කළ හැකි ආදායම	**29,997,501**	**25,677,571**
	ආදායම් බදු @ 14%	4,199,650	2,826,993
	ආදායම් බද්ද @ 10% (පළමු මාස 3)	-	567,813
	දළ ආදායම් බදු වියදම්	**4,199,650**	**3,394,806**
	නිදහස් කරන ලද ආදායම මත බද්ද	42,473	-
	ජංගම ආදායම් බදු වියදම්	**4,242,123**	**3,394,806**

		LANKA SALT	
		2019	2018
		රු. '000	රු. '000
	මෙහෙයුම්වලින් බද්දට පෙර ගිණුම්කරණ ලාභය/ (පාඩුව)	(349,200)	25,061
	බදුකරණය සඳහා ඉඩ දිය නොහැකි වියදම්	133,726	131,957
	බදුකරණය සඳහා ඉඩ දිය හැකි වියදම්	(129,072)	(226,824)
	ඉදිරියට ගෙනගිය බදු පාඩුව	(444,952)	24,705
	සුදුසුකම් ලත් ගෙවීම්	-	-
	ව්‍යාපාර ආදායම මත බදු අයකළ හැකි ලාභය	**(789,499)**	**(45,101)**
	ව්‍යාපාර ආදායම මත බදු අයකළ හැකි ලාභය	**-**	**5,338**
	ශුද්ධ බදු අය කළ හැකි ලාභය/ (පාඩුව)	**(789,499)**	**(39,764)**
	ජංගම ආදායම් බදු අය කිරීම @ 28%	-	1,495
	පෙර වසරවලට අදාළව ජංගම බදු අවප්‍රතිපාදනය	-	(29)
	විලම්බිත ආදායම් බදු	-	-
	විලම්බිත බදු අය කිරීම/ (ප්‍රතිවර්තනය)	**(87,038)**	**14,012**
	ආදායම් ප්‍රකාශය තුළ වාර්තා කළ ආදායම් බදු වියදම	**(87,038)**	**15,478**

		සටහන	සමූහය		මණ්ඩලය	
			2019	2018	2019	2018
			රු. '000	රු. '000	රු. '000	රු. '000
16	**FVTPL ට මූල්‍ය වත්කම්**					
	ප්‍රකාශිත කොටස් ආයෝජනය වෙළෙඳාම්		2,699,451	2,886,959	2,699,451	2,886,959
			2,699,451	**2,886,959**	**2,699,451**	**2,886,959**
17	**පරිපාලිත ආයතන තුළ ආයෝජනය**					
	ලංකා ලුණු සමාගම		-	-	470,961	470,961
			-	**-**	**470,961**	**470,961**
18	**FVOCI ට මූල්‍ය වත්කම්**					
	ප්‍රකාශිත කොටස් ආයෝජනය දීර්ඝ කාලීන		7,487,266	7,211,834	7,487,266	7,211,834
	ප්‍රකාශ නොකළ කොටස් ආයෝජනය		219,761	160,960	219,761	160,960
	ප්‍රකාශිත ඒකක		192,615	191,102	192,615	191,102
	පොරොන්දු නෝට්ටු		12,174	12,174	12,174	12,174
	කොටස් - ලැයිස්තුවෙන් ඉවත් කළ සහ ඈවර කිරීමට යටත්		-	25,228	-	25,228
	අඩු කළා: අගය කොටස් අඩුවීම සඳහා ප්‍රතිපාදන		-	(25,228)	-	(25,228)
	පොරොන්දු නෝට්ටු අපහායනය		(12,174)	(12,174)	(12,174)	(12,174)
			7,899,643	**7,563,896**	**7,899,643**	**7,563,896**
19	**ක්‍රමක්ෂය පිරිවැයට ගෙන ආ මූල්‍ය වත්කම්**					
	භාණ්ඩාගාර බැඳුම්කර		258,372,563	226,135,469	258,372,563	226,135,469
	ප්‍රකාශිත - ණයකර		3,603,194	2,710,294	3,603,194	2,710,294
	අඩු කළා: ණයකර අපහායනය		(8,162)	(7,450)	(8,162)	(7,450)
	ස්ථාවර තැන්පතු		56,107,736	58,216,338	55,824,345	57,959,368
	ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුම්		2,194,037	2,258,408	2,194,037	2,258,408
	අප්‍රකාශිත ණයකර		1,397,019	-	1,397,019	-
	බැඳුම්කර - බල ව්‍යාපෘතිය		1,430,176	1,742,541	1,430,176	1,742,541
	රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව - යෝජනා ක්‍රම තැන්පතුව		380,602	373,161	380,602	373,161
	අඩු කළා: රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු තැන්පතුව මත අපහායනය		(475)	-	(475)	-
	ජාතික සංවර්ධන බැංකුව - යෝජනා ක්‍රම තැන්පතුව		972,156	1,026,973	972,156	1,026,973
	අඩු කළා: ජාතික සංවර්ධන බැංකු තැන්පතුව මත අපහායනය		(607)	-	(607)	-
	කාර්ය මණ්ඩල ණය		-	-	-	-
	ආපදා ණය (විශේෂ ණය)		14,993	13,787	14,993	13,787
	විශේෂ ආපදා ණය		233,646	215,891	231,142	212,680
	උත්සව අත්තිකාරම්		417	485	417	485
	විශේෂ උත්සව ණය		1,368	777	1,368	777
	විශේෂ අත්තිකාරම්		3,154	3,384	3,154	3,384
	වාහන ණය		271,258	235,621	271,258	235,621
	ණය - ගංවතුර සහන		1,140	2,883	1,140	2,883
			324,974,213	**292,928,563**	**324,688,318**	**292,668,381**

		සටහන	සමූහය		මණ්ඩලය	
			2019	2018	2019	2018
			රු. '000	රු. '000	රු. '000	රු. '000
20	**වෙනත් වත්කම්**					
	උපචිත ආදායම	20.1	2	2	2	2
	ලැබීම් සහ පෙර ගෙවුම්	20.2	2,888,639	2,457,360	2,831,110	2,404,508
	තොග	20.3	565,525	879,867	8,485	7,257
			3,454,166	**3,337,230**	**2,839,598**	**2,411,767**
20.1	**උපචිත ආදායම**					
	ලැබිය යුතු පොළී		25,868	27,868	25,868	27,868
	අඩු කළා: අඩමාණ ආදායමට ප්‍රතිපාදන		**(25,866)**	**(27,866)**	**(25,866)**	**(27,866)**
			2	**2**	**2**	**2**
20.2	**ලැබීම් සහ පෙර ගෙවුම්**					
	වෙළෙඳ ණයකරුවන්		13,902	10,695	-	-
	ලැබුණු දායකත්වය		2,340,987	2,225,664	2,340,987	2,225,664
	මුදල් ඇණවුම් පාලනය		6,515	4,536	6,515	4,536
	තැපැල් මුද්‍රා තැබීමේ යන්ත්‍ර අග්‍රිමය		620	146	620	146
	අනියම් ණයගැතියන්		42,555	13,688	42,555	13,688
	පෙර සේවකයන් වෙතින් ලැබිය යුතු මුදල්		1,986	800	1,986	800
	ආරක්ෂක තැන්පතු		5,831	5,640	5,831	5,640
	පූර්ව ගෙවීම		22,809	13,059	16,350	6,589
	පෙර ගෙවූ කාර්යමණ්ඩල ණය පිරිවැය		131,422	125,722	131,422	125,722
	ලැබිය යුතු බදු		314,765	56,629	278,994	20,941
	රඳවාගැනීමේ බදු		5,254	-	3,857	-
	අත්තිකාරම් ගෙවීම්		1,993	782	1,993	782
			2,874,737	**2,446,665**	**2,831,110**	**2,404,508**
20.3	**තොග**					
	පොදු ලුණු තොගය		490,455	776,276	-	-
	පොටෑසියම් අයොඩේටඩ් තොගය		2,155	4,263	-	-
	නොහිමි වැඩ		21,599	35,849	-	-
	පරිභෝජ්‍ය භාණ්ඩ සහ අමතර කොටස්		42,830	56,222	-	-
	ලිපිද්‍රව්‍ය හා පරිභෝජ්‍ය භාණ්ඩ තොග		6,903	5,705	6,903	5,705
	පුස්තකාලය		272	242	272	242
	නිවාඩු නිකේතන ඉන්වෙන්ට්‍රිය		1,310	1,310	1,310	1,310
			565,525	**879,867**	**8,485**	**7,257**

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2019 දෙසැම්බර් මස 31 දිනට

21. දේපළ, පිරියත සහ උපකරණ

රු '000

20.1 සමූහය	භාරකාර සේවා වත්කම්													
	ඉඩම්	ගොඩ-නැඟිලි	බදු අයිතිය මත ගොඩනැඟිලි	යන්ත්‍ර උපකරණ	මොටර් වාහන	කල්බදු කළ මොටර් වාහන	ලීබඩු සවිකිරීම් හා කාර්යාලීය උපකරණ	පරිගණක උපාංග	උපකරණ	නොමේරූ වගාවන්	මේරූ වගාවන්	සංවර්ධන කාර්යයන්	ඉදිරියට කරගෙන යන ඉඳිකිරීම්	එකතුව
පිරිවැය														
2018 ජනවාරි 01 දිනට ශේෂය	**20,000**	**39,519**	**595,178**	**260,525**	**255,799**	**29,856**	**135,425**	**156,195**	**38,985**	**14,128**	**17,841**	**274,219**	**33,752**	**1,871,423**
එකතු කිරීම්	-	-	4,030	7,266	14,550	21,712	16,991	49,612	4,962	-	368	42,183	23,545	**185,218**
ගැළපීම්	-	-	-	-	(12,992)	-	(378)	(114)	-	(368)	-	-	-	**(13,852)**
අපහරණයන්	-	-	-	-	-	-	25	(11)	-	-	-	-	-	**14**
අපහායනයන්	-	-	-	-	-	-	-	-	-	(933)	-	-	-	**(933)**
ප්‍රත්‍යාගණනයන් / මාරු කිරීම්	-	-	-	-	-	(3,024)	-	-	-	-	-	-	(42,183)	**(45,207)**
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	**20,000**	**39,519**	**599,208**	**267,792**	**257,357**	**48,544**	**152,063**	**205,681**	**43,947**	**12,827**	**18,209**	**316,402**	**15,114**	**1,996,663**
2019 ජනවාරි 01 දිනට ශේෂය	**20,000**	**39,519**	**599,208**	**267,792**	**257,357**	**48,544**	**152,063**	**205,681**	**43,947**	**12,827**	**18,209**	**316,402**	**15,114**	**1,996,663**
එකතු කිරීම්	-	-	544	8,767	187,135	-	11,382	17,953	835	-	-	891	11,532	**239,038**
අපහරණයන්	-	-	-	-	(2,344)	-	(682)	(2,171)	-	(826)	826	-	-	**(5,196)**
ගැළපීම්	-	-	-	-	-	-	26	1,760	-	-	-	-	-	**1,785**
අපහායනයන්	-	-	-	-	-	-	-	-	-	(383)	-	-	-	**(383)**
ප්‍රත්‍යාගණනයන් / මාරු කිරීම්	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	**-**
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**20,000**	**39,519**	**599,751**	**276,558**	**442,149**	**48,544**	**162,789**	**223,223**	**44,781**	**11,618**	**19,035**	**317,293**	**26,646**	**2,231,908**

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2019 දෙසැම්බර් මස 31 දිනට

														රු '000
										භාරකාර සේවා වත්කම්				
	ඉඩම්	ගොඩ-නැඟිලි	බදු අයිතිය මත ගොඩනැඟිලි	යන්ත්‍ර උපකරණ	මොටර් වාහන	කල්බදු කළ මොටර් වාහන	ලීබඩු සවිකිරීම් හා කාර්යාලීය උපකරණ	පරිගණක උපාංග	උපකරණ	නොමේරූ වගාවන්	මේරූ වගාවන්	සංවර්ධන කාර්යයන්	ඉදිරියට කරගෙන යන ඉදිකිරීම්	එකතුව
සමුච්චිත ක්ෂයවීම්														
2018 ජනවාරි 01 දිනට ශේෂය	**-**	**7,692**	**105,738**	**115,127**	**182,686**	**7,735**	**79,204**	**90,510**	**25,241**	**-**	**714**	**71,967**	**-**	**686,613**
වර්ෂය සඳහා වූ ක්ෂය අය කිරීම්	-	2,074	14,892	21,988	15,408	6,896	12,284	10,204	3,245	-	364	37,271	-	**124,626**
අපහරණයන්	-	-	-	-	(10,712)	-	(346)	(88)	-	-	-	-	-	**(11,146)**
මාරුකිරීම්	-	-	-	-	2,369	(2,369)	-	-	-	-	-	-	-	
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	**-**	**9,766**	**120,631**	**137,114**	**189,751**	**12,263**	**91,142**	**100,626**	**28,486**	**-**	**1,078**	**109,238**	**-**	**800,094**
2019 ජනවාරි 01 දිනට ශේෂය	**-**	**9,766**	**120,631**	**137,114**	**189,751**	**12,263**	**91,142**	**100,626**	**28,486**	**-**	**1,078**	**109,238**	**-**	**800,094**
මාසය සඳහා වූ ක්ෂය අය කිරීම්	-	1,938	14,940	22,848	53,848	5,646	10,450	16,481	3,213	-	381	45,472	-	**175,216**
අපහරණයන්	-	-	-	-	(1,770)	-	(425)	(1,967)	-	-	-	-	-	**(4,162)**
මාරුකිරීම්	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	**-**
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**-**	**11,703**	**135,570**	**159,962**	**241,829**	**17,908**	**101,167**	**115,140**	**31,698**	**-**	**1,459**	**154,709**	**-**	**971,147**
ශුද්ධ පොත් අගය														
2018 ජනවාරි 01 දිනට ශේෂය	**20,000**	**31,827**	**489,439**	**145,399**	**73,113**	**22,121**	**56,221**	**65,685**	**13,744**	**14,128**	**17,128**	**202,252**	**33,752**	**1,184,809**
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	**20,000**	**29,753**	**478,577**	**130,677**	**67,607**	**36,281**	**60,921**	**105,055**	**15,461**	**12,827**	**17,131**	**207,164**	**15,114**	**1,196,569**
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**20,000**	**27,816**	**464,181**	**116,596**	**200,320**	**30,636**	**61,622**	**108,083**	**13,083**	**11,618**	**17,576**	**162,583**	**26,646**	**1,260,761**

21. දේපළ, පිරියත සහ උපකරණ

21.2 මණ්ඩලය	ඉඩම්	ගොඩනැගිලි	මෝටර් වාහන	ලීබඩු සවිකිරීම් හා කාර්යාලීය උපකරණ	පරිගණක උපකරණ	එකතුව
පිරිවැය						
2018 ජනවාරි 01 දිනට ශේෂය	**20,000**	**39,519**	**130,390**	**99,058**	**156,195**	**445,163**
එකතු කිරීම්	-	-	8,940	11,172	49,612	**69,723**
ගැළපීම්	-	-	-	-	-	**-**
අපහරණයන්	-	-	(11,512)	(378)	(114)	**(12,004)**
ප්‍රත්‍යාගණනයන්	-	-	-	25	(11)	**14**
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	**20,000**	**39,519**	**127,818**	**109,877**	**205,681**	**502,896**
2019 ජනවාරි 01 දිනට ශේෂය	**20,000**	**39,519**	**127,818**	**109,877**	**205,681**	**502,896**
එකතු කිරීම්	-	-	186,175	10,013	17,953	**214,141**
ගැළපීම්	-	-	-	(478)	(2,171)	**(2,649)**
අපහරණයන්	-	-	-	26	1,760	**1,785**
ප්‍රත්‍යාගණනයන්	-	-	-	-	-	**-**
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**20,000**	**39,519**	**313,993**	**119,438**	**223,223**	**716,173**

	ඉඩම්	ගොඩනැගිලි	මෝටර් වාහන	ලීබඩු සවිකිරීම් හා කාර්යාලීය උපකරණ	පරිගණක උපකරණ	එකතුව
සමුච්චිත ක්ෂයවීම්						
2018 ජනවාරි 01 දිනට ශේෂය	**-**	**7,692**	**110,065**	**63,310**	**90,510**	**271,577**
වර්ෂයට අදාළ ක්ෂයවීම්	-	2,074	4,944	6,805	10,204	**24,027**
අපහරණයන්	-	-	(10,434)	(346)	(88)	**(10,869)**
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	**-**	**9,766**	**104,574**	**69,769**	**100,626**	**284,735**
2019 ජනවාරි 01 දිනට ශේෂය	**-**	**9,766**	**104,574**	**69,769**	**100,626**	**284,735**
වර්ෂයට අදාළ ක්ෂයවීම්	-	1,938	42,868	7,336	16,481	**68,622**
අපහරණයන්	-	-	-	(423)	(1,967)	**(2,390)**
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**-**	**11,703**	**147,442**	**76,682**	**115,140**	**350,967**
ශුද්ධ පොත් අගය						
2018 ජනවාරි 01 දිනට ශේෂය	**20,000**	**31,827**	**20,326**	**35,748**	**65,685**	**173,586**
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	**20,000**	**29,753**	**23,245**	**40,108**	**105,055**	**218,161**
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**20,000**	**27,816**	**166,552**	**42,756**	**108,083**	**365,206**

		සටහන	සමූහය		මණ්ඩලය	
			2019	2018	2019	2018
			රු. '000	රු. '000	රු. '000	රු. '000
22	**කල්බදු කළ දේපළ**					
	පිරිවැය					
	ජනවාරි 01 දිනට		20,910	20,910	-	-
	එකතු කිරීම්		-	-	-	-
	දෙසැම්බර් 31 දිනට		**20,910**	**20,910**	**-**	**-**
	සම්මුචිචිත ක්‍රමක්ෂය					
	ජනවාරි 01 දිනට ශේෂය		**16,728**	**16,031**	**-**	**-**
	වර්ෂය සඳහා අයවිම්		697	697	-	-
	දෙසැම්බර් 31 දිනට ශේෂය		**17,425**	**16,728**	**-**	**-**
	දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය		**3,485**	**4,182**	**-**	**-**
23	**අස්පෘෂ්‍ය වත්කම්**					
	ජනවාරි 01 දිනට ශේෂය		**102**	**140**	**102**	**140**
	එකතු කිරීම්		1,078	-	1,078	-
	වර්ෂය සඳහා ක්‍රමක්ෂය		(142)	(37)	(142)	(37)
	දෙසැම්බර් 31 දිනට ශේෂය		**1,039**	**102**	**1,039**	**102**
24	**ආයෝජන දේපළ**					
	ජනවාරි 01 දිනට ශේෂය		**3,812,500**	**3,812,500**	**3,812,500**	**3,812,500**
	සාධාරණ අගයේ වෙනස්කම්		-	-	-	-
	දෙසැම්බර් 31 දිනට ශේෂය		**3,812,500**	**3,812,500**	**3,812,500**	**3,812,500**

25. පොළී දරන ණය ගැනුම්

ලංකා ලුණු සමාගම	2019 දෙසැම්බර් 31			2018 දෙසැම්බර් 31		
	1 වසරක් තුළ නැවත ගෙවිය යුතු මුදල	වසර 1 කින් පසුව නැවත ගෙවිය යුතු මුදල	එකතුව	1 වසරක් තුළ නැවත ගෙවිය යුතු මුදල	වසර 1 කින් පසුව නැවත ගෙවිය යුතු මුදල	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
මූල්‍ය කල්බදු	6,907	4,948	11,855	6,757	11,855	18,611
බැංකු අයිරා	187,499	-	187,499	136,933	-	136,933
	194,406	**4,948**	**199,354**	**143,690**	**11,855**	**155,545**

26. ප්‍රදාන සහ සහනාධාර

ලංකා ලුණු සමාගම	අයඩයිස්ඩ් අංගනය	ගොඩනැගිලි	පොම්පාගාරය	සේවකයින්ට වන්දි	එකතුව	එකතුව
					2019	2018
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
පිරිවැය						
ජනවාරි 1 දිනට	**19,515**	**41,124**	**1,387**	**4,260**	**66,287**	**66,287**
දෙසැම්බර් 31 දිනට	**19,515**	**41,124**	**1,387**	**4,260**	**66,287**	**66,287**
ක්‍රමක්ෂය						
ජනවාරි 1 දිනට	**19,515**	**11,909**	**405**	**4,260**	**36,089**	**36,089**
වසර තුළ ප්‍රත්‍යාවර්තන	-	1,028	35	-	1,063	-
දෙසැම්බර් 31 දිනට	**19,515**	**12,937**	**439**	**4,260**	**37,151**	**36,089**
ලියා හළ අගය						
දෙසැම්බර් 31 දිනට	**-**	**28,187**	**948**	**-**	**29,136**	**30,198**

		සටහන	සමූහය		මණ්ඩලය	
			2019	2018	2019	2018
			රු. '000	රු. '000	රු. '000	රු. '000
27	**නිශ්චිත ප්‍රතිලාභ බැඳීම**					
	ජනවාරි 01 ආරම්භක නිශ්චිත ප්‍රතිලාභ බැඳීම		433,819	431,522	212,163	202,603
	පොළී පිරිවැය		37,995	38,628	22,277	23,666
	වත්මන් සේවා පිරිවැය		10,889	9,042	10,889	9,042
	ගෙවූ ප්‍රතිලාභ		(47,220)	(31,812)	(34,629)	(9,588)
	ආයුගණනක බැඳීම් ලාභය/(අලාභය)		41,900	(13,560)	41,900	(13,560)
	දෙසැම්බර් 31 අවසාන නිශ්චිත ප්‍රතිලාභ බැඳීම		**477,383**	**433,819**	**252,600**	**212,163**

		සටහන	සමූහය		මණ්ඩලය	
			2019	2018	2019	2018
			රු. '000	රු. '000	රු. '000	රු. '000
28	**ජංගම බදු වගකීම්**					
	දළ බදු වගකීම්		**4,242,123**	**3,394,806**	**4,242,123**	**3,394,806**
	(-) ගෙවන ලද ESC		(1,815)	(2,339)	(1,815)	(2,339)
	(-) තක්සේරු කළ ආදායම් බදු ගෙවීම්		(2,559,252)	(600,768)	(2,559,252)	(600,768)
	(-) රඳවාගැනීම් බදු බැර		(382,697)	(334,049)	(382,697)	(334,049)
	(-) පෙර වසරේ (අධි)/ඌණ ප්‍රතිපාදනය		-	(50)	-	(50)
	(-) කල්පිත බදු භා/බැඳුම්කර		-	(550,929)	-	(550,929)
	(-) ජාතික බදු ප්‍රතිමිලදී ගැනීම්		-	(3,601)	-	(3,601)
	දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු බදු		**1,298,360**	**1,903,071**	**1,298,360**	**1,903,071**
29	**වෙනත් වගකීම්**					
	ගෙවිය යුතු ගිණුම් සහ සුළු ණයකරුවන්	29.1	1,157,450	871,610	817,448	540,815
			1,157,450	**871,610**	**817,448**	**540,815**
29.1	**ගෙවිය යුතු ගිණුම් සහ විවිධ ණය හිමියෝ**					
	වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ	29.1.1	340,003	330,796	-	-
	ක්‍රීඩා සමාජය		-	371	-	371
	ගෙවන ලද හිමිකම් සහ ප්‍රතිලාභ මත රඳවාගත් බදු		12,882	16,134	12,882	16,134
	හිමිකම් මත ගෙවිය යුතු මුද්දර ගාස්තු		825	777	825	777
	නොගෙවන ලද පාරිශ්‍රමික		120	-	120	-
	ගෙවිය යුතු මුද්දර ගාස්තු		112	105	112	105
	සේවක අර්ථසාධක අරමුදල් අධිකාරී		17,325	13,398	17,325	13,398
	සුළු ණයකරුවන්		684,743	473,717	684,743	473,717
	ආපසු ලැබුණු ප්‍රතිලාභ (චෙක්පත්)		2,762	2,838	2,762	2,838
	ආපසු ලැබුණු ප්‍රතිලාභ (සුබ සාධන)		1,406	1,089	1,406	1,089
	නොගෙවන ලද මරණ ප්‍රතිලාභ		14,452	12,476	14,452	12,476
	ගෙවිය යුතු සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල්		2,076	1,418	2,076	1,418
	ගෙවිය යුතු උපයන විට බදු		1,055	722	1,055	722
	රඳවාගත් බදු		672	756	672	756
	ගෙවිය යුතු චිකතු කළ අගය මත බදු		42	262	42	262
	ගෙවිය යුතු ජාතිය ගොඩනගීමේ බද්ද		-	105	-	105
	හිමිකම් නොපෑ රඳවාගැනීමේ බදු		61,301	-	61,301	-
	හිමිකම් නොපෑ ශිෂ්‍යත්ව		1,316	1,316	1,316	1,316
	නොසැසඳූ ශේෂය		791	820	791	820
	ආපසු ලැබුණු ප්‍රතිලාභ (ස්ලිප්)		10,697	7,804	10,697	7,804
	විශ්‍රාම වැටුප් අරමුදල		23	7	23	7
	පුස්තකාල අරමුදල		53	51	53	51
	සේ.නි.භා.අර. සමාජ වගකීම් ව්‍යාපෘතිය		207	170	207	170
	EISA ව්‍යාපෘතිය		-	575	-	575
	ආරක්ෂක තැන්පතු - රථ ගාල		4,362	5,391	4,362	5,391
	වැටුප් අඩුකිරීම් නිෂ්කාශනය		82	469	82	469
	කළින් ගෙවූ ආදායම		145	47	145	47
			1,157,450	**871,610**	**817,448**	**540,815**

		ලංකා ලුණු සමාගම	
		2019 දෙසැම්බර් 31 රු. '000	2018 දෙසැම්බර් 31 රු. '000
29.1.1	**වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ**		
	මූලික බැරකම්		
	වෙළෙඳ ගෙවීම්	61,977	53,371
	ගෙවිය යුතු ලුණු ප්‍රවාහන ගාස්තු	4,479	10,754
	ගෙවිය යුතු තැම්පතු	38,417	50,504
	ගෙවිය යුතු ලාභාංශ	59,308	1,258
	ගෙවිය යුතු බිම් කුලී	12,029	8,019
	මූලික නොවන වගකීම්		
	උපචිත වියදම්	55,834	111,948
	වෙනත් ගෙවිය යුතු දෑ	7,958	8,532
	ගෙවිය යුතු විකතු කළ අගය සහිත බදු	8,314	14,130
	ගෙවිය යුතු දිරි දීමනා	42,376	24,255
	කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු මුදල්	49,311	48,025
		340,003	**330,796**

		ලංකා ලුණු සමාගම				
		බදු අරමුණු සඳහා ප්‍රාග්ධන දීමනා	නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්	ප්‍රදාන සහ සහනාධාර	බදු පාඩුවලට ආරෝපණීය විලම්බිත බදු	එකතුව
		රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
30	**විලම්බිත බදු වගකීම**					
	01.01.2018 දිනට	154,119	(64,097)	(9,946)	-	80,076
	වසරේ ලාභය හෝ පාඩුවට අයකිරීම (බැර)	14,661	2,034	9,946	(12,628)	14,012
	2019.01.01. දිනට	168,780	(62,064)	-	(12,628)	94,088
	වසරේ ලාභය හෝ පාඩුවට අයකිරීම (බැර)	11,738	(875)	-	(97,901)	(87,038)
	2019.01.01. දිනට	**180,519**	**(62,939)**	**-**	**(110,530)**	**7,050**
	විලම්බිත බදු වගකීම				(180,519)	(168,780)
	විලම්බිත බදු වත්කම්				62,939	62,064
	උපයෝජනය නොකළ ව්‍යාපාර පාඩු C/F				110,530	12,628
	ශුද්ධ විලම්බිත බදු වගකීම				**(7,050)**	**(94,088)**

		සටහන	සමූහය		මණ්ඩලය	
			2019 රු. '000	2018 රු. '000	2019 රු. '000	2018 රු. '000
31	**ප්‍රතිපාදන**					
	ණයකර ප්‍රතිපාදන		-	7,970	-	7,970
	විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන		4,300	2,820	4,300	2,820
	දුරකථන සඳහා ප්‍රතිපාදන		-	1,854	-	1,854
	විදුලි බලය සඳහා ප්‍රතිපාදන		-	61	-	61
	ජලය සඳහා ප්‍රතිපාදන		-	19	-	19
	සේවකයන්ගේ හදිසි අනතුරු වන්දි යෝජනා ක්‍රමය සඳහා ප්‍රතිපාදන		2,000	2,000	2,000	2,000
	ප්‍රසාද දීමනා ප්‍රතිපාදන		287	48	287	48
	නිවාඩු ගෙවීම් සඳහා ප්‍රතිපාදන		15,416	13,946	15,416	13,946
	තැපැල් ගාස්තු සඳහා ප්‍රතිපාදන		1,366	430	1,366	430
	උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව සඳහා ප්‍රතිපාදන		76,344	101,640	76,344	101,640
	5 වසර ශිෂ්‍යත්ව සඳහා ප්‍රතිපාදන		4,890	1,995	4,890	1,995
			104,603	**132,784**	**104,603**	**132,784**



04

අතිරේක තොරතුරු

විගණකාධිපතිවරයාගේ වාර්තාව - 2019

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } LEW/B/ETF/FA/2019 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 12th August 2020

සභාපති,

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සහ එහි පරිපාලිතයෙහි 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සහ එහි පරිපාලිතයෙහි 2019 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මණ්ඩලයේ හා සමූහයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) 2019 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් සේවාදායක ආයතනවලින් 1981 සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළදී සාමාජිකයන් 7,946 කගෙන් අයකරගෙන තිබූ එකතුව රු. 862,340,944 ක් වූ දායක මුදල් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 16 වන වගන්තිය ප්‍රකාරව ඒ ඒ සාමාජිකයන්ගේ පෞද්ගලික ගිණුම්වලට බැර නොකර වෙනත් තාවකාලික ගිණුම්වල රඳවා තබාගෙන පැවතුණි. මේ හේතුවෙන් සාමාජිකයන්ට තම දායක මුදල් ආපසු ලබාගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 හි 30 වන වගන්තිය අනුව මණ්ඩලයේ ලාභාංශ ආදායම හඳුනාගැනීමේදී මණ්ඩලයට ලැබීමට ඇති අයිතිය තහවුරු වූ විට ආදායම ලෙස හඳුනා ගත යුතුය. එසේ වුවද මණ්ඩලයේ පරිපාලිත සමාගම වන ලංකා සෝල්ට් ලිමිටඩ් සමාගම විසින් 2017 වර්ෂයට අදාළව 2019 වර්ෂයේදී ප්‍රකාශ කර තිබුණු ලාභාංශ වලින් මණ්ඩලයට හිමි රු. 67,500,000 ක් වූ ලාභාංශ ආදායම මුල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ හේතුවෙන් සමූහයේ මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු ලාභාංශ ලෙස රු. 59,307,807 ක (රඳවා ගැනීමේ බදු අඩුකල පසු) වගකීමක් පෙන්වීමෙන් සමූහයේ මූල්‍ය ප්‍රකාශනවල ආදායම්, වත්කම් හා වගකීම් නිවැරදිව නිරූපනය නොවන බව නිරීක්ෂණය විය.

(ඇ) 2019 වර්ෂයට අදාළ අයකර නොගත් රඳවා ගැනීමේ බදු (Unclaimed WHT) ලෙස රු. 61,300,876 ක හඳුනානොගත් බැර ශේෂයක් ශේෂ පත්‍රයේ වෙනත් වගකීම් යටතේ දක්වා තිබුණ ද එම ශේෂය සම්බන්ධයෙන් තහවුරු කිරීමේ ලේඛන විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 හි 42 වන වගන්තිය ප්‍රකාරව ඉකුත් වර්ෂවල වැරදි නිවැරදි කිරීමේ දී මූල්‍ය ප්‍රකාශනවල සංසන්දනාත්මක අගයන් නිවැරදි කරමින් සිදුකළ යුතු වුවද ඊට පටහැනිව රු.262,450,000 ක් වූ පෙර වර්ෂවල ගැලපිම් සමාලෝචිත වර්ෂයේ ආරම්භක රඳවාගත් ලාභයට ගලපා තිබුණි.

(ඉ) 2018 වර්ෂයට අදාළව වැඩියෙන් ආදායමට ගෙන තිබූ ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම් මත පොලී රු. 164,000,000 ක් සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කිරීමේ දී එම ආදායමට අදාළව වැඩියෙන් පෙන්වන පෙර වර්ෂයේ ආදායම් බදු වියදම රු. 22,960,000 ක් ගැලපුම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 හි 49 වන වගන්තිය ප්‍රකාරව, ඉකුත් කාලපරිච්ඡේදවල වැරදි නිවැරදි කිරීමේ දී වරදේ ස්වාභාවය, නිවැරදිකරණ ප්‍රමාණය, නිවැරදි කිරීම් බලපානු

ලබන අයිතමයන් පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කළ යුතු වුවද, ක්‍රමක්ෂය කළ පිරිවැය මත තබා ගන්නා මූල්‍ය වත්කම් (Financial Assets at Amortized cost) යටතේ දක්වා තිබූ **රු.**12,044,755,000 ක් වූ වත්කම් කාණ්ඩ 4 ක් සම්බන්ධයෙන් සිදුකර තිබූ පෙර වර්ෂ ගැලපීම් පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කර නොතිබුණි.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 12 හි 88 වන ඡේදය අනුව බදු අධිකාරීන් සමඟ නිරාකරණය කර නොගත් ආරවුල් මත පැන නගින අසම්භාව්‍ය වත්කම් හා අසම්භාව්‍ය බැරකම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කළ යුතුය. 2018/2019 තක්සේරු වර්ෂය සඳහා පිළියෙල කර තිබූ බදු වාර්තාව (Tax return) අනුව මණ්ඩලයට ලැබිය යුතු ආදායම් බදු ශේෂය (Tax Refund), සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ලැබිය යුතු ආදායම් බදු ශේෂයට වඩා රු.2,815,315,156 කින් වැඩි බව නිරීක්ෂණය විය. එහෙත් එම වෙනසට හේතු වී තිබූ කරුණු සම්බන්ධයෙන් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව සමඟ නොඑකඟතාවයන් පැවති අතර එම වෙනස්කම් සහ නොඑකඟතාවයන් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කර නොතිබුණි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මහහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම්.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (අ) නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	විස්තරය
(අ) 1954 අංක 19 දරන සාජ්පු හා කාර්යාල සේවක පනත	අතිකාල සඳහා ගෙවීම් කිරීමේදි අතිකාල පැයකට සාමාන්‍ය පැයක වැටුප මෙන් එක හමාරක් ගෙවිය යුතු වුවද මණ්ඩලය විසින් අතිකාල පැයකට පැය එක හමාරක් සහ සෙනසුරාදා/ඉරිදා දිනවල අතිකාල පැය 8 ක් සම්පූර්ණ වීමත් සමග දිනක වැටුපක් ද එකතු කර අතිකාල ගෙවීම් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ අතිකාල පිරිවැය රු. 25,505,000 ක් වී තිබුණි. තවද පනත ප්‍රකාරව මණ්ඩලයේ නිලධාරීන් සතියකට දින පහමාරක් සේවය කළ යුතු වන අතර වාර්ෂික නිවාඩු දින 21 කට පමණක් ඉඩ දී ඇති නමුත් ඊට පටහැනිව මණ්ඩලයේ නිලධාරීන්ට වාර්ෂික නිවාඩු 42 ක් ලබාගැනීමට හා සතියකට දින 5 ක් පමණක් සේවය කිරීමට ඉඩ දී තිබුණි.
(ආ) 2003 ජුනි 02 දිනැති අංක : පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 ඡේදය හා 9.4 ඡේදය	කැබිනට් මණ්ඩලයේ අනුමැතියකින් තොරව එක් ආයතනයක නිලධාරියෙකු අමාත්‍යාංශයකට හෝ වෙනත් ආයතනයකට නිදහස් කළ නොහැකි අතර එසේ නිදහස් කරනු ලබන කාලසීමාවට කිසිදු වේතනයක් නොගෙවිය යුතුය. එසේ වුවද 1990 සිට 2019 දක්වා වූ කාලපරිච්ඡේදය

තුල ඊට පටහැනි ලෙස මණ්ඩලයේ නිලධාරීන් 14 දෙනෙකු පළාත් පාලන ආයතන ඇතුළු රජයේ ආයතනවලට වරින්වර නිදහස් කර තිබුණි. 2006 වර්ෂයේ සිට 2015 දක්වා කාලපරිච්ඡේදය තුළ එසේ නිදහස් කර සිටි නිලධාරීන් 13 දෙනෙකුගේ වැටුප් ඇතුළු දීමනා ගෙවීම් පිළිබඳව සිදුකරන ලද නියැදි පරීක්ෂාවේදී එම කාලපරිච්ඡේදය තුළ වැටුප් ලෙස රු.22,678,727 ක් ද අතිකාල හා නිවාඩු දින වැටුප් ලෙස රු.1,032,416 ක් ද වැඩබැලීමේ දීමනා ලෙස 148,799 ක් ද වශයෙන් එකතුව රු. 23,859,942 ක් මණ්ඩලයට අනාවර්තික වියදමක් වන ලෙස ගෙවා තිබූ බව නිරීක්ෂණය විය. එසේම එම නිදහස් කර සිටි කාලපරිච්ඡේදය තුළ නිලධාරීන්ට ප්‍රසාද දීමනා ද ගෙවා තිබූ අතර එසේ ගෙවන ලද ප්‍රසාද දීමනා පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි. තවද ඉහත කිසිදු ගෙවීමක් අදාළ ආයතනයන්ගෙන් ආපසු අයකර ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

(ඇ) 2015 ජූලි 10 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක: 2/2015 හි 04 (බී) ඡේදය හා 05 ඡේදය සහ 2015 මාර්තු 31 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක : 2/2015 හි 07 ඡේදය

ලියාපදිංචි කල දින සිට වසර 10 ක් ඉක්මවා නොමැති වාහන රාජ්‍ය මුදල් දෙපාර්මේන්තුවේ සහ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ අනුමැතිය මත අපහරණය කල හැකි වුවද මණ්ඩලය විසින් මිලදීගෙන අවු. 6 ක් සහ 7 ක් වූ වාහන 2 ක් එවැනි අනුමැතියකින් තොරව අපහරණය කර තිබුණි. තවද, එබඳු වාහන අපහරණය කිරීම සඳහා සමීක්ෂණ මණ්ඩලය පත් කල යුතු වන්නේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා හෝ ගණන් දීමේ නිලධාරියා විසින් වුවද ඉහත කී වාහන 2 අපහරණය කිරීම සඳහා සමීක්ෂණ මණ්ඩලය පත් කිරීමේදී ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ 2014 නොවැම්බර් 10 දිනැති අංක PE/IN/ETF/Gen දරන ලිපිය

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සමග ඒකාබද්ධව ක්‍රියාත්මක කරන මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට නිවාස ණය ලබා දීමේ යෝජනා ක්‍රමය යටතේ සියයට 4.2 ක පොලී අනුපාතය යටතේ එම ණය ලබාදීමට මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ එකඟතාවය පල කර තිබුණ

ද මණ්ඩලය විසින් සියයට 4 ක පොලී අනුපාතයක් යටතේ සේවකයන්ට නිවාස ණය ලබාදී තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) 2019 වර්ෂය සඳහා නිල ඇඳුම් සාරිය ලෙස ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කරමින් මිලදි ගත් සිල්ක් වර්ගයේ සාරි 4 බැගින් නිලධාරිනියන් වෙත බෙදා දීමෙන් පසුව විවිධ හේතු සඳහන් කරමින් ඒවා ඇදීම ප්‍රතික්ෂේප කර තිබුණි. එම නිසා එක් නිලධාරිනියකගෙන් සාරි 2 බැගින් ආපසු ලබාගෙන මිලදීගත් ආයතනයටම ලබා දී ඒ වෙනුවට කොටින් වර්ගයේ සාරි 2 බැගින් පෙර මිලටම හුවමාරු කරගෙන තිබුණි. එහිදි හුවමාරු කරගත් කොටින් වර්ගයේ සාරිය තත්ත්ව පරීක්ෂණයට ලක් කර නොතිබූ අතර තාක්ෂණික පිරිවිතර සමග ගැලපීමෙන් තොරව ලබාගෙන තිබුණි. 2019 වර්ෂය වෙනුවෙන් දෙවනුව ලබාගත් සාරි 2019 ජූලි 01 දින නිකුත් කර තිබූ අතර 2019 අගෝස්තු 01 දින සිට එකී නිල ඇඳුමෙන් සැරසී සේවයට වාර්තා කල යුතු බව දන්වා තිබුණි. ඒ අනුව 2019 වර්ෂය සඳහා කාන්තා නිල ඇඳුම් වෙනුවෙන් රු. 5,093,000 ක් වැය කර තිබුණද නිලධාරිනියන් නිල ඇඳුම් වර්ෂය පුරාම භාවිතා කර නොතිබූ බැවින් එම වියදම මගින් අපේක්ෂිත අරමුණ ඉටු වී නොතිබූ බව නිරීක්ෂණය විය.

3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) 1995 වර්ෂයේ සිට අඛණ්ඩව වැඩිවෙමින් පැවතෙන හිමිකම් නොපාන ලද මරණ ප්‍රතිලාභ රු. 14,452,258 ක් සහ 2001 වර්ෂයේ සිට පැවත එන රඳවාගත් ප්‍රතිලාභ රු. 14,864,679 ක් වශයෙන් එකතුව රු. 29,316,937 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් අදාළ සාමාජිකයන් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මණ්ඩලයේ ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 4 වන පරිච්ඡේදය මගින් මණ්ඩලයේ ආයෝජන කළඹ හැසිරවීමේදී ආදායම උපරිම වන ලෙසත් අවදානම අවමවන ලෙසත් ආයෝජනයන් සිදු කළයුතු සංයුතිය පිළිබඳව විස්තර දක්වා තිබේ. ඒ අනුව, රජයේ සුරැකුම්පත්වල සියයට 87 ක්, වෙනත් ස්ථාවර ආදායම් සුරැකුම්පත්වල (උපරිමය) සියයට 5 ක්, කෙටි කාලීන ප්‍රතිමිලදී ගැනුම්වල සියයට 2 ක් සහ කොටස් ආයෝජනවල (උපරිමය) සියයට 6 ක් වශයෙන් සීමාවන් නිර්ණය කර තිබූ අතර ස්ථාවර තැන්පතුවල කරනු ලබන ආයෝජන, ආයෝජන ප්‍රතිපත්තියේ සියයට 5 කොටසින් පරිබාහිරව සැලකීමට පසුව තීරණය කර තිබුණි. එසේ වුවද 2017 හා 2018 වර්ෂයන්හි සමස්ත ආයෝජන කළඹෙන් පිළිවෙලින් සියයට 79 ක් හා සියයට 75 ක් වශයෙන් පැවති රජයේ සුරැකුම්පත්වල ආයෝජනය 2019 වර්ෂයේදී සියයට 78 ක් වී තිබුණු අතර එය ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව තිබිය යුතු සීමාව වූ සියයට 87 ට වඩා සියයට 9 ක අඩු වීමක් බව නිරීක්ෂණය විය.

(ඇ) මණ්ඩලය රජයේ සුරැකුම්පත්වල අරමුදල් ආයෝජනය කරන ප්‍රධාන පෙලේ ආයතනයක් වුවද සුරැකුම්පත් වෙන්දේසිවලදී සෘජුවම මිල ගණන් ඉදිරිපත් කිරීමේ පහසුකම (Direct Bidding Facility) ශ්‍රී ලංකා මහ බැංකුව වෙතින් මණ්ඩලය වෙත ලබාගැනීමට 2019 දෙසැම්බර් 31 දින වනවිටත් නොහැකි වී තිබුණි.

(ඈ) රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සමග ඒකාබද්ධව ක්‍රියාත්මක කරන කාර්ය මණ්ඩලයට නිවාස ණය ලබාදීමේ යෝජනා ක්‍රමයේ ගිවිසුම අනුව (බැංකුව විසින් මණ්ඩලයට යොමු කර තිබූ 2006 මාර්තු 16 දිනැති ලිපියේ සංශෝධනයන් අනුව) සේවකයින්ගෙන් ආපසු අයකර ගන්නා ණය වාරිකවල ප්‍රාග්ධන මුදල මාස 03 කට වරක් මණ්ඩලය වෙත ප්‍රේෂණය කලයුතු වේ. එසේ වුවද ඊට පටහැනිව බැංකුව විසින් මාසික ණය වාරිකවල ප්‍රාග්ධන මුදල වර්ෂය අවසානයේ දී ගිණුමේ ශේෂයට එකතු කර පෙන්වන බව විගණනයේදී නිරීක්ෂණය විය. ඒ හේතුවෙන් ණය වාරිකවල ප්‍රාග්ධන මුදල සඳහා අදාළ වර්ෂයේ දී මණ්ඩලයට කිසිදු පොලියක් හිමි නොවන බව ද එම මුදල් වෙනත් ආයෝජන මාර්ගයක යොදාගත නොහැකි වන බව ද නිරීක්ෂණය විය. ඒ අනුව 2013 වර්ෂයේ සිට 2019 දක්වා වූ වර්ෂ 7 තුළ මණ්ඩලයට ප්‍රමාණවත් ආදායමක් හිමි නොවූ ණය වාරිකවල ප්‍රාග්ධන මුදල් ප්‍රමාණයන් පිළිවෙලින් රු.14,424,546, රු.16,810,432, රු.20,053,440, රු.22,256,164, රු.24,333,502, රු.25,101,662 හා රු.26,637,913 ක් වී තිබුණි. තවද උක්ත නිවාස ණය යෝජනා ක්‍රමය රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සමග 1990 වර්ෂයේදී පමණ ඇතිකරගත් ගිවිසුමක් මත ක්‍රියාත්මක කරන අතර වර්තමානයට ගැලපෙන ලෙස ගිවිසුම යාවත්කාලීන කර ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම මූලික තැන්පතු ගිණුමේ ශේෂය මත ගිවිසුම ප්‍රකාරව බැංකුව විසින් පොලී ගෙවනු ලබන්නේ ද, පොලී ප්‍රතිශතයේ සිදුකරන සංශෝධනයන් පිළිබඳව

මණ්ඩලය දැනුවත් කරනු ලබන්නේද සහ සෑම මාසයකම ප්‍රමාණවත් හා සාධාරණ පොලී ආදායමක් ලැබෙන්නේ ද යන කරුණු පිළිබඳව අවධානය යොමු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

2019 විගණකාධිපති
වාර්තාව සම්බන්ධයෙන්

මණ්ඩලීය නිරීක්ෂණ

1.2 මතය සඳහා පදනම

(අ) මණ්ඩලය විසින් ගිණුම්කරණ කාලච්ඡේදයට අදාල දායක මුදල් සත්‍ය ලැබීම් හා සත්‍ය ගෙවීම් මත පදනම්ව වගකීම් නිසි පරිදි හදුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර ඇත. එබැවින් ගිණුම් ප්‍රකාශනවල ඇති සාමාජික මුදල් වගකීමේ වටිනාකම නිවැරදිව සටහන් කර ඇත. නමුත් පහත සඳහන් හේතු නිසා විගණන විමසුමෙහි සඳහන් වටිනාකම් සේවායෝජක ගිණුම්වලින් පුද්ගලික සාමාජික ගිණුම්වලට මාරු කිරීමට නොහැකි වී ඇත.

- සේවායෝජකයින් සාමාජික මුදල් ගෙවා ඇතත්, එම මුදල් බැර කිරීමට අවශ්‍ය සේවක විස්තර ලබා නොදීම.
- සේවක විස්තර ඇතුලත් කොට එවනු ලබන අර්ධ වාර්ෂික වාර්තාවේ එකතුව හා අදාල අර්ධ වර්ෂය වෙනුවෙන් ගෙවන ලද දායක මුදල්වල එකතුව සමාන නොවීම.
- ආයතන කිහිපයක් සඳහා එක් චෙක්පතක් මගින් සාමාජික මුදල් ගෙවා ඇති අවස්ථාවලදී, එම මුදල් වෙන් වෙන් වශයෙන් ආයතන සඳහා විභජනය කළ යුතු ආකාරය පැහැදිලි කර ගැනීමට අපහසුවීම. (අදාල සේවායෝජක ආයතන දැනට අක්‍රීය තත්වයේ පැවතීම.)
- ආයතන විසින් ලබාදෙනු ලබන අර්ධ වාර්ෂික වාර්තාවල ඇතුලත් දත්ත අපැහැදිලිවීම. (අදාල සේවායෝජක ආයතන දැනට අක්‍රීය තත්වයේ පැවතීම.)
- ආයතනවල කළමණාකාරීත්වය වෙනස්වීම නිසා ඊට පෙර කාලවලට අදාල තොරතුරු ලබාගැනීමට නොහැකි වීම සහ එම කාලවල පැන නැගී ඇති ගැටළුවලට විසදුම් ලබාදීම සඳහා නව කළමණාකාරීත්වය සහයෝගය ලබා නොදීම.
- විශේෂයෙන් වතු ආශ්‍රිත ආයතනවල සාමාජිකයින්ට ජාතික හැඳුනුම්පත් නොමැතිවීම නිසා සහ නම්වල කොටස් පමණක් සේවායොජකයින් ලබාදීම හේතුවෙන් හදුනා ගැනීමේ ගැටළු පැවතීම.

ඒ අනුව ගිණුම් ප්‍රකාශනවල හරය වන වත්කම් හා වගකීම් අවසාන ගිණුම්වල නිවැරදිව සඳහන් වීම සම්බන්ධයෙන් උක්ත කරුණ නිසා කිසිදු බලපෑමක් සිදුවී නොමැත.

V 999 ගිණුම්

මෙම ගිණුම් යටතේ පවත්වාගෙන යනු ලබන්නේ වර්ෂ 2006 ට පෙර අප අරමුදලට බැර කරන ලද සේවායෝජකයින් පැහැදිලිව හදුනා නොගත් මුදල් වන අතර, වරින් වර සේවායෝජකයින් විසින් ඉදිරිපත් කරනු ලබන ලේඛණ මත එම ලේඛණවල නිරවද්‍යතාවය පරීක්ෂා කර බලා, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (රැස්කිරීම් හා සේවායෝජක සම්බන්ධතා) අනුමැතිය මත, නිවැරදි සේවායෝජක අංක යටතේ එම මුදල් ගිණුම්ගත කිරීම සඳහා වන ක්‍රමවේදයක් ක්‍රියාත්මක වේ.

(ආ) ගිණුම්කරන ප්‍රමිත අංක 15 (SLFRS 15) අනුව දක්වා ඇති ආදායමක් හඳුනා ගැනිමේ ආකෘතිය අනුව මෙම ලාභාංශ හඳුනා ගැනිම සඳහා ප්‍රමාණවත් විස්තර, එනම් ලාභාංශ බලපත්‍රය (Dividend Warrant) හෝ ලාභාංශ නිවේදනය (Dividend Announcement) ලැබී නොතිබුනු හෙයින් මෙය මණ්ඩලයේ ලාභාංශ ආදායමක් ලෙස හඳුනා නොගත් අතර, එකාබද්ධ ගිණුම් හෙළිදරව් කිරිමේදි විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේදි හෙළිදරව් කිරිමට කටයුතු කර ඇත.

(ඇ) පෙර වර්ෂයන්හි ස්ථාවර තැන්පත් හා ණයකර පොළිය මත උපචිත පදනම මත ආදායම හඳුනාගෙන බදු ගැලපීම සිදු කරන ලදි. නමුත් රඳවා ගැනිමේ බදු සහතික දේශීය අදායම් දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන්නේ මුදල් පදනමින් බැවින් මෙම වර්ෂයේ රඳවා ගැනිමේ බදු සහතික මුදල් පදනමින් ගිණුම් ගත කරන ලදි. එහිදි ඉහත සඳහන් රු61,300,876 ක ශේෂය හටගත් අතර ආදායම් බදු දෙපාර්තමේන්තුව සමඟ මෙම කරුණ සාකච්ඡා මට්ටමේ පවතින බැවින් එකඟතාවයකට පත්වූ පසු අදාල ගැලපීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඈ) එම සියළුම ගැලපීම් මෙම වර්ෂයේ හඳුනාගත් අතර, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනයේ ඉදිරියට ගෙනයනු ලැබූ ලාභයෙන් අඩුකර පෙන්වීමට කටයුතු කර ඇත.

(ඉ) 2018 වර්ෂයේ ප්‍රතිමිලදී ගැණුම් වලට අදාල බදු වියදම වන රු22,960,000 ක් වන මුදල් 2019/2020 තක්සේරු වර්ෂයේ අවසාන බදු වාරිකය ගෙවීමේදි ගලපනු ලැබේ.

(ඊ) ඉදිරියේදි හෙලිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ.

(උ) මණ්ඩලයේ ආදායම් බදු සඳහා ගිණුම්කරණ කටයුතු සිදුකර ඇත්තේ 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත වන අතර, ඒ අනුව අවසාන ගිණුම් වල සඳහන් ලැබිය යුතු බදු ශේෂය රු278,993,977 පවත්නා බදු නීතිය මතුපිටින් අර්ථ දැක්වීමේදි වැරදි නොවන ගණනය කිරීමකි.

එසේ වුවද, විකම ප්‍රභවයක් සඳහා බදු 2ක් අයකර ගත නොහැකි බවට ඇති මූලික සාධාරණ බදු මූලධර්ම ප්‍රකාරව 2018/04/1 දිනට පෙර භාණ්ඩාගාර බැඳුම්කරයන්හි සිදුකල ආයෝජන වෙනුවෙන් ගෙවා ඇති නාමික බදු බැර මණ්ඩලයට ලැබිය යුතු බදු බැරක් ලෙස ගලපා, ලැබිය යුතු බදු ශේෂයක් ලෙස ඉල්ලුම් කර ඇත.

එමෙන්ම මණ්ඩලයේ සාමාජිකයන් හට වාර්ෂිකව බෙදාහරින 3% ක් වූ පොළි මුදල් මණ්ඩලයේ වියදමක් ලෙස අඩුකිරීමට අවස්ථාවක් ඇතිබව පෙනී යන හෙයින් ලැබිය යුතු බදු ශේෂයක් ලෙස බදු වාර්තාවේ ඉල්ලුම් කර ඇත.

ඒ අනුව මෙකී ගැලපීම් 2 න් බලාපොරොත්තු වනුයේ පවත්නා බදු මූලධර්ම වලට අනුගත වෙමින් බදු වගකීම කලමනාකරණය කිරීම හා එමඟින් මණ්ඩලයේ ලාභය උපරිම කර ගැනීමයි.

ඊට අමතරව ගිණුම් කටයුතු වෙනුවෙන් ස්ථාවර තැන්පත් හා ණයකර පොළි අදායම සඳහා මූලික ගිණුම්කරන සංකල්පයන්ට අනුව උපචිත පදනම මත ආදයම හඳුනාගෙන බදු ගැලපීම සිදු කරන ලදි. එසේ වුවද, එම පොළි ආදායම වෙනුවෙන් රඳවා ගැනිමේ බදු සහතික දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත බාරදෙනු ලබන්නේ මුදල් පදනම මත බැවින් අදායම් බදු පනතේ විධිවිධාන අනුව ගණනය කිරීමේ හා නිවැරදිව හඳුනා ගැනිමේ පහසුව සඳහා එකී පොළි ආදායම මත රඳවා ගැනිමේ බදු බැර බදු වාර්තාවේ මුදල් පදනමින් ගලපන ලදි.

ඉහත ගැලපීම්, බදු වාර්තාවේ සඳහන් ශේෂයෙන් ගිණුම්වල ශේෂය වෙනස් විමට ප්‍රධාන වශයෙන් බලපාන ලද අතර මතු දිනකදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මේ සම්බන්ධයෙන් ගන්නා තීරණය අනුව අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට බලාපොරොත්තු වේ.

2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

(අ) මණ්ඩලයේ සේවකයින්ට අතිකාල සඳහා ගෙවීම් සිදුකරනු ලබන්නේ සාප්පු හා කාර්යාල සේවක පනතෙහි විධිවිධාන වලට අනුව සහ කර්මාන්තයේ පවතින පරිචය අනුව බව මෙයින් දන්වා සිටිමි.

තවද සේවකයින්ට වාර්ෂික නිවාඩු 42 ක ප්‍රමාණය කලකසිට ලබාදීඇති අතර එයද කර්මාන්තයේ පවතින පරිචය අනුව සිදුකර තිබේ. සාප්පු හා කාර්යාල සේවක පනත අනුව වර්ෂයකට තිබෙන නිවාඩු 21 දක්වා මණ්ඩලිය සේවකයන්ගේ නිවාඩු 42 අඩුකිරීම සම්බන්ධයෙන් ලංකා හාම්පුතුන්ගේ සංගමයේ නිර්දේශය 2014.04.01 දාතමින් අපවෙත ලබාදෙමින් එසේ භුක්ති විඳි වරප්‍රසාදයක් අඩුකිරිමට යාමෙන් සේවකයන් තුළ කාර්මික ආරවුල් තත්වයක් පැන නැගිය හැකිබව දක්වා තිබේ. ඔවුන්ගේ නිර්දේශයේ පිටපතක් මීටඅමුණා ඇත.

(ආ) අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ මෙසේ කාර්ය මණ්ඩලය නිදහස්කර ඇති අතර 2020 සිට ඉදිරියට කරන සේවයෙන් නිදහස් කිරීම් රජයේ අනුමත ක්‍රමවේදයන් අනුගමනය කරමින් සිදුකිරීමට බලාපොරොත්තු වනබව දන්වමි.

(ඇ) මණ්ඩලයේ සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී වශයෙන් ඔහුට පවරා ඇති බලතල අනුව අපහරණ කිරීමේ සමීක්ෂණ මණ්ඩලය පත්කර ඇත.

(ඈ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 08/2005 ට අනුකූල වන අයුරින් මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ පරිපාලන හා මානව සම්පත් කොට්ඨාශ චක්‍රලේඛ අංක 2005/21 මගින් වාර්ෂික පොළී අනුපාතය 04% දක්වා සංශෝධනය කර ඇත. කාර්ය මණ්ඩලය සඳහා නිකුත් කරනු ලබන සෙසු ණය මුදල් සඳහා අයකරන පොළී අනුපාතය 4.2% ක් වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාල නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) 2019 වසරේ සාරි මිලදී ගැනීමේදී ලැබී තිබූ සාම්පල් කිහිපයක් තත්ව පරීක්ෂණය සඳහා ශ්‍රී ලංකා පේෂ කර්මාන්ත හා ඇඟලුම් ආයතනය වෙත යොමු කරන ලදී . එසේ යොමු කරන ලද සාරිවල ප්‍රතිපල විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව එයින් වඩාත් උසස් බවින් යුතු සාරිය නිලඇඳුම ලෙස තෝරා ගන්නා ලද අතර, පසුව මිලදී ගැනීම සිදුකර ඇත.

නමුත් මෙම සාරිය භාවිතා කිරීමේදී වඩාත් දුහුල් බවින් යුත් නිසා, ඇඳීමට අපහසු බව කාන්තා කාර්ය මණ්ඩලය විසින් කළමණාකාරිත්වයට දැනුම් දුන් අතර, එයට යම් සාධාරණයක් ඉටුකර දෙන ලෙස ඉල්ලා ඇත. මෙම කරුණු මානුෂීය ලෙස සලකා බලා සැපයුම්කරු සමග සාකච්ඡා කොට වෙනත් වර්ගයේ සාරි දෙකක් ලබාදීමට කටයුතු කර ඇත. මෙය සාරි 2 ක හුවමාරුවක් පමණක් වූ අතර, අමතර වියදමක් මණ්ඩලය විසින් දරා නොමැත.

3

(අ) හිමිකම් නොපාන මරණ ප්‍රතිලාභ ගිණුමේ 2019.01.01 දිනට පැවැති ශේෂය රු.12,475,760.37 කි. (ප්‍රතිලාභ අයදුම්කරුවන් - 987) සාමාජිකයින්ගේ මරණයෙන් පසු එකී සාමාජිකයාගේ ප්‍රතිලාභ සඳහා එක් අයෙකුට වඩා හිමිකම්ලාභීන් සිටින බවට තීරණය වන අවස්ථා පවතී. එකී හිමිකම්ලාභීන් සියළුදෙනාම එකවර ඉදිරිපත් නොවීම සහ ඇතැම් අය ප්‍රමාණවත් තොරතුරු (සහතික පත් ඉදිරිපත් නොකිරීම.) ඉදිරිපත් කිරීමට ඇති අපහසුතාවයන් නිසා ඔවුන්ගේ කොටස්, මණ්ඩල ගිණුමේ රඳවාගෙන ලේඛන ඉදිරිපත් කර ඇති අයගේ හිමිකම් කොටස් පමණක් ගෙවීම් කිරීමට කටයුතු කිරීම වර්තමානයේ අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග වේ. ඒ අනුව 2019.01.01 සිට 2019.12.31 කාලය තුළ මරණ ප්‍රතිලාභ හිමිකරුවන් 52 කුගේ රු.2,332,583.88 ක් රඳවාගෙන ඇති අතර, එම කාලය තුල හිමිකරුවන් 16 දෙනෙකුට රු.356,085.70 ක් ගෙවා ඇත. ඒ අනුව 2019.12.31 දිනට උරුමකරුවන්ට ගෙවීමට ඇති වගකීමේ වටිනාකම රු.14,452,258.55 ක් වේ. (ප්‍රතිලාභීන් 1023)

(ආ) මණ්ඩලය විසින් විධිමත් ආයෝජන ප්‍රතිපත්තියක් පිළියෙල කරඇත්තේ 2012 දී වන අතර එය අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කර ඇත. පසුකාලීනව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයන් අනුව රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතුවල කරනු ලබන ආයෝජනල ආයෝජන ප්‍රතිපත්තියේ 5 කොටසෙන් පරිබාහිරව සැලකීමට තීරණය කරන ලදී. එයට හේතු වූයේ රාජ්‍ය බැංකුවල තැන්පතුවල අවධානම නොසැලකිය යුතු මට්ටමක ඇතිබව සලකාය. තවද 2017 වසරේ සිට ලංකාවේ විශාලතම රාජ්‍ය බැංකු තුනෙහි ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලබන සීමාවන් තුලය. ඒ අනුව 87 අවම ප්‍රතිශතය රාජ්‍ය සුරැකුම්පත් හා රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතුවල එකතුව ලෙස සලකයි.

තවද 2012 වසරේ ආයෝජන ප්‍රතිපත්තිය හදුන්වා දුන් කාලය වනවිට අප මණ්ඩලයට (Private Placement) යනුවෙන් හදුන්වනු ලබන ප්‍රාථමික වෙළඳ පොලෙන් රාජ්‍ය සුරැකුම්පත් මිළදී ගැනිමේ ක්‍රමය හදුන්වාදී තිබුණි. එම ක්‍රමය (Private Placement) යටතේ 100% වුවද අවශ්‍යනම් රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනය කල හැකිව තිබුණි. එයට හේතුව නම් අප සතුව ඇති ඕනෑම මුදල් ප්‍රමාණයකට ඕනෑම දිනයකදී මහබැංකුව විසින් එදිනට පවතින පොලී අනුපාතයන්ට (Weighted Average Yield) අප ආයතනයට රාජ්‍ය සුරැකුම් පත් විකිණීමයි. ඒ අනුව 87%ක් ඉහළ ප්‍රතිශතයක රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනය කිරීමටත්, වැඩිපොලියක් ලබාගැනීමට ඇති අවස්ථා ප්‍රයෝජනයට ගැනීම සඳහා 5%ක් වෙනත් ස්ථාවර පොලී අනුපාතයන් සහිත ආයෝජනයන් හි යෙදවීමටත් තීරණයකර ඇත. එහෙත් 2015 මාර්තු මාසයෙන් පසුව මෙම Private Placement ක්‍රමය අහෝසි කල අතර අනිවාර්යයෙන්ම ලංසු ඉදිරිපත් කර රාජ්‍ය සුරැකුම්පත් වෙන්දේසියට සහභාගිවී රාජ්‍ය සුරැකුම් පත් මිලදී ගැනීමේ ක්‍රමය හදුන්වා දෙන ලදී.

(ඇ) Direct Bidding Facility ලබා ගැනීමට අවශ්‍ය යටිතල පහසුකම් සඳහා විශාල අමතර පිරිවැයක් දැරීමට සිදුවේ. දැනට පවතින ක්‍රමය අනුව ඒ සඳහා කිසිම අමතර පිරිවැයක් දැරීමට අවශ්‍ය නොවේ. කෙසේ නමුත් ඉසරුපව් Bidding Facility ලබා ගැනීමට අවශ්‍ය පරිසරය සකසා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. ආයෝජන අංශය පුළුල් කිරීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය බදවා ගැනීමට අධීක්ෂක මණ්ඩලය අනුමැතිය ලැබී ඇති අතර, වැඩිදුර අනුමැතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යොමුකර ඇත. නමුත් මේ දක්වා අවශ්‍යතාවයට ගැළපෙන පරිදි අනුමැතිය ලබාදී නොමැත. අවශ්‍ය සේවකයින් බදවා ගැනීමෙන් පසු සහ 2019.11.08 දින ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව දන්වා ඇතිපරිදි සපුරාලීමට ඇති අති විශාල යටිතල පහසුකම්, වෙනත් තාක්ෂණික අවශ්‍යතාවයන්, නීතිමය අවශ්‍යතාවයන්, සේවක පුහුණුකිරීම් වලින් පසු හා අධ්‍යක්ෂක මණ්ඩලයේද අනුමැතිය ඇතිව මෙම පහසුකම ලබා ගැනීමට කටයුතු කරනු ඇත. මේ අනුව දැනටමත් පරිගණක අංශයෙන් සහ නීති අංශයෙන් අවශ්‍ය උපදෙස් ඉල්ලා ඇත.

(ඈ) රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව විසින් 2006.03.16 දින යොමුකර ඇති ලිපියෙහි සංශෝධනයන් අනුවමින් ඉදිරියට මාස 03 කට වරක් ප්‍රාග්ධන මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කරනු ලබන අතර, මේ පිළිබඳ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව දැනුවත් කිරීමට කටයුතු සිදුකර ඇත.

ශ්‍රියාන් ද සිල්වා විජයරත්න
සභාපති/ ප්‍රධාන විධායක නිලධාරි
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය